# සිව්වැනි කොටස

# සිව්වැනි කොටස

## 2022 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත්[අ]

පිටුව


| | | |
|---|---|---|
| 1. | 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත | 1 |
| 2. | 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත | 1 |
| 3. | 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත | 26 |
| 4. | 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත | 32 |
| 5. | 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත | 34 |
| 6. | 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | 36 |
| 7. | 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත | 37 |
| 8. | 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත | 41 |
| 9. | විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය | 42 |
| 10. | 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත | 58 |
| 11. | 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත | 65 |
| 12. | 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත | 68 |
| 13. | 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 77 |
| 14. | 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 79 |


(අ) මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලද පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි පාඨ බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

**2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) එම වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

"අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකු විසින්-

(අ) නිසි ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉක්මවා මුද්දර ගාස්තු ගෙවා ඇති බවට; හෝ

(ආ) එම මුද්දර ගාස්තු අදාළ වන සාධන පත්‍රයක් මත වැරදි සහගත ලෙස මුද්දර ගාස්තු ගෙවා ඇති බව සහ 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ එවැනි මුද්දර ගාස්තුවක් ගෙවීමට ඔහු බැඳී නොසිටින බවට,

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, ලිඛිතව සිදු කරනු ලබන ඉල්ලීමකින් ඔප්පු කරනු ලබන එම තැනැත්තා වෙත, පළාත් සභා වෙත මාරු කරනු ලැබීමට පෙරාතුව වූ යම් කාලසීමාවක් තුළ දී මුද්දර ගාස්තු වශයෙන් එකතු කරන ලද මුදලින්, එසේ ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය."; සහ

(3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(2) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ ආපසු ගෙවීම සඳහා වූ සියලු ඉල්ලීම් සඳහා අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා ඇති අර්ථයම තිබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]

**පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම පිණිස ද; පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීම සහ ශක්තිමත් කිරීම පිණිස ද; දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි**

දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සුරක්ෂිත කරන අතර ම ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වර්ධනය කිරීම සහ නවීකරණය කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

පෞද්ගලික දත්ත ආරක්ෂණ රාමු අතර අන්තර් ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට මෙන් ම පෞද්ගලික දත්ත ආරක්ෂණය බලාත්මක කිරීමේ අධිකාරීන් අතර දේශ සීමා හරහා වන සහයෝගීතාව ශක්තිමත් කිරීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

දේශීය ලිඛිත නීති සහ අදාළ ජාත්‍යන්තර ව්‍යවස්ථා මාලාවන්ට ගරු කරන අතර ම පාරිභෝගික විශ්වාසය සහතික කරමින් ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් ද දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා වන යාන්ත්‍රණ සඳහා විධිවිධාන සැලැස්වීමට නෛතික රාමුවක් සැකසීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාර මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) IV වන කොටසේ සහ V වන කොටසේ විධිවිධාන හැර, මේ පනතේ අනෙකුත් සියලු විධිවිධාන, (2) වන උපවගන්තියේ සඳහන් පරිදි කථානායකවරයාගේ සහතිකයේ දින සිට මාස දහඅටකට පෙරාතුව නොවන සහ මාස තිස්හයක් නොඉක්මවන දිනයක් විය යුතු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) මේ පනතේ IV වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය (2) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ දින සිට මාස විසිහතරකට පෙරාතුව නොවන සහ මාස හතළිස්අටක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(5) මේ පනතේ V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයකට වඩා පසු දිනයක් නොවන්නා වූ දිනයක් විය යුතු ය.

2. (1) (අ) පෞද්ගලික දත්ත සැකසීම සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ශ්‍රී ලංකාව තුළ දී සිදුවන විට දී; හෝ

(ආ) (i) නිත්‍ය ලෙස හෝ සාමාන්‍ය ලෙස ශ්‍රී ලංකාවේ වාසය කරන;

(ii) ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද;

(iii) ශ්‍රී ලංකාවේ සිටින දත්ත දායකයන් නිශ්චිතව ඉලක්කගත කර භාණ්ඩ හා සේවා සැපයීම ඇතුළුව ශ්‍රී ලංකාව තුළ සිටින දත්ත දායකයන්ට භාණ්ඩ හා සේවා සපයන; හෝ

(iv) දත්ත දායකයකුගේ හැසිරීම ශ්‍රී ලංකාව තුළ දී සිදුවනතාක් දුරට එකී දත්ත දායකයකුගේ හැසිරීමට අදාළ තීරණ ගැනීමේ අදහස ඇතිව, පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව ශ්‍රී ලංකාව තුළ දත්ත දායකයන්ගේ හැසිරීම විශේෂිතව අධීක්ෂණය කරන,

පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් දත්ත සැකසීම සිදු කරනු ලබන විට දී,

එකී දත්ත සැකසීම සම්බන්ධයෙන් මේ පනත අදාළ විය යුතු ය.

(2) පිළිවෙළින් (1) වන උපවගන්තියේ (iii) වන සහ (iv) වන ඡේදවල කාර්ය සඳහා

(අ) දත්ත දායකයන් නිශ්චිතව ඉලක්කගත වීම සිදු විය හැකි අවස්ථාවන්; හෝ

(ආ) දත්ත දායකයන් නිශ්චිතව අධීක්ෂණය වීම සිදුවිය හැකි අවස්ථාවන්,

මේ පනත යටතේ සාදනු ලබන රීති මගින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) (අ) යම් පුද්ගලයකු විසින් හුදෙක් ම පෞද්ගලික, ගෘහස්ථ හෝ ගෘහ ඒකකයකට අදාළ කාර්ය සඳහා පමණක් සකසනු ලබන යම් පෞද්ගලික දත්ත; සහ

(ආ) පෞද්ගලික දත්ත නොවන යම් දත්තයන්,

සම්බන්ධයෙන් මේ පනත අදාළ නොවිය යුතු ය.

3. (1) දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු යඃ

එසේ වුව ද, පොදු අධිකාරියක් වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පාලනය වන අවස්ථාවක, මේ පනත සමඟ අනුකූලවනතාක් දුරට, එකී අධිකාරිය විසින් දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත එකී ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව සැකසීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

## I වන කොටස

## **පෞද්ගලික දත්ත සැකසීම**

4. සෑම පාලකවරයකු විසින් ම මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති වගකීම්වලට අනුකූලව පෞද්ගලික දත්ත සකසනු ලැබිය යුතු ය.

5. පාලකවරයකු විසින්-

(අ) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියකට;

(ආ) විශේෂ ප්‍රභේදවල පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියකට;

(ඇ) මෙහි I වන උපලේඛනයේ (අ) අයිතමය යටතේ හෝ II වන උපලේඛනයේ (අ) අයිතමය යටතේ දත්ත දායකයකුගේ කැමැත්ත මත පදනම්ව පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලු කොන්දේසිවලට; හෝ

(ඈ) අපරාධ විමර්ශන සඳහා පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලු කොන්දේසිවලට,

අනුකූලව කටයුතු කරන්නේ නම්, පෞද්ගලික දත්ත සැකසීම නීත්‍යනුකූල වන්නේ ය.

6. (1) සෑම පාලකවරයකු විසින් ම-

(අ) නිශ්චිත;

(ආ) පැහැදිලි; සහ

(ඇ) නීත්‍යනුකූල,

අරමුණක් සඳහා පෞද්ගලික දත්ත සැකසීම සහතික කරනු ලැබිය යුතු අතර, එම අරමුණ හා නොගැළපෙන ආකාරයකින් එකී පෞද්ගලික දත්ත තවදුරටත් සකසනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජන යහපත අරමුණු කරගත් ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය අරමුණු, සාක්ෂාත් කර ගැනීම සඳහා පාලකවරයකු විසින් එවැනි පෞද්ගලික දත්ත තවදුරටත් සැකසීම, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් මූලික අරමුණු සමඟ නොගැළපෙන බවට නොසැලකිය යුතු ය.

7. සෑම පාලකවරයකු විසින් ම, සිදු කරනු ලබන පෞද්ගලික දත්ත සැකසීම, එම දත්ත එකතු කරන හෝ සකසන අරමුණ සඳහා අවශ්‍යවනතාක් දුරට-

(අ) ප්‍රමාණවත් වන;

(ආ) අදාළ වන; සහ

(ඇ) සමානුපාතික වන,

බවට සහතික කරනු ලැබිය යුතු ය.

8. සෑම පාලකවරයකු විසින් ම, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, යම් සාවද්‍ය හෝ යාවත්කාලීන නොවූ පෞද්ගලික දත්ත මකා දැමීම හෝ නිවැරදි කිරීම සඳහා සෑම සාධාරණ පියවරක් ම ගනිමින්, පෞද්ගලික දත්ත සැකසීම-

(අ) නිරවද්‍යව; සහ

(ආ) යාවත්කාලීනව,

සිදුකරන බවට සහතික කරනු ලැබිය යුතු ය.

9. සෑම පාලකවරයකු විසින් ම, සකසනු ලබන පෞද්ගලික දත්ත, එම පෞද්ගලික දත්ත සකසනු ලබන අරමුණු සඳහා අවශ්‍ය විය හැකි හෝ අපේක්ෂා කළ හැකි යම් කාලසීමාවක් සඳහා පමණක්, දත්ත දායකයන් හඳුනාගැනීම සඳහා ඉඩ සලසන ආකෘතියකින් තබා ගැනීම සහතික කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලකවරයකු විසින්, හුදෙක් ම මහජන යහපත අරමුණු කරගත් ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් දත්ත සැකසීම සිදු කරන විට, එවැනි පෞද්ගලික දත්ත අවශ්‍යවනතාක් දුරට දීර්ඝ කාලයක් සඳහා ගබඩා කරනු ලැබිය හැකි ය.

10. සෑම පාලකවරයකු විසින් ම-

(අ) අවසර නොලත් හෝ නීත්‍යනුකූල නොවන ලෙස පෞද්ගලික දත්ත සැකසීම; හෝ

(ආ) පෞද්ගලික දත්ත නැති වීම, විනාශ වීම හෝ පෞද්ගලික දත්තවලට හානිවීම,

වැළැක්වීම පිණිස, දත්ත කේතගත කිරීම, ව්‍යාජ නමකින් යෙදීම, හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කිරීම හෝ ප්‍රවේශය පාලනය හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රමවේද ඇතුළුව තාක්ෂණික සහ සංවිධානමය පියවර භාවිත කිරීම මගින්, සකසනු ලබන පෞද්ගලික දත්තවල විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය සහතික කරනු ලැබිය යුතු ය.

11. පාලකවරයකු විසින්-

(අ) මේ පනතේ V වන උපලේඛනයේ සඳහන් කර ඇති තොරතුරු; සහ

(ආ) මේ පනතේ II වන කොටස යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර ගන්නා ලද යම් තීරණයක් පිළිබඳ තොරතුරු,

ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයක් මගින් සහ සංක්ෂිප්ත, පාරදෘශ්‍ය, තේරුම් ගත හැකි සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘතියකින් දත්ත දායකයන් වෙත සැපයිය යුතු ය.

12. (1) 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 11 වන වගන්තිවල සඳහන් වගකීම්වලට අනුකූලව කටයුතු කිරීමේ කාර්යය සඳහා-

(අ) පාලකවරයා විසින් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, සහ 11 වන වගන්තිවල සඳහන් දත්ත ආරක්ෂණ වගකීම් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන ආකාරය පෙන්නුම් කිරීමට නිසි පරිදි නාමාවලිගතකළ වාර්තා සකස් කර පවත්වාගෙන යනු ලබන;

(ආ) පාලකවරයාගේ දත්ත සැකසීමේ කටයුතුවල ව්‍යුහය, පරිමාණය, පරිමාව සහ සංවේදීතාව මත පදනම්ව සැලසුම් කරනු ලබන;

(ඇ) 24 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම් මත පදනම්ව උචිත ආරක්ෂණයන් සලස්වනු ලබන;

(ඈ) පාලකවරයාගේ පාලන ව්‍යුහයට ඒකාබද්ධ කරනු ලබන;

(ඉ) අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණ පිහිටුවනු ලබන;

(ඊ) පැමිණිලි භාර ගැනීම, විමර්ශන පැවැත්වීම සහ පෞද්ගලික දත්ත කඩකිරීම හඳුනාගැනීම සඳහා යන්ත්‍රණයක් සහිත;

(උ) කාලානුරූපී අධීක්ෂණය සහ ඇගයීම් මත පදනම්ව යාවත්කාලීන කරනු ලබන; සහ

(ඌ) 13 වන, 14 වන, 15 වන, 16 වන සහ 18 වන වගන්ති යටතේ වන දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු ලබන,

(මෙහි මින්මතු දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන" යනුවෙන් සඳහන් කරනු ලබන) අභ්‍යන්තර පාලනයන් සහ කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සෑම පාලකවරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) අධිකාරිය විසින් කලින් කලට දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

II වන කොටස

## දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්

13. (1) දත්ත දායකයකු විසින් පාලකවරයකු වෙත සිදු කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත, එම දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත පාලකවරයා විසින් සකසනු ලබන්නේ ද යන්න පිළිබඳ තහවුරු කිරීමක් ලබා ගැනීමට සහ V වන උපලේඛනයේ දක්වා ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් තිබිය යුත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දත්ත දායකයකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට දී, V වන උපලේඛනය යටතේ සැපයීමට නියම කර ඇති තොරතුරු පාලකවරයා විසින් 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සපයනු ලැබිය යුතු ය.

14. (1) යම් දත්ත සැකසීමක් මේ පනතේ I වන උපලේඛනයේ (අ) අයිතමයේ හෝ II වන උපලේඛනයේ (අ) අයිතමයේ නිශ්චිතව දක්වා ඇති හේතු මත පදනම් වේ නම්, එකී දත්ත දායකයා විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත ඕනෑ ම විටක දී ස්වකීය කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට, සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් ඇත්තේ යඃ

එසේ වුව ද, එකී කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම මගින්, එකී ඉල්ලා අස්කර ගැනීමට පෙරාතුව සිදුකරන ලද යම් දත්ත සැකසීමක නීත්‍යානුකූලභාවයට බලපෑමක් නොවිය යුතු ය.

(2) යම් දත්ත සැකසීමක් I වන උපලේඛනයේ (ඉ) හෝ (ඊ) අයිතමවල හෝ II වන උපලේඛනයේ (ඊ) අයිතමයේ නිශ්චිතව දක්වා ඇති හේතු මත පදනම් වේ නම්, එකී දත්ත දායකයාට අදාළ පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වළකින ලෙස පාලකවරයකුගෙන් ලිඛිතව ඉල්ලා සිටීමට අයිතිවාසිකමක් ඇත්තේ ය.

15. සාවද්‍ය හෝ අසම්පූර්ණ පෞද්ගලික දත්ත නිවැරදි කරන හෝ සම්පූර්ණ කරන ලෙස පාලකවරයකු වෙත ඉල්ලීමක් කිරීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් තිබිය යුතු අතර, දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත නිවැරදි කරන ලෙස හෝ සම්පූර්ණ කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට දී, 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පාලකවරයා විසින් ප්‍රමාදයකින් තොරව එය නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන මගින්, දත්ත සැකසීමේ කාර්යය සඳහා අවශ්‍ය නොවන යම් අතිරේක පෞද්ගලික දත්ත එකතු කිරීමට සහ සැකසීමට පාලකවරයකු වෙත යම් වගකීමක් පනවනු නොලැබිය යුතු යඃ

එසේම තවදුරටත්, පාලකවරයකු විසින් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් නිසි අධිකරණයක ආඥාවක් යටතේ සාක්ෂිමය කාර්ය සඳහා පෞද්ගලික දත්ත පවත්වා ගැනීමට අවශ්‍ය විට දී, එම පාලකවරයා විසින්, නිවැරදි කිරීමෙන් තොරව එම පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වළකිනු ලැබිය යුතු ය.

16. පහත දැක්වෙන අවස්ථානුගත කරුණු යටතේ තම පෞද්ගලික දත්ත මකා දමන ලෙස පාලකවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කිරීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් ඇත්තේ යඃ-

(අ) 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 11 වන වගන්තිවල සඳහන් වගකීම් කඩකරමින් පෞද්ගලික දත්ත සැකසීම සිදු කිරීමේ දී;

(ආ) I වන උපලේඛනයේ (අ) අයිතමයට හෝ II වන උපලේඛනයේ (අ) අයිතමයට අනුකූලව, දත්ත සැකසීමට පදනම් වූ ස්වකීය කැමැත්ත දත්ත දායකයා විසින් ඉවත් කරගනු ලැබීමේ දී;

(ඇ) දත්ත දායකයා හෝ පාලකවරයා යටත් වන්නා වූ යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් නිසි අධිකරණයක ආඥාවක් මගින්, පෞද්ගලික දත්ත මකා දමන ලෙස නියම කරනු ලැබීමේ දී.

17. (1) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ දත්ත දායකයකුගෙන් පාලකවරයකු වෙත ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට දී, එම පාලකවරයා විසින්, එම ඉල්ලීම කරන ලද දින සිට වැඩ කරන දින විසිඑකක් තුළ-

(අ) එම ඉල්ලීම ප්‍රදානය කර ඇති ද යන්න;

(ආ) (2) වන උපවගන්තිය යටතේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති ද යන්න සහ යම් ලිඛිත නීතියක් මගින් එම හේතු අනාවරණය කිරීම තහනම් කර ඇත්නම් මිස, ඒ සඳහා වන හේතු; හෝ

(ඈ) පාලකවරයා විසින්, 14(2) වන හෝ 15 වන වගන්තිය යටතේ එම පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වැළකී සිට ඇති ද යන්න සහ ඊට හේතු,

එම දත්ත දායකයාට ලිඛිතව දන්වා (ආ) හෝ (ඇ) ඡේද යටතේ පාලකවරයා විසින් ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් දත්ත දායකයාට අභියාචනා කිරීමේ අයිතිවාසිකමක් ඇති බව, දන්වනු ලැබිය යුතු ය.

(2) පාලකවරයා විසින්-

(අ) ජාතික ආරක්ෂාව;

(ආ) මහජන සාමය;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ පවත්වන ලද යම් පරීක්ෂණයක්, සිදුකරගෙන යන ලද විමර්ශනයක් හෝ කාර්ය පටිපාටියක්;

(ඈ) අපරාධ වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම, අපරාධ වැරදි පිළිබඳ විමර්ශනය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම;

(ඉ) යම් ලිඛිත නීතියක් යටතේ වූ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ නිදහස;

(ඊ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් ඉල්ලීමක් මත කටයුතු කිරීමට පාලකවරයා සතු තාක්ෂණික සහ මෙහෙයුම් ශක්‍යතාව;

(උ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව දත්ත දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා පාලකවරයාට නොහැකි වන අවස්ථාවක්; හෝ

(ඌ) යම් ලිඛිත නීතියක් යටතේ පෞද්ගලික දත්ත සැකසීමේ අවශ්‍යතාවය,

සැලකිල්ලට ගනිමින්, දත්ත දායකයකු විසින් මේ පනතේ 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ කරන ලද ඉල්ලීමකට අනුව කටයුතු කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) පාලකවරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතික්ෂේප කිරීමක් සඳහා වන හේතු වාර්තා කරනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබීමේ දී අධිකාරිය වෙත එම වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන දත්ත දායකයකුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට පාලකවරයාට නොහැකි වන අවස්ථාවක දී, එම ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමට පාලකවරයාට හැකි වන පරිදි අතිරේක තොරතුරු සැපයීමට එම පාලකවරයා විසින් දත්ත දායකයකුගෙන් ඉල්ලීම් කරනු ලැබිය හැකි ය.

(5) (අ) දත්ත දායකයා බාල වයස්කරුවකු වන අවස්ථාවක දී, දෙමාපියන් හෝ බාල වයස්කරු සම්බන්ධයෙන් මව්පිය අධිකාරය ඇති යම් තැනැත්තකු හෝ ඔහුගේ නීත්‍යානුකූල භාරකරුවකු වශයෙන් පත්කර ඇති තැනැත්තකු විසින්; හෝ

(ආ) දත්ත දායකයා කායික හෝ මානසික වශයෙන් අයෝග්‍ය වන අවස්ථාවක දී, අධිකරණයක් විසින් ඔහුගේ භාරකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත්කර ඇති තැනැත්තකු විසින්; හෝ

(ඇ) (අ) සහ (ආ) ඡේදයන් හි සඳහන් කර ඇති අවස්ථාවන්හි දී හැර මේ කොටස යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට දත්ත දායකයා විසින් ලිඛිතව යථා පරිදි බලය පවරන ලද තැනැත්තකු විසින්; හෝ

(ඈ) මියගිය දත්ත දායකයකුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන උරුමකරුවකු විසින්, එවැනි දත්ත දායකයකුගේ මරණයේ දින සිට වසර දහයක කාලයක් තුළ,

මේ කොටස යටතේ දත්ත දායකයකු වෙත පවරන ලද යම් අයිතිවාසිකමක් නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(6) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ දත්ත දායකයකු විසින් කරනු ලබන ඉල්ලීමක්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවලට යටත්ව ඉදිරිපත් කළ යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ ගාස්තුවක් අයකරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින්, දත්ත දායකයා වෙත එකී ගාස්තුවල තොරතුරු සහ එසේ පැනවීමට හේතු දැක්විය යුතු ය.

18. (1) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයකුගේ අයිතිවාසිකම්වලට හා නිදහසට අප්‍රතිවර්තනීය හා අඛණ්ඩව බලපෑම් සිදු කරන හෝ සිදු කිරීමට හැකිවන්නා වූ හුදෙක් ම ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ පාලකවරයකුගේ තීරණය, 19 වන වගන්තියට යටත්ව සමාලෝචනය කිරීම සඳහා එම පාලකවරයා වෙත ඉල්ලීමක් කිරීමේ අයිතිය සෑම දත්ත දායකයකුට ම ඇත්තේ ය.

(2) ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ පාලකවරයකුගේ තීරණය-

(අ) පාලකවරයකු යටත් වන යම් ලිඛිත නීතියක් මගින් බලය පවරනු ලබන;

(ආ) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් බලය පවරනු ලබන;

(ඇ) දත්ත දායකයාගේ කැමැත්ත මත පදනම් වන; හෝ

(ඈ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමකට එළඹීම සඳහා හෝ ඒ අනුව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය වන,

අවස්ථාවක දී ගනු ලබන විට, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, පාලකවරයා විසින්, දත්ත දායකයාගේ අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන අධිකාරිය විසින් ඒ වෙනුවෙන් සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පියවර සහ අදාළ වන නිර්ණායක අනුගමනය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (ඈ) ඡේදය යටතේ වන අවශ්‍යතාව, පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද සඳහා අදාළ නොවිය යුතු ය.

19. (1) පාලකවරයා විසින්-

(අ) 14 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වැළකී නොමැති අවස්ථාවක දී; හෝ

(ආ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඇ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඈ) 17 (2) වගන්තිය යටතේ දත්ත දායකයකුගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඉ) 18 (1) වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පමණක් පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී,

දත්ත දායකයා විසින් එම තීරණයට විරුද්ධව නියම කරනු ලැබිය හැකි ආකෘතියකින්, ආකාරයකින් සහ යම් කාලසීමාවක් ඇතුළත, අධිකාරිය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (අ) 14 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත තවදුරටත් සැකසීමෙන් වැළකී නොසිටීමට වූ පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ආ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඇ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඈ) 17 (2) වගන්තිය යටතේ පාලකවරයා සිදු කළ ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඉ) 18 (1) වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න,

තීරණය කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(3) අවශ්‍ය විමර්ශන සිදුකර අවසන් කිරීමෙන් පසු ව, නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත, අභියාචනයට ඉඩදෙනු ලැබිය හැකි බව හෝ ඉඩදෙනු නොලැබිය හැකි බව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එකී තීරණය ඒ සඳහා වන හේතු ද සමග අධිකාරිය විසින් දත්ත දායකයාට සහ පාලකවරයාට දන්වනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් අභියාචනය පිළිගනු ලබන අවස්ථාවක දී, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත, පාලකවරයා විසින්, අධිකාරියෙහි තීරණය බලාත්මක කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු අතර, එම තීරණය බලාත්මක කිරීම සඳහා ගන්නා ලද පියවර පාලකවරයා විසින් දත්ත දායකයාට සහ අධිකාරියට දන්වනු ලැබිය යුතු ය.

(5) අධිකාරියෙහි තීරණය මගින් අගතියට පත් යම් දත්ත දායකයකු හෝ පාලකවරයකු විසින්, එම තීරණය ලබා දෙන ලද දින සිට දින තිහක් පසු නොවන දිනක දී අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

III වන කොටස

## පාලකවරුන් සහ දත්ත සකසන්නන්

20. (1) සෑම පාලකවරයකු විසින් ම සහ සෑම දත්ත සකසන්නකු විසින් ම පහත සඳහන් අවස්ථාවල දී, මේ පනතේ විධිවිධානවලට අනුකූල වීම සහතික කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කිරීම හෝ පත් කිරීම සිදු කරනු ලැබිය යුතු යː-

(අ) අධිකරණය විසින් එහි අධිකරණමය තත්ත්වය තුළ කටයුතු කිරීම සඳහා හැර, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දත්ත සැකසීම සිදුකරනු ලබන අවස්ථාවක; හෝ

(ආ) පහත සඳහන් කරුණු ඇතුළත්ව පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් දත්ත සැකසීමේ මූලික කාර්යයන් සිදුකරනු ලබන අවස්ථාවක දී-

(i) මෙහෙයුම්වල ස්වභාවය, එහි විෂය පථය හෝ එහි අරමුණු ප්‍රකාරව, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි පරිමාණය සහ විශාලත්වය මත දත්ත දායකයන්ගේ ක්‍රමවත් සහ විධිමත් අධීක්ෂණය කිරීමක් අවශ්‍ය වන විට දී; හෝ

(ii) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක සහ විශාලත්වය මත පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේදවල දත්ත සැකසීම සිදු කිරීමේ දී; හෝ

(iii) දත්ත සකස් කිරීමේ ස්වභාවය සහ දත්ත දායකයන්ට එයින් සිදුවන බලපෑම මත පදනම්ව, මේ පනත යටතේ ආරක්ෂා කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්වලට බලපෑම් කරනු ලබන හානියක් පිළිබඳ අවධානමක් සහිත ප්‍රතිඵල ගෙන දෙන දත්ත සැකසීමේ දී.

(2) පෞද්ගලික දත්ත සැකසීමට අදාළ විමර්ශනවලට සහ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා වන උපාය මාර්ග හා යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට නිපුණත්වය සහ හැකියාව සහිත දත්ත ආරක්ෂණයට අදාළ කාරණාවල අධ්‍යාපන පසුබිමක්, දැනුම සහ තාක්ෂණික නිපුණතාවන් ඇතුළත් වන නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි අදාළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, දත්ත ආරක්ෂණ නිලධරයකු සතු විය යුතු ය.

(3) පාලකවරයා අස්ථිත්ව සමූහයක් වන අවස්ථාවක දී එක් එක් අස්ථිත්වය විසින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි තනි දත්ත ආරක්ෂණ නිලධරයකු පාලකවරයා විසින් පත්කරගනු ලැබිය හැකි ය. පාලකවරයා හෝ දත්ත සකසන්නා පොදු අධිකාරියක් වන අවස්ථාවක දී, ඔවුන්ගේ සංවිධාන ව්‍යුහය සැලකිල්ලට ගනිමින්, යම් පොදු අධිකාරි කිහිපයක් සඳහා තනි දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කරනු ලැබිය හැකි ය.

(4) පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් දත්ත ආරක්ෂණ නිලධරයකු සම්බන්ධ කරගත හැකි තොරතුරු ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර එම තොරතුරු අධිකාරිය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(5) දත්ත ආරක්ෂණ නිලධරයකුගේ වගකීම පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වන ලද දත්ත සැකසීමේ නියමයන් පිළිබඳව පාලකවරයාට හෝ දත්ත සකසන්නාට සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන්ට උපදෙස් ලබාදීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන බවට පාලකවරයා හෝ දත්ත සකසන්නා වෙනුවෙන් සහතික වීම;

(ඇ) දත්ත සැකසුම් මෙහෙයුම්වල නිරත කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ගොඩනැංවීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම පිළිබඳව උපදේශනය සැපයීම; සහ

(ඉ) දත්ත ආරක්ෂණයට අදාළ කරුණු පිළිබඳව අධිකාරිය විසින් නිකුත් කරන ලද සියලු විධාන සහ උපදෙස්වලට සහයෝගය දැක්වීම සහ අනුකූලව කටයුතු කිරීම.

21. (1) පාලකවරයකු වෙනුවෙන් දත්ත සකසන්නකු විසින්, දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින් -

(අ) මේ පනතේ විධිවිධානයන් බලාත්මක කිරීම සඳහා සුදුසු තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර සැපයීම සහතික කරනු ලබන සහ මේ පනත යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරනු ලබන, දත්ත සකසන්නන් පමණක් යොදා ගත යුතු ය; සහ

(ආ) විෂය කරුණු සහ දත්ත සැකසීමේ කාලසීමාව, දත්ත සැකසීමේ ස්වභාවය සහ අරමුණ, පෞද්ගලික දත්ත වර්ගය සහ දත්ත දායකයන්ගේ ප්‍රභේද සහ පාලකවරයාගේ වගකීම් පිළිබඳ දක්වනු ලබන ගිවිසුමකට හෝ යම් ලිඛිත නීතියකට එම දත්ත සකසන්නා යටත් වන බව සහතික කළ යුතු ය.

(2) පාලකවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින්, දත්ත සැකසීමෙහි අරමුණු සහ උපක්‍රම පිළිබඳ සාමූහිකව නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, එම පාලකවරුන්, මේ පනත යටතේ සඳහන් වගකීම් ඉටුකිරීම සඳහා සාමූහිකව වගකිව යුතු "සාමූහික පාලකවරුන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

22. (1) පාලකවරයා වෙනුවෙන් දත්ත සකසන්නකු විසින් දත්ත සැකසීමේ කටයුතුවල නිරත වන අවස්ථාවක දී, දත්ත සකසන්නා විසින්-

(අ) පාලකවරයාගේ ලිඛිත උපදෙස් මත දත්ත සැකසීමේ කටයුතු සිදුකරන බව සහතික කළ යුතු ය;

(ආ) දත්ත සකසන්නාගේ සේවක පිරිස, උචිත තාක්ෂණික සහ ආයතනික පියවර ක්‍රියාත්මක කිරීම මඟින් විශ්වසනීයත්වය සහ රහස්‍යතාව පිළිබඳ ගිවිසුම්ගත වගකීම්වලට යටත් වන බව සහතික කළ යුතු ය;

(ඇ) දත්ත සැකසීමේ ස්වභාවය සහ දත්ත සකසන්නාට පවතින තොරතුරු පිළිබඳ සැලකිල්ලට ගෙන පාලකවරයාගේ ලිඛිත ඉල්ලීම මත පරීක්ෂණ කටයුතු ඇතුළුව අනුකූලතා විගණන කටයුතු කරගෙන යාමට පාලකවරයා වෙත පහසුකම් සලස්වනු ලැබිය යුතු ය; සහ

(ඈ) පාලකවරයාගේ ලිඛිත උපදෙස් මත දත්ත සැකසීමට අදාළ සේවා සැපයීම අවසන් වීමෙන් පසු, සියලුම පෞද්ගලික දත්ත පිටපත් මකා දැමිය යුතු ය, නැතහොත් පාලකවරයා වෙත නැවත එකී සියලු පෞද්ගලික දත්ත පිටපත් ලබා දිය යුතු ය.

(2) දත්ත සකසන්නකු විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී හෝ ඔහු විසින් ම දත්ත සැකසීමේ අරමුණු සහ දත්ත සැකසීමේ උපක්‍රම නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, එම දත්ත සකසන්නා එම දත්ත සැකසීමට අදාළව මේ පනතේ කාර්යය සඳහා, පාලකවරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) දත්ත සකසන්නකු විසින්, නිශ්චිත දත්ත සැකසීමේ කටයුතු සිදු කිරීම සඳහා (මෙහි මින් මතු "උප දත්ත සකසන්නා" යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් දත්ත සකසන්නකු නිරත කරවනු ලබන අවස්ථාවක දී, එකී උප දත්ත සකසන්නාට සහ ඔහු සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන වගකීම් ඉටු කිරීමට උප දත්ත සකසන්නකු අපොහොසත් වන අවස්ථාවක දී, දත්ත සකසන්නා විසින් එකී උප දත්ත සකසන්නාගේ වගකීම් ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් පාලකවරයාට වගකිව යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "සේවක පිරිස්" යන්නෙන්, යම් සේවා නියුක්තිකයකු, උපදේශකවරයකු, නියෝජිතයකු, අනුබද්ධ ආයතනයක් හෝ පෞද්ගලික දත්ත සැකසීම සඳහා දත්ත සකසන්නා විසින් ගිවිසුමකට ඇතුළත් කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ.

23. (1) පෞද්ගලික දත්ත කඩ කිරීමක් සිදුවන අවස්ථාවක දී, පාලකවරයකු විසින්, මේ පනත යටතේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයකට අනුරූපව සහ යම් කාල සීමාවක් තුළ පෞද්ගලික දත්ත කඩ කිරීමක් සම්බන්ධයෙන් අධිකාරිය වෙත දන්වනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින්-

(අ) එවැනි දත්ත කඩකිරීම් පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දිය යුතු අවස්ථා;

(ආ) බලපෑමට ලක් වූ දත්ත දායකයා වෙත ඒ පිළිබඳ දැනුම් දිය යුතු අවස්ථා; සහ

(ඇ) එම නිවේදනයේ ආකෘතිය සහ ආකාරය සහ දත්ත කඩ කිරීමට අදාළ නිවේදනයේ සැපයිය යුතු තොරතුරු,

සම්බන්ධයෙන් මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.

24. (1) පාලකවරයා විසින්-

(අ) පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද හෝ පෞද්ගලික දත්ත ක්‍රමානුකූලව සහ පුළුල් ලෙස ඇගයීමක්;

(ආ) පොදු මහජනයාට ප්‍රවේශ විය හැකි ප්‍රදේශයක හෝ විදුලිසංදේශ ජාලවල ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීමක්; හෝ

(ඇ) එම දත්ත සැකසීමේ විෂය පථය සහ ඊට සම්බන්ධ අවදානම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි දත්ත සැකසීම් කටයුත්තක්,

සම්බන්ධ වන යම් දත්ත සැකසීමක් සිදු කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එම පාලකවරයා විසින්, එම දත්ත සැකසීමට පෙරාතුව, මේ පනතේ I වන කොටස යටතේ පාලකවරයා මත පනවන ලද වගකීම් සහ මේ පනතේ II වන කොටස යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අපේක්ෂිත දත්ත සැකසුම්වල බලපෑම නිශ්චිතව දැනගැනීම සඳහා, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් දත්ත සැකසීම මගින් දත්ත දායකයාට ඇතිවිය හැකි හානියක් වේ නම් ඒ පිළිබඳ අවදානම ලිහිල් කිරීම සඳහා පාලකවරයා විසින් ගනු ලබන යම් පියවර හා ආරක්ෂණයන් ඇතුළත් යම් තොරතුරු සහ විස්තර පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක, ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කිරීමේ දී, දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක, පාලකවරයා විසින් එම දත්ත ආරක්ෂණ නිලධරයාගේ සහාය ලබාගත යුතු ය.

(4) දැනටමත් පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදුකර තිබුණ ද, යම් දත්ත සැකසීමක් සඳහා යොදාගනු ලැබූ ක්‍රමවේදයෙහි, තාක්ෂණයෙහි හෝ ක්‍රියාවලියෙහි යම් වෙනසක් ඇතිවන ඕනෑම අවස්ථාවක, පාලකවරයා විසින් මේ වගන්තියට අනුව නව පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(5) දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත ආරක්ෂණයට ඇති අවදානම සහ ඊට අදාලව අධිකාරිය විසින් නිර්දේශිත ආරක්ෂණ පියවර පිළිබඳව සහ දත්ත සැකසීමේ අනුකූලතාවය පිළිබඳ ඇගයීමක් සිදු කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත වෙනත් යම් තොරතුරු සපයමින් මේ වගන්තිය යටතේ නියම කර ඇති දත්ත ආරක්ෂණ ඇගයීමක් පාලකවරයා විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

25. (1) මේ පනත යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ සහතික කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්වලට, දත්ත සැකසීම මගින් හානියක් වීමේ අවදානමක් ඇති විය හැකි බවට, 24 වන වගන්තිය යටතේ සිදු කරනු ලැබූ පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම් ඇගයීමක් මගින් පෙන්වා දෙන අවස්ථාවක දී, පාලකවරයා විසින් කිසිදු පෞද්ගලික දත්ත සැකසීමක් සිදු කිරීමට පෙරාතුව එහි හානියක් වීමේ අවදානම ලිහිල් කිරීම සඳහා වන පියවර ගත යුතු ය.

(2) පාලකවරයා (1) වන උපවගන්තිය යටතේ පියවර ගැනීමෙන් පසුව වුව ද, දත්ත දායකයන්ට හානියක් වීමේ අවදානම ලිහිල් කිරීමට නොහැකි අවස්ථාවක දී, එවැනි දත්ත සැකසීමකට පෙරාතුව, එවැනි පාලකවරයකු විසින් අධිකාරිය විමසිය හැකි ය.

(3) එවැනි විමසීමක දී, අධිකාරිය විසින්, දත්ත දායකයන්ට සිදු විය හැකි හානියක් පිළිබඳ ඇති අවදානම ලිහිල් කිරීම සඳහා අතිරේක පියවර ගැනීමට හෝ එම දත්ත සැකසීම නැවැත්වීමට නියම කරමින් ලිඛිත උපදෙස් සපයනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පාලකවරයා විසින් අධිකාරිය විමසන අවස්ථාවක දී, අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරක් පාලකවරයා විසින් අධිකාරිය වෙත සපයනු ලැබිය යුතු ය.

(5) යම් සාධාරණ හේතුවක් නොමැතිව, අධිකාරියේ උපදෙස් අනුව කටයුතු කිරීමට පාලකවරයා අපොහොසත් වන අවස්ථාවක දී, එවැනි පාලකවරයකු මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(6) සැක දුරු කිරීමේ කාර්යය සඳහා, II වන උපලේඛනයේ (ආ), (ඊ), (උ) සහ (ඌ) අයිතමවල සඳහන් පෞද්ගලික දත්ත සකසනු ලබන විට, II වන උපලේඛනය යටතේ නියම කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වන එවැනි පියවර සහ සුදුසු අධීක්ෂණය සපයා ඇති බව සලකනු ලැබිය යුතු බව ප්‍රකාශ කරනු ලැබේ.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පාලකවරයා විසින් 24(1) වන වගන්තියේ දක්වා ඇති පෞද්ගලික දත්ත සැකසීමෙහි නිරත වන ඕනෑම අවස්ථාවක සහ ජාතික ආරක්ෂාවට, මහජන සාමයට සහ මහජන සෞඛ්‍යයට අදාළව දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින් අධිකාරිය විමසිය යුතු ය.

26\. (1) පොදු අධිකාරියක් විසින් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු වශයෙන් පෞද්ගලික දත්ත සැකසීම කරනු ලබන අවස්ථාවක, එම පෞද්ගලික දත්ත ශ්‍රී ලංකාව තුළ පමණක් සැකසීම කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ ගනු ලැබූ ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ, තුන්වන රටක දී දත්ත සැකසීමට අවසර දෙනු ලැබිය හැකි පෞද්ගලික දත්ත ප්‍රභේද, අධිකාරිය විසින්, අවස්ථාවෝචිත පරිදි, පාලකවරයා හෝ දත්ත සකසන්නා සහ අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය විමසා වර්ග කරනු ලබන්නේ නම් මිස, එම පෞද්ගලික දත්ත තුන්වන රටක දී සැකසීම කරනු නොලැබිය යුතු ය.

(2) (අ) ප්‍රමාණවත් තීරණයක්" ගැනීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, තුන්වන රටක දී පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළ නීති සහ නීති බලාත්මක කිරීමේ යාන්ත්‍රණ පිළිබඳ සහ මේ පනතේ I වන කොටස, II වන කොටස සහ III වන කොටසේ 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධාන අදාළ වීම පිළිබඳ සහ දේශසීමා හරහා පෞද්ගලික දත්ත සංචලනය කිරීමේ කාර්යය සඳහා තුන්වන රටක දී පෞද්ගලික දත්ත සැකසීමට අදාළ නියම කරනු ලැබූ වෙනත් නිර්ණායක පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ආ) මේ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලැබූ යම් ප්‍රමාණවත් තීරණයක්-

(i) එකී තීරණවලට බලපෑ හැකි තුන්වන රටක සංවර්ධනයන් පිළිබඳ කාලානුරූපී අධීක්ෂණයට යටත් විය යුතු අතර, අමාත්‍යවරයා විසින් යටත් පිරිසෙයින් සෑම වර්ෂ දෙකකට වරක් ම එම තීරණය සමාලෝචනය කරනු ලැබිය හැකි ය; සහ

(ii) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, එම තීරණය සංශෝධනය කරනු ලබන තෙක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(3) පොදු අධිකාරියක් හැර පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්-

(අ) "ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව නියෝග මඟින් නියම කරනු ලැබූ තුන්වන රටක දී; හෝ

(ආ) ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව නියෝග මඟින් නියම කරනු ලැබූ තුන්වන රටක් නොවන රටක දී, මේ පනතේ I වන කොටස II වන කොටස සහ III වන කොටසේ 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන සහ 25 වන වගන්ති යටතේ පනවනු ලැබූ අදාළ වගකීම්වලට අනුකූලවීම අවස්ථාවෝචිත පරිදි එම පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් සහතික කරනු ලබන අවස්ථාවක පමණක්,

පෞද්ගලික දත්ත සැකසීම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අනුකූලවීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා, මේ පනත මගින් ආරක්ෂා කරනු ලබන දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සඳහා උචිත ආරක්ෂණයන් සහතික කර ගැනීම සඳහා සහ තුන්වන රටේ සිටින ප්‍රතිග්‍රාහකයාගේ බැඳීම සහ බලාත්මක කළ හැකි කැපවීම් සහතික කර ගැනීම සඳහා අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නීතිමය ලියවිලි පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් පිළිගනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් තීරණයක් හෝ (4) වන උපවගන්තිය ප්‍රකාරව උචිත ආරක්ෂණයන් ගෙන නොමැති අවස්ථාවක දී-

(අ) ප්‍රමාණවත් තීරණ සහ උචිත ආරක්ෂණයන් නොමැති වීම හේතුවෙන් දත්ත දායකයාට එම දත්ත සැකසීමෙන් සිදුවිය හැකි අවදානම පිළිබඳ දැනුම්වත් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවෙන් බැහැර පෞද්ගලික දත්තවල යෝජිත දත්ත සැකසීම සඳහා දත්ත දායකයා විසින් ප්‍රකාශිතව ම කැමැත්ත ලබා දී ඇත්නම්; හෝ

(ආ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමක් ඉටු කිරීම සඳහා හෝ දත්ත දායකයාගේ ඉල්ලීමක් මත පාලකවරයා විසින් ගනු ලබන යම් පූර්ව ගිවිසුම්ගත පියවර ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඇ) දත්ත දායකයාට අදාළ නෛතික හිමිකම්පෑම් ප්‍රතිෂ්ඨාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ එම හිමිකම්පෑම්වල විත්තිවාචක සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඈ) මේ පනතේ I වන උපලේඛනයේ (උ) අයිතමයේ අර්ථනිරූපිත මහජන යහපත පිණිස වූ හේතු සම්බන්ධයෙන් දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඉ) දත්ත දායකයා හෝ වෙනත් තැනැත්තකුගේ ජීවිතය, සෞඛ්‍ය තත්ත්වය සහ ආරක්ෂාව සඳහා තර්ජනයක් වන යම් හදිසි අවස්ථාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට දත්ත පැවරීම අවශ්‍ය වේ නම් සහ දත්ත දායකයා හෝ ඔහුගේ නෛතික භාරකරු ශාරීරික හෝ නෛතික වශයෙන් කැමැත්ත ලබා දීමට නොහැකිව සිටින අවස්ථාවක දී; හෝ

(ඊ) මේ පනත යටතේ නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි වෙනත් තත්ත්වයන් යටතේ එම දත්ත සැකසීම සඳහා අවසර ලබා දී ඇත්නම්,

පොදු අධිකාරියක් හැර පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පෞද්ගලික දත්ත සකස් කරනු ලැබිය හැකි ය.

IV වන කොටස

## ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීම

27. (1) 14 වන වගන්තියට යටත්ව, (මෙහි මින් මතු "ආයාචිත පණිවුඩ" යනුවෙන් හඳුන්වනු ලබන) පණිවුඩ ලබා ගැනීම සඳහා දත්ත දායකයකු විසින් කැමැත්ත ලබා දී ඇත්නම් පමණක්, පණිවුඩ පතුරුවා හැරීමේ කාර්ය සඳහා පාලකවරයකු විසින් තැපැල් සේවා, විදුලි සංදේශ සේවා, විද්‍යුත් ක්‍රම හෝ ඊට සමාන වෙනත් යම් ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, III වන උපලේඛනයේ කොන්දේසිවලට අනුකූලව පාලකවරයා විසින් කැමැත්ත ලබා ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කැමැත්ත ලබා ගන්නා විට, සම්බන්ධ කරගැනීමේ තොරතුරු රැස් කරන අවස්ථාවේ දී සහ පණිවුඩයක් යවනු ලබන එක් එක් වේලාවේ දී, පාලකවරයා විසින්, ආයාචිත පණිවුඩ ලබා ගැනීමෙන් නොමිලේ ඉවත් වන ආකාරය පිළිබඳ විස්තර දත්ත දායකයා වෙත සපයනු ලැබිය යුතු ය.

(4) යම් ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා තැපැල්, විද්‍යුත්, විදුලි සංදේශ හෝ ඊට සමාන වෙනත් යම් ක්‍රම භාවිත කරන්නා වූ පාලකවරයකු විසින්, එම පණිවුඩ යැවීමට අදහස් කරනු ලබන්නේ යම් දත්ත දායකයන් වෙත ද එකී දත්ත දායකයන් වෙත, පණිවුඩයේ ස්වභාවය පිළිබඳව සහ පාලකවරයාගේ හෝ පාලකවරයා යම් තුන්වන පාර්ශ්වයක් වෙනුවෙන් එම පණිවුඩය යවන්නේ නම් එම තුන්වන පාර්ශ්වයේ අනන්‍යතාවය පිළිබඳව ද දන්වනු ලැබිය යුතු ය.

(5) ආයාචිත පණිවුඩවල විවිධ ප්‍රභේද හඳුනාගැනීම සඳහා පාලකවරුන් විසින් යොදාගත යුතු යම් කේතයක් හෝ උප පදයක් අධිකාරිය විසින්, අදාළ නියාමන හෝ අධීක්ෂණ මණ්ඩලය විමසා, මේ පනත යටතේ සාදන ලද රීතීන් මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා "පණිවුඩයක්" යන්නට, දත්ත දායකයා විසින් පාලකවරයාගෙන් ගාස්තුවක් රහිතව සේවයක් ලබා ගැනීමට කැමැත්ත ලබා දී ඇති යම් අන්තර්ජාල පාදක වූ වෙළඳ ප්‍රචාරක දැන්වීම් හැර මානව මැදිහත්වීම සහිතව හෝ රහිතව ස්වයංක්‍රීය ඇමතීම සහ සන්නිවේදන පද්ධති භාවිත කිරීම ඇතුළුව, විද්‍යුත් හෝ විදුලි සංදේශ සේවාවන් හෝ වෙනත් යම් සමාන ආකාරයන් භාවිතයෙන්-

(අ) පාලකවරයකුගේ හෝ වෙනත් යම් තුන්වන පාර්ශ්වයක භාණ්ඩ හෝ සේවා; හෝ

(ආ) පාලකවරයා ද ඇතුළත්වන යම් තැනැත්තෙක්, අස්ථිත්වයක් හෝ සංවිධානයක්,

ප්‍රවර්ධනය කිරීම සඳහා අදහස් කරනු ලබන යම් ලිඛිත, විද්‍යුත්, වාචික, චිත්‍රමය හෝ වීඩියෝ පණිවුඩයක් ඇතුළත් වේ.

V වන කොටස

## දත්ත ආරක්ෂණ අධිකාරිය

28. (1) මේ පනතේ කාර්ය සඳහා (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු මෙන්ම, එකී නාමයෙන් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට හැකියාව තිබිය යුත්තේ ය.

29. (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුත්තේ ය.

(2) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් මේ පනත මගින් අධිකාරිය වෙත යොමු කරනු ලැබ ඇති, පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ඉංජිනේරු, වෛද්‍ය, බැංකු සහ මූල්‍ය, විදුලි සංදේශ, නීතිය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් සහ වෘත්තීමය නිපුණතාවක් පෙන්නුම් කර ඇත්තා වූ ද මහජන උපයෝගීතා, ව්‍යාපාර සැකසුම් ලබාගැනීම් (BPO) ලොජිස්ටික්, රක්ෂණ, බැංකු සහ මූල්‍ය යන අංශවල පළපුරුද්දක් ඇත්තා වූ ද යටත් පිරිසෙයින් සාමාජිකයන් දෙදෙනකු රාජ්‍ය අංශයේ අස්ථිත්වවල පූර්ව පළපුරුද්දක් සහිත තැනැත්තන් වන්නා වූ ද තැනැත්තන් අතරින්, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පසකට අඩුනොවන සහ හත්දෙනෙකුට වැඩි නොවන සාමාජිකයන් ගණනකින් මණ්ඩලය සමන්විත විය යුත්තේ ය.

(4) මණ්ඩලයට පත් කරනු ලබන තැනැත්තන්ට නියාමනයට සම්බන්ධ කාරණා, පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය, තොරතුරු ආරක්ෂණය, දත්ත විද්‍යාව, දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, මුදල්, තොරතුරු තාක්ෂණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පළපුරුද්දක් සහ දැනීමක් ද තිබිය යුතු ය.

(5) මේ පනතේ VI වන උපලේඛනයේ විධිවිධාන, මණ්ඩලයේ සාමාජිකයන්ගේ නුසුදුසුකම් සහ සාමාජිකයන් ඉවත් කිරීම සඳහා වන හේතු, සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම, සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ නොපැමිණීම, සාමාජිකයන්ගේ ධුර කාලය, අධිකාරියේ රැස්වීම් සහ නිල මුද්‍රාව සම්බන්ධයෙන් බලාත්මක විය යුතු ය.

30. (1) රාජ්‍ය හෝ පෞද්ගලික අංශ අස්ථිත්වවල සක්‍රීය නායකත්ව ගුණාංග ප්‍රකට කර ඇති සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීමේ ලිපිය ජනාධිපතිවරයා විසින් පිළිගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් තත් කාර්ය සඳහා හේතු දක්වමින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, සාමාජිකයකුගේ සාමාන්‍ය කර්තව්‍ය ඉටු කිරීමට අමතරව, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

31. (අ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම;

(ආ) රාජ්‍ය හා පුද්ගලික අංශයේ ක්‍රියාවලීන් සහ සේවා ඩිජිටල්කරණය කිරීමෙන් මතුවන යම් අහිතකර බලපෑමකින් දත්ත දායකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම;

(ඇ) ඩිජිටල් ගනුදෙනු සහ සන්නිවේදන කටයුතුවල නිරත වන දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා යාන්ත්‍රණ සැපයීම;

(ඈ) ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට පහසුකම් සැලසීම සඳහා මේ පනතේ විධිවිධාන සමග ඇති නියාමන අනුකූලතාව සහතික කිරීම,

අධිකාරියේ පරමාර්ථ විය යුතු ය.

32. මේ පනත යටතේ සිය කාර්ය කිරීමේ සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන බලතල අධිකාරිය සතු විය යුතු යː-

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කාරණා, ඍජුවම හෝ අධිකාරිය විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම් නිලධරයකු, නියෝජිතයකු, අස්ථිත්වයක් හෝ ආයතනයක් මඟින් කරගෙන යාමට;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව පාලකවරයන් සහ දත්ත සකසන්නන් ඔවුන්ගේ කාර්ය සහ වගකීම් කරගෙන යනු ලබන බවට තහවුරු කිරීම සඳහා වන සියලු පියවර ගැනීමට සහ ඔහුගේ කාර්ය සහ වගකීම් ඉටු කරන බවට තහවුරු කිරීම සඳහා පාලකවරයකු හෝ දත්ත සකසන්නකු සතු යම් තොරතුරක් පරීක්ෂා කිරීමට;

(ඇ) දත්ත සැකසීමේ කාර්ය කරගෙන යන්නේ යම් ආකාරයකට ද, එම ආකාරයට අදාළ නියම සහ කොන්දේසි පළකිරීමේ අවශ්‍යතාවය ද ඇතුළුව, මේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලකවරයකුට හෝ දත්ත සකසන්නකුට විධාන කිරීමට;

(ඈ) කාලෝචිත ආකාරයකින් අවශ්‍ය දත්ත සැපයීමට අපොහොසත් වන විට, දත්ත දායකයකුගෙන් අයකරගන්නා ලද ගාස්තු ආපසු ගෙවන ලෙස පාලකවරයකුට හෝ යම් අදාළ දත්ත ආරක්ෂණ නිලධරයකුට විධාන කිරීමට;

(ඉ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විමර්ශන පැවැත්වීමට, පැමිණිලි භාර ගැනීමට, යම් තැනැත්තකුට අධිකාරිය ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීමට, විධාන නිකුත් කිරීමට සහ දඩ මුදල් පැනවීමට;

(ඊ) ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී මේ පනතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා නියෝග මඟින් නියම කරනු ලබන ආකාරයකට පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ දත්ත සැකසීමේ කර්තව්‍යයන්ට අදාළ වන යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස එවැනි තැනැත්තකුට නියම කිරීමට;

(උ) දත්ත දායකයකුගේ අයිතිවාසිකම්වලට දත්ත සැකසීම මගින් අත්‍යාසන්න හානියක් විය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු අධිකාරිය වෙත පවතින අවස්ථාවක දී, යම් පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ පරිශ්‍රයට ඇතුළුවීමට සහ වාර්තා පරීක්ෂා කිරීමට හෝ තහනමට ගැනීමට සහ විමර්ශන සිදු කිරීමට;

(ඌ) දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන ඇතුළුව, පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් කරගෙන යනු ලැබූ යම් දත්ත සැකසීමේ කාර්ය සිදුකරනු ලබන ආකාරය සහ භාවිත කරනු ලැබූ කාර්ය පරිපාටිය පිළිබඳව කාලානුරූප ඇගයීම් සිදු කිරීමට;

(එ) නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ බලතල සහ කාර්ය සහිත සාමාජිකයන්ගෙන් සමන්විත උපදේශක කමිටු පත් කිරීමට;

(ඒ) පෞද්ගලික දත්ත ආරක්ෂණයට අදාළව සහතික කිරීම සහ සහතික කිරීමේ මණ්ඩල හඳුනා ගැනීමට;

(ඔ) මේ පනතේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත දත්ත ආරක්ෂාව සඳහා වගකිව යුතු වන වෙනත් ඉහළම මට්ටමේ රජයන් හෝ නියාමන ආයතන හෝ ජාත්‍යන්තර නියෝජ්‍යායතන හෝ සංවිධාන සමඟ තනිවම හෝ නැතහොත් සාමූහිකව ගිවිසුම්වලට එළඹීමට හෝ යම් කාර්යයක නිරත වීමට;

(ඕ) යම් මිලට ගැනීමක්, පරිත්‍යාග, ප්‍රදාන ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් අධිකාරිය සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, ගැනීම හා දැරීම සහ එවැනි යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පවරා දීම, රික්තවරණය කිරීම, පැවරීම, හුවමාරු කිරීම, හෝ බැහැර කිරීමට;

(ක) සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට යටත්ව අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා සුදුසු විය හැකි බවට අධිකාරිය විසින් සලකනු ලබන, ප්‍රවීණයන් වශයෙන් සේවය කිරීම සඳහා උපදේශකවරුන් සහ අනුශාසකවරුන් ඇතුළුව නිලධරයන් සහ කාර්ය මණ්ඩලයක් පත් කිරීමට;

(ග) අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය විසින් සේවා නියුක්ත කරනු ලැබූ හෝ සේවා ගිවිසුමක් ඇති කරගනු ලැබූ, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සහ නිලධරයන්ගේ, උපදේශකවරුන්ගේ සහ අනුශාසකවරුන්ගේ යහපත උදෙසා මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් දීමනා ගෙවීම සහ වෙනත් පහසුකම් ලබා දීම සහ අර්ථසාධක අරමුදල් ඇතිකිරීම හෝ විශ්‍රාම සැලසුම් සකස් කිරීමට;

(ච) අධිකාරිය විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් ආකාරයකින් එහි අරමුදල් ආයෝජනය කිරීමට;

(ජ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ වසා දැමීමට;

(ට) දත්ත ගබඩා කිරීම, දත්ත සකස් කිරීම, කැමැත්ත ලබා ගැනීම සහ මේ පනතේ විධිවිධානවල නිසි ක්‍රියාත්මකභාවය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කරුණුවල දත්ත ආරක්ෂණයට අදාළව ප්‍රමිතීන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට;

(ඩ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීමට:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්, මුදල් විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය, අධිකාරිය විසින් ලබාගත යුතු ය;

(ණ) මේ පනත යටතේ සෑදීමට හෝ නිකුත් කිරීමට නියම කරනු ලැබ ඇති රීති සෑදීමට සහ මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කිරීමට; සහ

(ත) මේ පනත යටතේ අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ පාදක වන වෙනත් යම් ක්‍රියාවන් කිරීමට.

33. අධිකාරිය විසින් එහි පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා, පහත දැක්වෙන සියලු හෝ යම් කාර්ය සහ කර්තව්‍ය, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:-

(අ) මෙහි V වන උපලේඛනයේ දක්වා ඇති කොන්දේසිවලට අනුව 11 වන සහ 13 වන වගන්තිවල විධිවිධානවලට අනුකූල වන ලෙසට පාලකවරුන්ට විධාන කිරීම;

(ආ) අධිකාරිය ස්වකීය මෙහෙයවීම මත හෝ දත්ත දායකයකුගේ ඉල්ලීම මත මේ පනත යටතේ පාලකවරුන් හෝ දත්ත සකසන්නන් මත පනවනු ලැබ ඇති වගකීම් කෙරෙහි එම පාලකවරුන් හෝ දත්ත සකසන්නන්ගේ නිසි අනුකූලභාවය සහතික කර ගැනීම සඳහා සියලුම දත්ත සකස් කිරීමේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඇ) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ඉටු කරන ලද යම් දත්ත සැකසීමේ කටයුත්තක් සම්බන්ධයෙන් එකී නිශ්චිත පාලකවරයාට හෝ දත්ත සකසන්නාට විධාන නිකුත් කිරීම;

(ඈ) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පාලකවරුන්ට සහ දත්ත සකසන්නන්ට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහපත් පරිචයන් මත පදනම්ව පුහුණුවීම් සිදුකිරීම හෝ ඒ සඳහා පහසුකම් සැලසීම;

(ඉ) පාලකවරුන් විසින් දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික කිරීම සඳහා විධාන නිකුත් කිරීම;

(ඊ) පාලකවරුන් සහ දත්ත සකසන්නන් අතර විනිවිදභාවය සහ ස්වයං නියාමනය ප්‍රවර්ධනය කිරීම;

(උ) අන්තර්ජාතික සම්මුතීන් යටතේ දත්ත ආරක්ෂණ වගකීම් සඳහා දේශීය අනුකූලතාවය සහතික කිරීම;

(ඌ) දත්ත ආරක්ෂණයට අදාළ සියලු කරුණු පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම;

(එ) අමාත්‍යවරයාගේ අනුමතය සහිතව, දත්ත ආරක්ෂණයට අදාළ කරුණු පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් රජය නියෝජනය කිරීම;

(ඒ) දත්ත ආරක්ෂණයට අදාළ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාකච්ඡාමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම ඇතුළුව දත්ත ආරක්ෂණයට අදාළ ඉගෙනුම් සහ අධ්‍යාපනික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ එවැනි කටයුතු මෙහෙයවනු ලබන වෙනත් සංවිධානවලට සහයෝගය දැක්වීම;

(ඔ) අධිකාරිය වෙනුවෙන් හෝ රජය වෙනුවෙන්, විදේශීය දත්ත ආරක්ෂණ අධිකාරීන් සහ ජාත්‍යන්තර හෝ අන්තර් රාජ්‍ය සංවිධාන ඇතුළුව වෙනත් සංවිධාන සමඟ දත්ත ආරක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සහයෝගය කළමනාකරණය කිරීම සහ හුවමාරු කර ගැනීම;

(ඕ) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය වෙත පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීම;

(ක) පෞද්ගලික දත්ත සැකසීමේ දී නවීන තාක්ෂණයෙහි බලපෑම සහ භාවිතය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම;

(ග) පාලකවරු අතර පෞද්ගලික දත්ත හුවමාරුව සඳහා බලය පවරමින් සහ එමගින් වෙනත් පාලකවරයකු සතුව දැනටමත් පවතින දත්ත එකතු කර ගබඩා කිරීමෙන් ඇති වන ද්විකරණය සීමා කිරීම සඳහා නිර්ණායක ක්‍රියාත්මක කිරීම ඇතුළුව ආරක්ෂිත අන්තර් ප්‍රතිග්‍රහණ වේදිකාවක් හරහා පාලකවරු අතර පෞද්ගලික දත්ත හුවමාරු කරනු ලබන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු අධිකාරියක් වන පාලකවරු අතර දත්ත හුවමාරු කිරීම මෙහෙයවීම සඳහා රීති සෑදීම;

(ච) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා ආංශික මාර්ගෝපදේශ සහ රීති සහ දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන්ගේ සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවලට අදාළ උපමාන සැකසීම සඳහා උපදේශක කමිටු පත් කිරීම;

(ජ) පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද භාවිත කිරීමට, 27 වන වගන්තියට අනුකූලව ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට, තනි පුද්ගල පැතිකඩ දැක්වීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට සහ ස්වයංක්‍රීය තීරණ ගැනීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට අදාළ රීති සෑදීම; සහ

(ට) මේ පනත යටතේ අධිකාරියේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන, මේ පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක් සමඟ අනනුකූලතාවයක් ඇති නොවන්නා වූ වෙනත් යම් කටයුතු ඉටු කිරීම.

34. (1) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා, උපදේශක කමිටුවේ නිර්දේශ මත, බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරුන්ට සහ දත්ත සකසන්නන්ට අධිකාරිය විසින්, බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) උපදේශක කමිටුවේ නිර්දේශවල දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරුන්ගේ සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවලට අදාළ උපමාන ඇතුළත් විය යුතු ය.

(3) එම බලපත්‍රවලට අදාළ උපමාන, බලපත්‍ර ප්‍රභේද, නියම සහ කොන්දේසි, ආකෘතිය සහ කාලසීමාව, ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය, අලුත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම, එම බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට විරුද්ධව අභියාචනය කිරීම සහ අය කළ යුතු ගාස්තු නියෝග මඟින් නියම කරනු ලබන ආකාරයෙන් විය යුතු ය.

(4) එම පාලකවරුන් සහ දත්ත සකසන්නන් විසින් එම බලපත්‍රවලට අදාළ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම අධිකාරිය විසින් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය හැකි ය.

35. (1) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු-

(අ) මේ පනත උල්ලංඝනය කරමින් යම් දත්ත සැකසීමේ කටයුත්තක යෙදෙන බවට හෝ යෙදීමට නියමිත බවට; හෝ

(ආ) පෞද්ගලික දත්ත සකස් කිරීමට අදාළව, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ 52 වන වගන්තියේ (ඇ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ වන යම් රීතියක්, මේ පනත යටතේ සාදන ලද නියෝගයක්, මාර්ගෝපදේශයක් හෝ නියමයක් උල්ලංඝනය කර ඇති බවට හෝ අනුකූලවීමට අපොහොසත්ව ඇති බවට හෝ උල්ලංඝනය කිරීමට හෝ අනුකූලවීමට අපොහොසත්වීමට නියමිත බවට,

අධිකාරිය වෙත පැමිණිල්ලක් ලැබීම මත හෝ වෙනත් ආකාරයකින් විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවක දී, අධිකාරිය විසින් නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ක්‍රමවේදයකට අනුකූලව විමර්ශනයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක දී, පාලකවරයාට සහ දත්ත සකසන්නාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත-

(අ) දත්ත සකස් කිරීමට අදාළ ක්‍රියාවක, නොකර හැරීමක හෝ ක්‍රියාකලාපයක නිරත වීම නතර කිරීමට හෝ වැළකී සිටීමට; හෝ

(ආ) තත්ත්වය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන යම් ක්‍රියා සිදු කිරීමට; හෝ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් සිදු කරන ලද උල්ලංඝනය කිරීමක ප්‍රතිඵලයක් ලෙස පාඩුවක්, අලාභයක් හෝ හානියක් විඳ ඇති අගතියට පත් තැනැත්තකුට අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වන්දි ලෙස යම් මුදලක් ගෙවීමට,

එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට නියම කරමින් එකී පාලකවරයාට හෝ දත්ත සකසන්නාට විධානයක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ එවැනි පාලකවරයකුට හෝ දත්ත සකසන්නකුට නිකුත් කරන ලද සෑම විධානයක් ම, ලිඛිතව විය යුතු අතර එම විධානයන් විධාන කරනු ලබන යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු වෙත ලියාපදිංචි තැපෑලෙන්, විද්‍යුත් සන්නිවේදනයක් මගින් හෝ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් සමාන මාර්ගයක් මගින් භාරදිය යුතුය, සහ එම පාලකවරුන් සහ දත්ත සකසන්නන් එම විධානයන්ගෙන් බැඳී සිටිය යුතු අතර, එම විධානය සන්නිවේදනය කරන ලද දින සිට එම විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

VI වන කොටස

## අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

36. (1) මණ්ඩලය විසින්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර ඔහු රාජ්‍ය අංශයට හෝ පෞද්ගලික අංශයට නායකත්වය ලබාදීමෙහි ලා විශිෂ්ටත්වයට පත් සහ වෘත්තීය විශේෂඥතාව පෙන්නුම් කර ඇත්තා වූ ද, තැනැත්තකු විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, පාරිශ්‍රමික ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවා නියුක්ති කොන්දේසි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතල විෂමාචාරයකට මින් පෙර වරදකරු ලෙස තීරණය කර ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්;

(ආ) කලින් ධුරයෙන් පහ කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇත්නම්,

එකී තැනැත්තා මණ්ඩලය විසින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාන්‍ය අධීක්ෂණයට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තිකයින් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, පහත දැක්වෙන හේතු කිසිවක් සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි යඃ-

(අ) අධිකාරිය වෙනුවෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කරගෙන යාමේ දී යම් සම්බන්ධතා අතර ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ;

(ආ) ඒ තැනැත්තා සිහි විකල් තැනැත්තකු බවට හෝ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කරගෙන යාමට නොහැකි තැනැත්තකු බවට පත්වීම;

(ඇ) ඒ තැනැත්තා ස්වකීය කාර්යන්ට හෝ කර්තව්‍යයන්ට අදාළව බරපතල විෂමාචාරය සම්බන්ධයෙන් වරදකරු වීම; හෝ

(ඈ) ඒ තැනැත්තා ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී ස්වකීය ස්වාධීනත්වයට බාධා කිරීමට හැකි යම් කටයුත්තකට සම්බන්ධ වීම හෝ මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට අනුකූල නොවීමඃ

එසේ වුව ද, එකී ඉවත් කිරීමට පෙරාතුව මණ්ඩලය විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතු ය.

37\. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින්, ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි සේවක සංඛ්‍යා තනතුරු ඇති කිරීම සහ නිලධරයන් සහ සේවා නියුක්තිකයින් සේවයේ නියුක්ත කිරීම කරනු ලැබිය හැකි ය. තව ද, අධිකාරිය විසින්, මේ පනතේ විධිවිධාන යටතේ වන ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා එම නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයින්ගේ වැටුප් සහ වේතන හෝ ඔවුන්ගේ වෙනත් පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් නියම කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, තොරතුරු සුරක්ෂිතභාවය, දත්ත විද්‍යාව දත්ත විශ්ලේෂණය, තොරතුරු තාක්ෂණය, මුදල්, නීතිය සහ අනෙකුත් අදාළ විෂයයන් පිළිබඳ තාක්ෂණික සේවක පිරිස පුහුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීම කරනු ලැබිය යුතු අතර, මේ කාර්යය සඳහා, අධිකාරිය විසින්, නිශ්චය කරනු ලබන පරිදි කුසලතාව පෙන්නුම් කර ඇති අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයින්ගේ ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී සිදු කරන අධ්‍යයන කටයුතුවල වියදම පියවීම සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය.

(3) අධිකාරියේ නිලධරයන්ට සහ සේවා නියුක්තිකයින්ට අදාළ විය යුතු ආචාර ධර්ම පද්ධතියක් අධිකාරිය විසින් සකස් කරනු ලැබිය යුතු ය.

(4) කලින් කලට වෙනස් කිරීමෙන්, පරිවර්ජන්න කිරීමෙන් හෝ සංශෝධනය කිරීමෙන් අධිකාරිය විසින් එම ආචාර ධර්ම පද්ධතිය ප්‍රතිශෝධනය කළ හැකි ය.

(5) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් බරපතල විෂමාචාරයක් සම්බන්ධයෙන් මින් පෙර වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක හෝ යම් නියාමන ආයතනයක් විසින් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව සිට ඇති අවස්ථාවක;

(ආ) මින් පෙර ධුරයෙන් පහ කරනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇති අවස්ථාවක,

අධිකාරිය විසින් එම තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා අධිකාරියට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය, නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(8) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට සිදුකරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) අධිකාරිය විසින්, එහි නිලධරයන්ගේ හෝ සේවා නියුක්තිකයින්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා ඔවුන් වෙනත් රජයේ ආයතනවලට හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි නියාමන අධිකාරීන්ට අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි අතර, එය එම ආයතනය සහ අධිකාරිය අතර එකඟ වූ පැවරුමක් මත සිදු විය යුතු ය. අනුයුක්ත කරන ලද කාලසීමාව අධිකාරිය වෙනුවෙන් සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

VII වන කොටස

## දඩ මුදල්

38. (1) පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, 35 වන වගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, දත්ත දායකයන් කෙරෙහි වන බලපෑම, අදාළ අනනුකූලතාවන් හි ස්වභාවය සහ ප්‍රමාණය සහ මේ පනතේ 39 වන වගන්තියේ සඳහන් කාරණා සැලකිල්ලට ගැනීමෙන් පසු, අධිකාරිය විසින්, එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට එක් එක් අනනුකූලතාවක් සඳහා රුපියල් මිලියන දහයකට නොවැඩි දඩ මුදලක් ගෙවීමට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) කලින් අවස්ථාවක දී දඩ මුදලකට යටත් වූ තැනැත්තකු වෙනත් යම් පසු අවස්ථාවක දී යම් විධානයකට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක, එම තැනැත්තා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහුට පනවනු ලැබිය හැකි දඩ මුදලකට අමතරව දෙවන අවස්ථාවේ දී සහ ඉන්පසු ඊට අනුකූලව කටයුතු නොකළ එක් එක් අවස්ථාව සඳහා දඩ මුදලක් වශයෙන්, පළමු අවස්ථාවේ දී පනවනු ලැබූ ප්‍රමාණය මෙන් දෙගුණයක් වන මුදලකින් සමන්විත අතිරේක දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පනවන ලද දඩ මුදලක් එකතු කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද දඩ මුදල් 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවීම හේතුවෙන් අගතියට පත් තැනැත්තාට ගෙවිය යුතු වන්දි මුදල ලෙස නිශ්චය කරන ලද යම් මුදලක් ඇත්නම් එය අඩු කිරීමෙන් පසුව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) (1) වන හෝ (2) වන උපවගන්ති ප්‍රකාරව දඩ මුදලකට යටත් වන තැනැත්තකු, දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාව ඇතුළත එම දඩ මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, දඩ මුදල ගෙවීමේ ආඥාවක් සඳහා අධිකාරිය විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒකපාර්ශ්වීය ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාව කරනු ලැබූ විට, එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවනු ලබන යම් මුදලක් බව නොතකා, එකී දඩ මුදල එම අධිකරණය විසින් පනවනු ලැබූ දඩයකට සමාන ආකාරයෙන් අය කරගනු ලැබිය යුතු ය.

(5) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු නියාමනය කිරීම සඳහා හෝ අධීක්ෂණය කිරීම සඳහා යම් අදාළ වන ලිඛිත නීතියක් හෝ රීතීන් ප්‍රකාරව පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර හෝ වෘත්තීන් අත්හිටුවීම හෝ එකී ව්‍යාපාරය හෝ වෘත්තිය කරගෙන යාමට ප්‍රදානය කර තිබූ බලපත්‍රය අවලංගු කිරීම ඇතුළුව නමුත් ඊට සීමා නොවූ, වෙනත් යම් නියාමන පියවරයන් අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් ගනු ලැබීම මේ වගන්තිය යටතේ වන දඩ පැනවීමකින් වළක්වනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ පුද්ගල මණ්ඩලයකට දඩ මුදලක් පනවනු ලැබූ අවස්ථාවක දී, එවිට-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වන විට, (1) වන උපවගන්තිය යටතේ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ ඒ සංස්ථාගත මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකිව යුතු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු වන සෑම තැනැත්තකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වන විට, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් වන විට, (1) වන උපවගන්තිය යටතේ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකිව යුතු නිලධරයකු වන සෑම තැනැත්තකු ම,

(1) වන උපවගන්තිය යටතේ වන නියමයන්ට අනුකූල වීමට අපොහොසත් බව සහ ඒ සඳහා අනුකූල බව තහවුරු කිරීම සඳහා ඔහු සියලු නිසි සැලකිල්ලෙන් හා උද්යෝගයෙන් කටයුතු කළ බව ඔහු ඔප්පු කරන්නේ නම් මිස, එකී දඩ මුදල ගෙවීම සඳහා යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ පරිපාලනමය දඩ මුදලක් පැනවීම මගින් අගතියට පත් තැනැත්තකු, එකී තැනැත්තාට එම පරිපාලනමය දඩ මුදල පැනවීම සන්නිවේදනය කරනු ලැබූ දින සිට දින විසි එකක් ඇතුළත එකී තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) (7) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු, (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ පනවන ලද දඩ මුදලට සමාන මුදලක් ඇප තැන්පතුවක් වශයෙන් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ මුදලින් තැන්පත් කළ යුතු ය.

(10) (7) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් ක්‍රියා කළ බව ඔප්පුකිරීමේ භාරය අවස්ථානුකූලව පාලකවරයා හෝ දත්ත සකසන්නා වෙත පැවරී තිබිය යුතු ය.

39. 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණය ඇතුළු පරිපාලනමය දඩ මුදලක් පැනවීම සඳහා තීරණයක් ගැනීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳව අධිකාරිය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) අදාළ සැකසීමේ ස්වභාවය, විෂයපථය හෝ අරමුණ සැලකිල්ලට ගනිමින් උල්ලංඝනය කිරීමේ ස්වභාවය, බරපතළකම සහ කාලසීමාව මෙන් ම බලපෑමට ලක් වූ දත්ත දායකයන් සංඛ්‍යාව සහ ඔවුන්ට විඳීමට සිදු වූ හානියේ මට්ටම;

(ආ) දත්ත දායකයන්ට විඳීමට සිදු වූ හානිය අවම කිරීම සඳහා පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් ගනු ලැබූ යම් ක්‍රියාමාර්ග;

(ඇ) 12 වන වගන්තිය යටතේ පාලකවරයා වෙත නියම කරන ලද දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනේ එලදායිතාවය;

(ඈ) උල්ලංඝනය කිරීමට පිළියම් කිරීම සඳහා සහ එකී උල්ලංඝනය කිරීමෙන් සිදු විය හැකි අයහපත් ප්‍රතිඵල අවම කිරීම සඳහා අධිකාරිය සමඟ දක්වන සහයෝගීතාවයේ ප්‍රමාණය;

(ඉ) යම් උල්ලංඝනය කිරීමක් මගින් බලපෑමට ලක් වූ පෞද්ගලික දත්ත ප්‍රභේද;

(ඊ) විශේෂයෙන් පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දී තිබේ ද, එසේ දැනුම් දී තිබේ නම් එය කෙතෙක්දුරට ද සහ උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකාරිය දැනුවත් වූ ආකාරය;

(උ) මේ පනත යටතේ දත්ත පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ පූර්වයෙන් වූ අනුකූල නොවීමේ අවස්ථාවන්;

(ඌ) ඍජුවම හෝ අන්‍යාකාරයෙන්, මේ පනත යටතේ හෝ එයින් පැන නැඟී අවස්ථානුකූලව පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් මේ පනත උල්ලංඝනය කිරීම තුළින්, මූල්‍යමය ප්‍රතිලාභ හෝ නොවැළැක්විය හැකි පාඩු වැනි සිදුවීම්වලට අදාළ වන වෙනත් යම් උග්‍රකාරී හෝ ලිහිල් කිරීමේ යම් වෙනත් සාධක.

40. මේ පනතේ විධිවිධාන සඳහා වන යම් නිදහස් කිරීමක්, සීමා කිරීමක් හෝ බලහීන කිරීමක් සඳහා එකී නිදහස් කිරීම, සීමා කිරීම හෝ බලහීන කිරීම යම් නීතියක් මගින් විධිවිධාන සලසනු ලබන අවස්ථාවක සහ මූලික අයිතිවාසිකම් සහ නිදහස යනාදියෙහි හරයට ගරු කිරීම සඳහා සහ-

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ආරක්ෂාව, ආරක්ෂණය, මහජන සුරක්ෂිතතාව, මහජන සෞඛ්‍ය, ආර්ථික සහ මූල්‍ය ක්‍රමවල ස්ථිරතාව ආරක්ෂා කිරීම;

(ආ) අධිකරණයේ අපක්ෂපාතිත්වය සහ ස්වාධීනත්වය;

(ඇ) අපරාධ වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම;

(ඈ) අපරාධ දඬුවම් ක්‍රියාත්මක කිරීම; සහ

(ඉ) විශේෂයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතීන් ඇතුළුව සහ තැනැත්තන්ගේ මූලික නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම,

සඳහා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් තුළ අවශ්‍ය සහ සමානුපාතික පියවර ගනු ලැබීම සඳහා හැර, එවැනි නිදහස් කිරීමකට, සීමා කිරීමකට හෝ බලහීන කිරීමකට ඉඩ ලබාදෙනු නොලැබිය යුතු ය.

VIII වන කොටස

## අධිකාරියේ අරමුදල

41. (1) අධිකාරියට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල;

(ආ) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශ රජයකින් රාජ්‍ය නියෝජ්‍යායතනවලින් සහ බහු පාර්ශ්වික නියෝජ්‍යායතනවලින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල්,

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ගෙවීම් කිරීම අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් අධිකාරිය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

42. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

IX වන කොටස

## විවිධ

43. මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අධිකාරියට අවශ්‍ය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයාගේ කැමැත්ත සහිතව අධිකාරිය විසින් බැංකු අයිරාවක් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් තාවකාලිකව ණයට ලබා ගත හැකිය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගත් යම් ණය මුදල් සම්බන්ධ නොගෙවූ මුදල් ප්‍රමාණයන්ගේ එකතුව, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

44. (1) මණ්ඩලය විසින්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඒ නිලධරයා විසින් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් එසේ පවරන ලද එවැනි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

45. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද, ඒ නිලධරයා විසින් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන යම් විධානවලට යටත් ව, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ බලය අධ්‍යක්ෂ-ජනරාල්වරයාට තිබිය යුතු ය.

46. (1) යම් අධිකරණයක් ඉදිරියේ දී අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකරගත් ගාස්තු පමණක් අධිකාරියේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු විසින් සිදුකරන ලද හෝ සිදු කරන ලදැයි අනුමාන කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ තැනැත්තා එම ක්‍රියාව සිදුකරනු ලැබුවේ සද්භාවයෙන් යුතුව වන බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් ඒ වියදම් අයකරග නු ලබන්නේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

47. අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියේ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අධිකාරියේ කටයුතු සහ කාර්යවලට අදාළ යම් වාර්තා ඉදිරිපත් කරන ලෙසට අධිකාරියට නියම කරනු ලැබිය යුතු ය.

48. (1) අධිකාරියේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි යම් සහායක ලේඛන සමඟ අධිකාරිය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත ඒ මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් කරගෙන යන ලද කාර්ය පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද වාර්තා සහ ලේඛන ලැබුණු දින සිට මාස හයක කාලයක් ඇතුළත ඒ වාර්තාවේ සහ ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

49. මේ පනත යටතේ අධිකාරිය වෙත පනවන ලද හෝ පවරන ලද යම් කර්තව්‍ය හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී සද්භාවයෙන් සිදුකරන ලද කිසිවක් සඳහා, අධිකාරියේ යම් නිලධරයකුට හෝ අධිකාරිය විසින් බලය ලබා දෙනු ලැබූ යම් නිලධරයකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමක් පනවනු නොලැබිය යුතු ය.

50. අධිකාරියේ සියලු නිලධරයන් සහ සේවා නියුක්තිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

51. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය.

52. (1) අධිකාරිය පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය:-

(අ) විවිධ නිලධරයන්ගේ පත් කිරීමේ යෝජනා ක්‍රම, පත්කිරීම්වල නියම, සේවා නියුක්තිය සහ සේවයෙන් ඉවත් කිරීම සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය ඇතුළුව ඒ විවිධ නිලධරයන්ගේ බලතල, කර්තව්‍ය සහ පාරිශ්‍රමික ගෙවීම්;

(ආ) අධිකාරියේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම;

(ඈ) මේ පනතේ II වන කොටස යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය සහ ආකාරය;

(ඉ) 17 වන වගන්තිය යටතේ දත්ත දායකයන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ නිර්ණායක;

(ඊ) මේ පනත යටතේ සෑදිය යුතු බවට නියම කරනු ලබන හෝ බලය ලබාදෙන රීති සම්බන්ධ සියලු කාරණා.

(2) මේ පනතේ V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දින සිට මාස විසි හතරක් තුළ, අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ පළමු වරට රීති සාදනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ රීති සෑදීමට පෙර අධිකාරිය විසින්, සති දෙකකට නොඅඩු කාලසීමාවක් සඳහා මහජන අදහස් විමසීමක් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ මහජන අදහස් විමසීමේ කාලසීමාව, අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කළ හැකි වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරන තෙක් සහ අනුමත රීති සහ එකී අනුමත කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරිය විසින් සාදන ලද යම් රීතියක් පරිච්ඡින්න වූ බව සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

53. (1) අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මගින් බලය දී ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල සාමාන්‍ය ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, පහත දැක්වෙන සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යː-

(අ) I වන, II වන, III වන සහ IV වන උපලේඛන යටතේ වන කොන්දේසි සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ වෙනස් කිරීම;

(ආ) අදාළ වන නීති, දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස බලාත්මක කිරීමේ හැකියාව අන්තර්ජාතික බැඳීම් හුවමාරුවන පෞද්ගලික දත්තවලට අදාළ දත්ත දායකයින්ට ඇති ඵලදායී පරිපාලනමය සහ අධිකරණමය සහන සැලකිල්ලට ගෙන 26 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පරිදි ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂණයක් සහතික කරන තුන්වන රටවල් හඳුනාගැනීම;

(ඇ) මේ පනත යටතේ සපයනු ලැබූ යම් සේවාවක් සඳහා අය කළ යුතු ගාස්තු සහ අයකිරීම් නිශ්චිතව දක්වමින්;

(ඈ) මේ පනත යටතේ නිකුත් කළ යුතු බලපත්‍ර වර්ග සහ උපමාන නිශ්චිතව දක්වමින්;

(ඉ) ඒ බලපත්‍රවල නියම, කොන්දේසි, ආකෘතිය සහ කාලය, අයදුම් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය, අලුත්කිරීම, තාවකාලිකව අත්හිටුවීම, අහෝසිකිරීම සහ ඒ බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට, තාවකාලිකව අත්හිටුවීමට හෝ අහෝසිකිරීමට එරෙහිව අභියාචනා කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින්;

(ඊ) බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ගාස්තු නිශ්චිතව දක්වමින්;

(උ) දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධ අයිතිවාසිකම් සහ නිදහස සඳහා සුදුසු ආරක්ෂණයක් සැපයීම සඳහා වන කොන්දේසි නිශ්චිතව දක්වමින්;

(ඌ) මේ පනතේ විධිවිධාන යටතේ අධිකාරිය වෙත කරනු ලැබිය හැකි අභියාචනයන් හි ආකෘතිය සහ ආකාරය නිශ්චිතව දක්වමින්.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයෙහි හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් අවලංගු වූ බව සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

54. මේ පනතේ අධිකාරී බලය යටතේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඔහුගේ කාර්ය කිරීම ආරම්භ කිරීමට පෙර මේ පනත යටතේ ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඔහුට දැන ගැනීමට ලැබිය හැකි යම් තොරතුරක් සම්බන්ධයෙන් තමා දැඩි රහස්‍යතාව පිළිපදින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, එකී යම් තොරතුරක්-

(අ) අධිකරණයක් විසින් හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබූ විට; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක් සමග අනුකූල වීම සඳහා,

හැර හෙළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය.

55. (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදනු ලැබූ රීති, නියෝග හෝ නියමයන්හි විධිවිධාන බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවයක් පැන නැඟුනහොත්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින්, දුෂ්කරතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල බවට අමාත්‍යවරයාට පෙනී යන පරිදි මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමග අනනුකූල නොවන යම් විධිවිධාන සාදනු ලැබිය හැකි යː

එසේ වුව ද, මේ පනත බලාත්මක වීමේ දින සිට වසර පහක කාලයක් ඉක්මයාමෙන් පසු එවැනි නියමයක් සෑදීම නොකළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියමයක් ම, එය සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

## X වන කොටස

## **අර්ථ නිරූපණය**

56. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙ හි-

"හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කිරීම" යන්නෙන්, පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් වන විට, පෞද්ගලික දත්තවලින් යම් හඳුනාගැනීමේ ලක්ෂණ එම පෞද්ගලික දත්ත යම් හඳුනාගත් හෝ හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු හා සම්බන්ධ වීම ස්ථිර ලෙස ඉවත් කිරීම අදහස් වේ;

"ස්වයංක්‍රීය දත්ත සැකසීම" යන්නෙන්, අතින් සිදු කරන දත්ත සැකසීමකට අයත් නොවන දත්ත සැකසීමක් අදහස් වේ;

"ජෛව මිතික දත්ත" යන්නෙන්, මුහුණෙහි ප්‍රතිරූපය හෝ ඇඟිලි සලකුණු, ඩැක්ටිලොස්කොපික් (dactyloscopic) දත්ත, හෝ ඇසේ කළු ඉංගිරියාවට අදාළ දත්ත ඇතුළත් වන යම් ස්වභාවික පුද්ගලයකුගේ අනන්‍ය හඳුනාගැනීමකට ඉඩ ලබාදෙන හෝ තහවුරු කරන එම ස්වාභාවික තැනැත්තාගේ භෞතික, කායික විද්‍යාමය හෝ හැසිරීම් ස්වභාවයන්ට අදාළ නිශ්චිත හෝ තාක්ෂණික සැකසීම්වලින් ජනනය වූ පෞද්ගලික දත්ත අදහස් වේ;

"සහතික කිරීමේ ආයතන" යන්නෙන්, පෞද්ගලික දත්ත සැකසීම හෝ දත්ත ආරක්ෂණ නිලධරයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් සහතික කිරීමේ සේවා සපයන දේශීය හෝ විදේශීය ආයතන අදහස් වේ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහසයට අඩු ස්වාභාවික තැනැත්තකු අදහස් වේ;

"කැමැත්ත" යන්නෙන්, ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා ලිඛිත ප්‍රකාශයක් ආකාරයෙන් හෝ අනුමත කරන ක්‍රියාවක් ආකාරයෙන් දත්ත දායකයකුගේ එකඟතාවය පළ කරන යම් නිර්බාධිතව ලබාදුන්, නිශ්චිත, දන්වන ලද සහ පැහැදිලි දැක්වීමක් අදහස් වේ;

"පාලකවරයා" යන්නෙන්, තනිවම හෝ අන් අය සමග ඒකාබද්ධව පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ ක්‍රම නිශ්චය කරනු ලබන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, පොදු අධිකාරියක්, රාජ්‍ය සංස්ථාවක්, රාජ්‍ය නොවන සංවිධානයක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් යම් මණ්ඩලයක් හෝ අස්ථිත්වයක් අදහස් වේ;

"පෞද්ගලික දත්ත දේශසීමා හරහා සංචලනය" යන්නෙන්, තුන්වන රටක දී සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා දේශ සීමාවෙන් පිටතට සිදුවන පෞද්ගලික දත්ත සංචලනය අදහස් වේ;

"ඩැක්ටිලොස්කොපික් දත්ත" යන්නෙන්, ඇඟිලි සලකුණු වලට අදාළ දත්ත අදහස් වේ;

"සෞඛ්‍ය පිළිබඳ දත්ත" යන්නෙන්, ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය හෝ ස්වභාවය පෙන්නුම් කරන යම් තොරතුරක් ඇතුළුව ස්වාභාවික තැනැත්තකුගේ කායික හෝ මානසික සෞඛ්‍යයට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"දත්ත ආරක්ෂණ අධිකාරිය" යන්නෙන්, මේ පනතේ 28 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අධිකාරිය අදහස් වේ;

"දත්ත ආරක්ෂණ නිලධරයා" යන්නෙන්, මේ පනතේ 20 වන වගන්තිය යටතේ නම් කරන ලද හෝ පත් කරන ලද තැනැත්තා අදහස් වේ;

"දත්ත දායකයා" යන්නෙන්, පෞද්ගලික දත්ත අදාළ වන, ජීවත්වන හෝ මිය ගිය, හඳුනාගත් හෝ හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු අදහස් වේ;

"හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු" යන්නෙන්, විශේෂයෙන් යම් පෞද්ගලික දත්තවලට අදාළව සෘජුවම හෝ අන්‍යාකාරයෙන් හඳුනාගත හැකි තැනැත්තකු අදහස් වේ;

"දත්ත කේතනය" යන්නෙන්, යම් දත්ත අනවසරයෙන් භාවිත කරන්නන් හට අවබෝධකර ගත නොහැකි වන පරිදි පරිගණක විද්‍යාවේ දී භාවිත කෙරෙන ගණිතමය ක්‍රම භාවිත කරමින් එම දත්ත කේතාංකනය කිරීමේ හෝ වෙනස් කිරීමේ ක්‍රියාව අදහස් වේ;

"මූල්‍ය දත්ත" යන්නෙන්, යම් දත්ත දායකයකු විසින් විවෘත කරන ලද ගිණුමක් හඳුනාගත හැකි යම් අක්ෂරාංක හඳුන්වනයක් හෝ වෙනත් පෞද්ගලික දත්ත හෝ දත්ත දායකයකු වෙත යම් මූල්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද කාඩ්පතක් හෝ

ගෙවීම් උපකරණයක් හෝ මූල්‍ය ආයතනයක් සහ දත්ත දායකයකු අතර ඇති සම්බන්ධතාවයට අදාළ යම් පෞද්ගලික දත්ත, දත්ත දායකයකුට අදාළ මූල්‍ය තත්ත්වය සහ ණය ඉතිහාසය අදහස් වන අතර, පාරිශ්‍රමිකවලට අදාළ දත්ත ද ඊට ඇතුළත් වේ;

"ජානමය දත්ත" යන්නෙන්, යම් ස්වාභාවික තැනැත්තකුගේ ජෛව සාම්පලයක හෝ සිරුරේ යම් තරලයක විශ්ලේෂණයක ප්‍රතිඵල වශයෙන් ලබා ගන්නා එම ස්වාභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක හෝ සෞඛ්‍යය පිළිබඳ අනන්‍ය වූ තොරතුරු ලබා දෙන්නා වූ යම් ස්වාභාවික තැනැත්තකුගේ ජානමය ලක්ෂණවලට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඊට එකී යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ, සිදු කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 හෝ 45 වන ව්‍යවස්ථා යටතේ පෞද්ගලික දත්ත ආරක්ෂණය යන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පෞද්ගලික දත්ත" යන්නෙන්-

(අ) යම් නාමයක්, හඳුනාගැනීමේ අංකයක්, මූල්‍ය දත්තයක්, ස්ථානීය දත්තයක් හෝ යම් මාර්ගගත හඳුන්වනයක් වැනි යම් හඳුන්වනයක්; හෝ

(ආ) එම පුද්ගලයාගේ හෝ ස්වභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක, කායික, ජානමය, මානසික, ආර්ථික, සංස්කෘතික හෝ සමාජයීය අනන්‍යතාවයට විශේෂිත වූ සාධක එකක් හෝ වැඩි ප්‍රමාණයක්,

ආශ්‍රයෙන්, ඍජුව හෝ අන්‍යාකාරයෙන් යම් දත්ත දායකයකු හඳුනාගත හැකි යම් තොරතුරක් අදහස් වේ;

"පෞද්ගලික දත්ත කඩ කිරීම" යන්නෙන්, සම්ප්‍රේෂණය කරන ලද, ගබඩා කරන ලද හෝ අන්‍යාකාරයකින් සකසන ලද පෞද්ගලික දත්ත, අහම්බෙන් හෝ නීති විරෝධී ලෙස විනාශ කිරීම, නැති වීම, වෙනස් කිරීම, අනවසරයෙන් අනාවරණය කිරීම හෝ අනවසරයෙන් එම දත්තවලට ප්‍රවේශ වීම සිදු කෙරෙන යම් ක්‍රියාවක් කිරීමක් හෝ නොකර හැරීමක් අදහස් වේ;

"වාර්ගික හෝ ජනවාර්ගික සම්භවය පිළිබඳ හෙළිකරන පෞද්ගලික දත්ත" යන්නෙන්, යම් ස්වභාවික තැනැත්තකුගේ ජාතිය හෝ ජනවාර්ගිකත්වය නිරූපණය විය හැකි හෝ ඊට අදාළ විය හැකි, ඡායාරූප ද ඇතුළත්, යම් පෞද්ගලික දත්ත අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"දත්ත සැකසීම" යන්නෙන්, පෞද්ගලික දත්ත එකතු කිරීම, ගබඩා කිරීම, සුරක්ෂිත කිරීම, වෙනස් කිරීම, නැවත ලබා ගැනීම, හෙළි කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ලබා ගැනීමට සැලැස්වීම, මැකීම, විනාශ කිරීම, විමසීම, පෙළ ගැස්වීම, සංයුක්ත කිරීම හෝ ඒවා පිළිබඳව තාර්කික හෝ අංක ගණිතමය මෙහෙයුම් සිදු කිරීම ඇතුළත් වන නමුත් ඒවාටම පමණක් සීමා නොවන පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කරනු ලබන යම් මෙහෙයුමක් අදහස් වේ;

"දත්ත සකසන්නා" යන්නෙන්, පාලකවරයා වෙනුවට පෞද්ගලික දත්ත සැකසීම සිදුකරන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, රාජ්‍ය ආයතනයක් හෝ ලිඛිත නීතියක් මගින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් ආයතනයක් අදහස් වේ;

සැක දුරු කිරීම සඳහා දත්ත සකසන්නකු, පාලකවරයාගෙන් වෙන් වූ අස්ථිත්වයන් හෝ තැනැත්තකු විය යුතු සහ පාලකවරයාගේ යම් ධුරාවලි පාලනයකට යටත් තැනැත්තකු නොවිය යුතු අතර, එයට එක් අංශයක් විසින් තවත් අංශයක් වෙනුවෙන් දත්ත සැකසීම හෝ යම් සේවා නියුක්තයකු විසින් ඔවුන්ගේ සේව්‍යයා වෙනුවෙන් දත්ත සැකසීම වැනි වූ අභ්‍යන්තරව සිදු කෙරෙන දත්ත සැකසීම ඇතුළත් නොවේ;

නිදර්ශනය "ඒ" නමැති රෝහලක් විසින් එහි රෝගීන්ගේ වාර්තා පිළිබඳ විශ්ලේෂණ කළමනාකරණය කිරීම සඳහා සේවා නියුක්තිකයකු වශයෙන් දත්ත විද්‍යාඥවරයකු සේවයේ නියුක්ත කරයි. රෝහලේ රෝගීන්ගේ වාර්තා "බී" නමැති සමාගම මගින් සත්කාරකත්වය දරනු ලබන, තෙවන පාර්ශ්වයේ දේශීය දත්ත ගබඩා කරන වේදිකාවක තැන්පත් කිරීමට රෝහල තීරණය කර ඇත. "ඒ" නමැති රෝහල යනු පාලකවරයා ය. "බී" නමැති සමාගම යනු රෝගීන්ගේ වාර්තා කළමනාකරණය සම්බන්ධයෙන් වන දත්ත සකසන්නා ය. රෝහලේ දත්ත විද්‍යාඥවරයා යනු පාලකවරයාගේ සේවා නියුක්තිකයකු පමණක් වන අතර දත්ත සකසන්නකු නොවන්නේ ය;

"පුද්ගල පැතිකඩ දැක්වීම" යන්නෙන්, දත්ත දායකයකුගේ රැකියාවේ කාර්ය සාධනය, ආර්ථික තත්ත්වය, සෞඛ්‍යය, පෞද්ගලික මනාපයන්, සම්බන්ධතාවයන්, විශ්වසනීයත්වය, හැසිරීම, ගති පැවතුම්, සිටින ස්ථානය හෝ චලනයන් සැලකිල්ලට ගෙන ඇගයීම, විශ්ලේෂණය කිරීම හෝ අනාවැකි පළ කිරීම සඳහා සිදුකරන පෞද්ගලික දත්ත සැකසීම අදහස් වේ;

"ව්‍යාජ නාමකරණය" යන්නෙන්, යම් දත්ත දායකයකු හඳුනා ගැනීම සඳහා, අතිරේක තොරතුරු භාවිතයෙන් තොරව යම් පෞද්ගලික දත්තයන් භාවිත කළ නොහැකි වන සහ එම අතිරේක තොරතුරු වෙන්ව තබා සහ එම පෞද්ගලික දත්ත යම් දත්ත දායකයකු වෙත ආරෝපණය නොවන බවට තහවුරු කිරීම සඳහා තාක්ෂණික සහ සංවිධානාත්මක පියවරවලට යටත් වන යම් ආකාරයකින් එම පෞද්ගලික දත්ත සැකසීම අදහස් වේ;

"පොදු අධිකාරය" යන්නෙන්, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ යම් ලිඛිත නීතියක් මගින් පිහිටුවන ලද යම් ආයතනයක් හෝ පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ නිර්ණය කරන ලද අමාත්‍යාංශයක්, යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක් අදහස් වේ;

"අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන්නෙන්, මේ පනතේ 26 වන, 27 වන සහ 38 වන වගන්තිවල කාර්ය සඳහා අධීක්ෂණ කර්තව්‍ය ඉටුකරනු ලබන අමාත්‍යාංශයක් ඇතුළුව යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද, පාලකවරයා නියාමනය කරන, පාලකවරයා වෙත බලය ලබා දෙන හෝ පාලකවරයා අධීක්ෂණය කරන නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් අදහස් වේ;

"ප්‍රතිග්‍රාහකයා" යන්නෙන්, පෞද්ගලික දත්ත අනාවරණය වන්නා වූ ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, පොදු අධිකාරයක් හෝ යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොකළ මණ්ඩලයක් අදහස් වේ;

"පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද" යන්නෙන්, වාර්ගික හෝ ජනවාර්ගික සම්භවය, දේශපාලනික මත, ආගමික හෝ දාර්ශනික විශ්වාස හෙළිකරන පෞද්ගලික දත්ත, යම් ස්වභාවික තැනැත්තකු අනන්‍ය ලෙස හඳුනා ගැනීමේ කාර්යය සඳහා සකස් කරන ජානමය, ජෛවමිතික දත්ත, සෞඛ්‍යය සම්බන්ධ දත්ත හෝ යම් ස්වාභාවික තැනැත්තකුගේ ලිංගික ජීවිතය හෝ ලිංගික හැඩගැස්ම සම්බන්ධ දත්ත, වැරදි, අපරාධ නඩු කටයුතු සහ වරදකරු කරනු ලැබීම් සම්බන්ධ පෞද්ගලික දත්ත සහ ළමයකුට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"ශ්‍රී ලංකාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ දේශ සීමාවන් අදහස් වන අතර, එයට, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය හෝ ගුවන් අවකාශය, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යම් නෞකාවක් හෝ ගුවන් යානාවක්, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයක හෝ එවැනි කාර්යාලයක ප්‍රධානියාගේ, දූත මණ්ඩල ප්‍රධානීගේ නියෝජිතගේ හෝ එම දූත මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුගේ නිවස පිහිටි ස්ථානය අයත් පරිශ්‍රයක් හෝ ශ්‍රී ලංකා රජයේ හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක පාලනයට හෝ නතු කරගැනීමකට යටත්, යම් පරිශ්‍රයක් ඇතුළත් වේ;

"තෙවන රට" යන්නෙන්, දේශසීමා හරහා දත්ත සංචලනය සඳහා 26 වන වගන්තියෙන් නියම කරනු ලබන රටක් අදහස් වේ;

"තෙවන පාර්ශ්වය" යන්නෙන්, පෞද්ගලික දත්ත සැකසීම සඳහා බලය ලබා දෙනු ලැබූ දත්ත දායකයා, පාලකවරයා, දත්ත සකසන්නා සහ පාලකවරයාගේ හෝ දත්ත සකසන්නාගේ ඍජු අධිකාරි බලය යටතේ වන තැනැත්තන් නොවන ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, රාජ්‍ය ආයතනයක්, නියෝජිත මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වේ.

"ලිඛිත" යන්නට අතින් හෝ විද්‍යුත් ආකාරයෙන් ලියන ලද ලේඛනයක් ඇතුළත් වේ.

57. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(5(අ) වන වගන්තිය)

I වන උපලේඛනය

## නීත්‍යනුකූල දත්ත සැකසීම සඳහා වන කොන්දේසි

(අ) දත්ත දායකයා විසින් ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත ලබා දී ඇත; හෝ

(ආ) දත්ත දායකයා පාර්ශ්වයක් වන ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ගිවිසුමකට එළඹීමට පෙරාතුව දත්ත දායකයාගේ ඉල්ලීම මත අවශ්‍ය පියවර ගැනීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ පාලකවරයා හෝ දත්ත සකසන්නා යටත් වන්නා වූ නෛතික වගකීමකට අනුකූල වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඈ) දත්ත දායකයාගේ හෝ වෙනත් ස්වභාවික තැනැත්තකුගේ ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් වන හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඉ) මහජන සුබසිද්ධිය උදෙසා සිදු කරනු ලබන යම් කාර්යයක් ඉටු කිරීම සඳහා හෝ යම් චක්‍රලේඛයක්, මග පෙන්වීමක් හෝ රජය මගින් නිකුත් කළ සංග්‍රහයක් මගින් හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ පාලකවරයා වෙත පවරා දී හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ දී දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඊ) විශේෂයෙන් ම දත්ත දායකයා ළමයකු වන අවස්ථාවක දී, පෞද්ගලික දත්ත සුරක්ෂිත කිරීම අවශ්‍ය වන, දත්ත දායකයාගේ අපේක්ෂාව මගින් පාලකවරයාගේ අපේක්ෂාවන් බලහීන කරන අවස්ථාවන්හි දී හැර, පාලකවරයා විසින් හෝ තුන්වන පාර්ශ්වයක් විසින් අනුගමනය කරනු ලබන නීත්‍යනුකූල අපේක්ෂාවන් පිළිබඳ කාර්ය සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ;

(උ) මේ උපලේඛනයේ (ඉ) අයිතමයේ කාර්යය සඳහා "මහජන සුබසිද්ධිය" යන්නට-

(i) මහජන සෞඛ්‍ය වැනි සෞඛ්‍ය අරමුණු සහ සමාජ ආරක්ෂණය සඳහා සහ සෞඛ්‍ය සත්කාර සේවා කළමනාකරණය සඳහා පෞද්ගලික දත්ත සැකසීම;

(ii) බෝවන රෝග පාලනය කිරීම සහ සෞඛ්‍යයට ඇති වෙනත් බරපතළ තර්ජන සඳහා පෞද්ගලික දත්ත සැකසීම;

(iv) නීතිය මගින් නියම කර ඇති අරමුණු සපුරා ගැනීම සඳහා රාජ්‍ය අධිකාරීන් විසින් පෞද්ගලික දත්ත සැකසීම,

ඇතුළත් වේ.

(ඖ) මේ උපලේඛනයේ (ඊ) අයිතමයේ කාර්යය සඳහා "නීත්‍යානුකූල අපේක්ෂාව" යන්නට-

(i) දත්ත දායකයා සේවාදායකයකු වන අවස්ථාවක දී හෝ පාලකවරයාගේ සේවයේ සිටින අවස්ථාවක දී දත්ත සැකසීම;

(ii) පෞද්ගලික දත්ත එකතු කරනුයේ යම් කාර්යයක් සඳහා ද සහ යම් කාලසීමාවක දී ද එම කාර්යය සඳහා දත්ත සැකසීම සිදුවිය හැකි බවට දත්ත දායකයා සාධාරණව අපේක්ෂා කරනු ලැබීම;

(iii) වංචා වැළැක්වීම් කාර්ය සඳහා නිශ්චිතව අවශ්‍ය වන පෞද්ගලික දත්ත සැකසීම;

(iv) තොරතුරු ජාල සහ තොරතුරුවල සුරක්ෂිතතාව තහවුරු කිරීමේ කාර්යය සඳහා නිශ්චිතව අවශ්‍ය වන සහ අනුකූලවන ප්‍රමාණයට පෞද්ගලික දත්ත සැකසීම,

ඇතුළත් වේ.

(5 (ආ) වන වගන්තිය)

II වන උපලේඛනය

## පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද වල සැකසීම සඳහා වන කොන්දේසි

(අ) අදාළ දත්ත දායකයාගේ කැමැත්ත කුමක් වුව ද, යම් පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද වල සැකසීම වෙනත් යම් ලිඛිත නීතියකින් තහනම් කරනු ලබන්නේ නම් මිස, දත්ත සැකසීමේ අවස්ථාවේ දී පාලකවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාර්ය එකක් හෝ වැඩි ගණනක් සඳහා එකී දත්ත සැකසීමට දත්ත දායකයා විසින් කැමැත්ත ලබා දී ඇත. ළමයකු සම්බන්ධයෙන් වන විට, කැමැත්ත යන්නෙන් එම ළමයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකුගේ හෝ එම ළමයාගේ නෛතික භාරකරුගේ කැමැත්ත අදහස් විය යුතු ය; හෝ

(ආ) විශ්‍රාම වැටුප් ඇතුළුව සේවා නියුක්තිය, සමාජ සුරක්ෂිතභාවය පිළිබඳ ක්ෂේත්‍රවල දී, පාලකවරයාගේ වගකීම ඉටු කිරීමේ සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් සඳහා උචිත ආරක්ෂණයන් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වන යම් ලිඛිත නීතියක විධිවිධාන සලස්වනු ලබන තාක් දුරට මහජන ආරක්ෂක, ළඟාවිය හැකි වෙනත් හදිසි අවස්ථාවලට අදාළ පොදු අනතුරු අඟවන පද්ධති හා අධීක්ෂණය, බෝවන රෝග සහ මහජන සෞඛ්‍යය කෙරෙහි ඇති වෙනත් බරපතල තර්ජන වැළැක්වීම හෝ පාලනය කිරීම සහ මහජන සෞඛ්‍යය ආරක්ෂණ සේවා කළමනාකරණය වැනි මහජන සෞඛ්‍ය අරමුණු සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඇ) දත්ත දායකයාට සිය කැමැත්ත ලබා දීම සඳහා ශාරීරිකව හෝ නෛතිකමය වශයෙන් නොහැකියාවක් පවතින අවස්ථාවක දී, දත්ත දායකයාගේ හෝ වෙනත් ස්වාභාවික තැනැත්තකුගේ ජීවිතයකට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් වන හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඈ) දත්ත සැකසීම, දත්ත දායකයා විසින් පැහැදිලි ලෙසම ප්‍රසිද්ධ කර ඇති පෞද්ගලික දත්තවලට අදාළවන විට; හෝ

(ඉ) යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් හෝ යම් සමාන විනිශ්චය සභාවක් ඉදිරියේ හෝ අධිකරණයන් විසින් ඒවායෙහි අධිකරණ බලය තුළ කටයුතු කරන කවර හෝ අවස්ථාවක දී නෛතික හිමිකම්පෑම් ස්ථාපනය කිරීම, ක්‍රියාවට නැංවීම හෝ ආරක්ෂාව සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඊ) දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සුදුසු සහ විශේෂිත පියවර සපයන අතරතුර දී අනුග මනය කරනු ලබන ඉලක්කය සඳහා අවශ්‍ය විය යුතු සහ ඊට සමානුපාතික විය යුතු, යම් ලිඛිත නීතියක හෝ I වන උපලේඛනයේ (උ) වන අයිතමය යටතේ නිශ්චය කර ඇති පරිදි මහජන යහපත සඳහා විධිවිධාන සලස්වා ඇති පරිදි යම් කාර්යයක් සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(උ) නිවාරණ හෝ වෘත්තිය වෛද්‍ය විද්‍යාවන්හි කාර්ය සඳහා, රෝග විනිශ්චය සත්කාර හෝ ප්‍රතිකාර සිදු කිරීම හෝ සෞඛ්‍ය සේවා කළමනාකරණය සඳහා සහ ශ්‍රී ලංකාවේ බලාත්මක වන යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍ර ලබා දෙනු ලැබූ හෝ බලය ලබා දෙනු ලැබූ සෞඛ්‍ය වෘත්තිකයකු විසින් එකී දත්ත සකසනු ලැබූ අවස්ථාවක දී දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඖ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක දැක්වෙන දත්ත ආරක්ෂණ අයිතිවාසිකම් ආරක්ෂා කරන සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂණය සම්බන්ධයෙන් සුදුසු සහ විශේෂිත පියවර සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇති නීති සමඟ අනුකූලව සහ එහි අනුගමනය කරන අරමුණු වලට සමානුපාතික වන ලෙසට සිදු කරන පොදු යහපත වෙනුවෙන් වන ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ හෝ ඓතිහාසික පර්යේෂණ අරමුණු හෝ සංඛ්‍යානමය අරමුණු සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට.

(5 (ඇ) වන වගන්තිය)

III වන උපලේඛනය

## දත්ත දායකයාගේ කැමැත්ත සඳහා කොන්දේසි

(අ) දත්ත දායකයා ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත ලබා දී ඇති බව පෙන්වීමට පාලකවරයාට හැකි විය යුතු ය;

(ආ) දත්ත දායකයාගේ කැමැත්ත ලබා දී ඇත්තේ වෙනත් කාරණා සම්බන්ධයෙන් ද සලකා බැලෙන යම් ලිඛිත ප්‍රකාශයක සන්දර්භය තුළ නම්, කැමැත්ත සඳහා වන ඉල්ලීම වෙනත් කාරණාවලින් පැහැදිලිවම වෙන් කොට හඳුනාගත හැකි ආකාරයකින්, අවබෝධ කර ගත හැකි සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘතියකින් පැහැදිලි සහ සරල භාෂාවක් භාවිත කරමින්ල ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, එවැනි ප්‍රකාශයක මේ පනතේ යම් විධිවිධාන උල්ලංඝණය කිරීමක් සංයුක්ත නොවිය යුතු ය.

(ඈ) කැමැත්ත නිදහසේ ලබා දී ඇත්තේ ද යන්න තක්සේරු කිරීමේ දී, අනෙකුත් දේ අතර, යම් සේවාවක් සැපයීම ඇතුළුව යම් ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම, එම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නොවන පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත සම්බන්ධයෙන් කොන්දේසි සහිත වන්නේ ද යන්න පිළිබඳ විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය; සහ

(ඈ) කැමැත්ත ලබාදීමට පෙර, මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් අවස්ථාවක එම කැමැත්ත ඉල්ලා අස්කරගනු ලැබිය හැකි බව දත්ත දායකයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5 (ඈ) වන වගන්තිය)

IV වන උපලේඛනය

## අපරාධ විමර්ශන සඳහා පෞද්ගලික දත්ත සැකසීම

(අ) වැරදි පිළිබඳ නීත්‍යානුකූල විමර්ශන හෝ අදාළ ආරක්ෂක පියවරවලට අදාළ පෞද්ගලික දත්ත සැකසීම, දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා උචිත ආරක්ෂණ විධිවිධාන සලස්වන අතරතුර දී, අදාළ ලිඛිත නීතිවලට අනුකූලව පමණක් සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) සැක දුරු කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන විධිවිධානවලට අනුව විමර්ශන සිදු කරනු ලබන්නේ නම්, මේ උපලේඛනය යටතේ පෞද්ගලික දත්ත සැකසීම නීත්‍යානුකූල වන ලෙස සලකනු ලැබිය හැකි ය; සහ

(ඇ) මේ උපලේඛනය යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා උචිත ආරක්ෂණයන් සැපයීම සඳහා කොන්දේසි නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය.

(11 වන සහ 13 වන වගන්ති)

V වන උපලේඛනය

## පෞද්ගලික දත්ත එකතු කරගැනීම

1. යම් දත්ත දායකයකුට අදාළ පෞද්ගලික දත්ත එම දත්ත දායකයාගෙන් එකතු කර ගනු ලබන අවස්ථාවක, එකී පෞද්ගලික දත්ත එකතු කරගන්නා අවස්ථාවේ දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත පහත දැක්වෙන තොරතුරු සැපයිය යුතු ය:-

(අ) පාලකවරයාගේ සහ අදාළ වන අවස්ථාවල දී පාලකවරයාගේ නියෝජිතයාගේ අනන්‍යතාවය සහ සම්බන්ධකර ගත හැකි විස්තර;

(ආ) අදාළ වන අවස්ථාවල දී දත්ත ආරක්ෂණ නිලධරයාගේ සම්බන්ධ කර ගත හැකි විස්තර;

(ඇ) පෞද්ගලික දත්ත සැකසීමට අදහස් කරනු ලබන්නේ කුමන කාර්යයක් සඳහා ද යන්න සහ දත්ත සැකසීම සඳහා වන නෛතික පදනම;

(ඈ) දත්ත සැකසීම 1 වන උපලේඛනයේ (ඊ) අයිතමය මත පදනම් වන අවස්ථාවක දී පාලකවරයා විසින් හෝ තුන්වන පාර්ශ්වයන් විසින් අනුගමනය කරනු ලබන නීත්‍යානුකූල අපේක්ෂාව;

(ඉ) එකතු කරනු ලබන පෞද්ගලික දත්තවල ප්‍රභේද;

(ඊ) I වන උපලේඛනයේ (අ) අයිතමය සහ II වන උපලේඛනයේ (අ) අයිතමය අනුව ලබාගත් කැමැත්ත මත පදනම්ව දත්ත සැකසීම සිදු කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, දත්ත දායකයකුට ඔහුගේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට අයිතිවාසිකමක් තිබීම සහ එය ඉල්ලා අස්කර ගැනීමට පෙර, කැමැත්ත මත පදනම් වූ දත්ත සැකසීමේ නීත්‍යානුකූලභාවයට බලපෑමක් ඇති නොවන පරිදි එවැනි ඉල්ලා අස්කර ගැනීමක් සඳහා වන කාර්ය පටිපාටිය;

(උ) අදාළ වන්නේ නම්, එම පෞද්ගලික දත්ත බෙදා ගනු ලබන්නේ කවර ප්‍රතිග්‍රාහකයන් හෝ තුන්වන පාර්ශ්වයක් සමග ද එම ප්‍රතිග්‍රාහකයන් හෝ තුන්වන පාර්ශ්වයන්වල විස්තර;

(ඌ) අදාළ වන්නේ නම්, පාලකවරයා විසින් සිදු කරනු ලැබීමට අදහස් කරන යම් පෞද්ගලික දත්ත දේශසීමා හරහා සංචලනයකට අදාළ තොරතුරු;

(එ) 9 වන වගන්තිය ප්‍රකාර පෞද්ගලික දත්ත රඳවා තබා ගනු ලැබිය යුතු කාල සීමාව හෝ එම කාලසීමාව නොදන්නා අවස්ථාවල දී එම කාලසීමාව නිශ්චය කිරීම සඳහා වන නිර්ණායක;

(ඒ) II වන කොටසේ සඳහන් කරන ලද දත්ත දායකයාගේ අයිතිවාසිකම් හි පැවැත්ම සහ ඒවා ක්‍රියාවට නැංවීම සඳහා වන කාර්ය පටිපාටිය;

(ඔ) අධිකාරිය වෙත පැමිණිලි ගොනු කිරීමට අයිතිවාසිකමක් පැවතීම;

(ඕ) දත්ත දායකයකු විසින් පෞද්ගලික දත්ත ලබාදීම ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම් ප්‍රකාර අවශ්‍යතාවක් ද, එය යම් ගිවිසුමකට එළඹීම සඳහා අවශ්‍ය අවශ්‍යතාවක් ද යන්න මෙන්ම, දත්ත දායකයා පෞද්ගලික දත්ත ලබා දීමට බැඳී සිටින්නේ ද සහ දත්ත දායකයාට එම දත්ත ලබා දීමට අපොහොසත් වීමෙන් ප්‍රතිවිපාක ඇතිවීමට හැකියාවක් තිබේ ද යන්න; හෝ

(ක) පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව 18 වන වගන්තියේ දක්වා ඇති, ස්වයංක්‍රීය තීරණ ගැනීමක පැවැත්ම සහ යටත් පිරිසෙයින් එම අවස්ථාවන්හි දී යොදාගෙන ඇති තර්කානුකූලභාවය පිළිබඳ සාධාරණ ලෙස අර්ථවත් තොරතුරු මෙන්ම දත්ත දායකයකු සඳහා එවැනි දත්ත සැකසීමක වැදගත්කම සහ අපේක්ෂිත ප්‍රතිඵල.

2. පෞද්ගලික දත්ත මූලිකවම එකතු කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද එම කාර්යය නොවන යම් කාර්යයක් සඳහා එම පෞද්ගලික දත්ත වැඩිදුරටත් සැකසීමට පාලකවරයා අදහස් කරන අවස්ථාවක දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත මේ උපලේඛනයේ 1 වන අයිතමයේ සපයා ඇති ආකාරයෙන් වැඩිදුර සැකසීම පිළිබඳ සහ එකී කාර්යය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සැපයිය යුතු ය.

3. දත්ත දායකයා දැනටමත් තොරතුරු ලබා ගෙන ඇති හෝ එම තොරතුරු පිළිබඳව දැනුවත්ව ඇති අවස්ථාවක දී මේ උපලේඛනයේ 1 වන සහ 2 වන අයිතම අදාළ නොවිය යුතු ය.

4. දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත, දත්ත දායකයා ඍජුවම සම්බන්ධ කර ගැනීමකින් තොරව ලබා ගෙන ඇති අවස්ථාවක දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත, මේ උපලේඛනයේ 1 වන අයිතමය යටතේ නියම කර ඇති තොරතුරු වලට අමතරව, අදාළ අවස්ථාවලදී, පෞද්ගලික දත්ත ලබා ගන්නා ලද ප්‍රභවය සහ එම දත්ත ලබාගත්තේ පොදුවේ ප්‍රවේශ විය හැකි ප්‍රභවයකින් ද නැති ද යන්න පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.

5. දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත, දත්ත දායකයා ඍජුවම සම්බන්ධ කර ගැනීමකින් තොරව ලබා ගෙන ඇති අවස්ථාවක දී, පාලකවරයා විසින්-

(අ) පෞද්ගලික දත්ත ලබාගැනීමෙන් පසුව සාධාරණ කාලසීමාවක් ඇතුළත, එහෙත් යටත් පිරිසෙයින් එක් මසක් ඇතුළත, පෞද්ගලික දත්ත සකසනු ලබන විශේෂිත අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්;

(ආ) පෞද්ගලික දත්ත, දත්ත දායකයා සමඟ සන්නිවේදනය කිරීම සඳහා භාවිත කරනු ලැබිය යුතු වන්නේ නම්, යටත් පිරිසෙයින් එම දත්ත දායකයාට පළමු සන්නිවේදනය සිදු කරන අවස්ථාවේ දී; හෝ

(ඇ) වෙනත් ප්‍රතිග්‍රාහකයකු වෙත හෙළි කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, යටත් පිරිසෙයින් පෞද්ගලික දත්ත පළමුවරට හෙළි කරනු ලබන අවස්ථාවේ දී,

මේ උපලේඛනයේ 1 වන සහ 4 වන අයිතම යටතේ වන තොරතුරු සැපයිය යුතු ය.

6. මේ උපලේඛනයේ 1 සිට 4 දක්වා වන අයිතම පහත දැක්වෙන අවස්ථාවල දී අදාළ නොවිය යුතු යː-

(අ) තොරතුරු දැනටමත් දත්ත දායකයා වෙත සපයා දී ඇති බවට පාලකවරයා විසින් ඔප්පු කරන අවස්ථාවක දී; හෝ

(ආ) විශේෂයෙන්ම මේ පනතේ සපයන ලද කොන්දේසි සහ ආරක්ෂණයන්ට යටත්ව, යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයකින් මහජන සුබසිද්ධිය පිණිස ලේඛනාරක්ෂක අරමුණු සඳහා විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය පර්යේෂණ සඳහා දත්ත සැකසීම කළ නොහැකි බව හෝ සමානුපාතික නොවන උත්සාහයක් විය හැකි බව ඔප්පු කරන අවස්ථාවක දී හෝ මේ උපලේඛනයේ 1 වන අයිතමයේ සඳහන් වගකීම් එම දත්ත සැකසීමේ අරමුණු සාක්ෂාත් කරගැනීම කෙරෙහි ඉඩදිය නොහැකි හෝ බලවත් හානියක් සිදුවන තාක් දුරට ඒ අවස්ථාවල දී පාලකවරයා විසින් තොරතුරු මහජනතාවට ලබා ගැනීමට සැලැස්වීම ඇතුළුව යම් ලිඛිත නීතියක් යටතේ සහතික කරන ලද දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර ගත යුතු ය; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන සහ එවැනි ලිඛිත නීතියක් යටතේ ආරක්ෂා කරන ලද දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර සපයන්නා වූ සහ පාලකවරයා යටත් වන්නා වූ යම් ලිඛිත නීතියක් මගින් ලබා ගැනීම හෝ අනාවරණය කිරීම ප්‍රකාශිතවම දක්වා ඇති අවස්ථාවක දී; සහ

(ඈ) රහසිගතභාවය පිළිබඳ ව්‍යවස්ථාපිත වගකීමක් ඇතුළු ව පෞද්ගලික දත්ත, වෘත්තීයමය වරප්‍රසාද පිළිබඳ වගකීම්වලට අනුගාමීව, රහස්‍යව තිබිය යුතු හෝ යම් ලිඛිත නීතියක් යටතේ හෙළි කරනු ලැබීමට අවසර නොදෙනු ලබන අවස්ථාවක දී.

(29 (5) වන වගන්තිය)

## VI වන උපලේඛනය

1. සභාපතිවරයා හැර මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු යː

එසේ වුව ද, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය හිස් කරන ලද සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

2. (1) අධිකාරියේ යම් සාමාජිකයකුට, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

(2) යම් සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 29 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා හැර මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මගින් මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 29 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එකී කාලසීමාව සඳහා ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කලින් අවසර ලබා ගැනීමෙන් තොරව, මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණෙන මණ්ඩලයේ යම් සාමාජිකයකු ස්වකීය ධුරය අත්හැර ගියාක් සේ සලකනු ලැබිය යුතු ය.

3. (1) යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) සිහිවිකල තැනැත්තකු හෝ ස්වකීය කාර්ය කරගෙනයාමට නොහැකි තැනැත්තකු වන්නේ නම් හෝ එසේ වුවහොත්ත

(ඇ) නිදහස් කරනු නොලැබූ බංකොලොත් වූවකු වන්නේ නම් හෝ එසේ පත් වී ඇත්නම්;

(ඈ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු වන්නේ නම් හෝ වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඉ) කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්;

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු-

(අ) ස්වකීය කාර්යයන්ට අදාළව බරපතල විෂමාචාරයකට වරදකරු වන්නේ නම්;

(ආ) ස්වකීය ධුරය අඛණ්ඩව කරගෙන යාම අධිකාරියේ යහපතට හානියක් වන පරිදි ස්වකීය තනතුර අයුතු ලෙස භාවිත කරන්නේ නම්;

(ඇ) 3 වන අයිතමයේ (1) වන ඡේදය යටතේ නුසුදුස්සකු වන්නේ නම්; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්,

අමාත්‍යවරයා විසින් ඔහු සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කරගෙන යාමෙන් ඉවත් කළ යුතු ය.

4. මණ්ඩලය විසින් යම් කාරණාවක් සම්බන්ධයෙන් ගනු ලැබිය යුතු යම් තීරණයකට ඍජුව හෝ වක්‍රව සම්බන්ධතාවක් දක්වන සාමාජිකයන් විසින්, එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ එම තීරණය ගනු ලබන රැස්වීමේ දී අනාවරණය කරනු ලැබිය යුතු අතර, එකී අනාවරණය කිරීම මණ්ඩලයේ රැස්වීම් සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද, එකී සාමාජිකයා එම කාරණයට අදාළව මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු අතර, එවැනි සාකච්ඡාවක් සිදු කෙරෙමින් පවතින හෝ එවැනි තීරණයක් ගනිමින් පවතින අතරතුර දී යම් රැස්වීමකින් ඔහු ඉවත් විය යුතු ය.

5. මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා යම් ආකාරයකට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ඔවුන්ගේ කර්තව්‍ය සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

6. (1) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සභාපතිවරයා ඇතුළුව සාමාජිකයන්ගෙන් තිදෙනෙක් විය යුතු ය.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක්-

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ, ඊට සහභාගී වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි සහ ඒ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම සභාපතිවරයා විසින් මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් මණ්ඩලයේ එම රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීම්, කලින් කලට එය විසින් සාදනු ලබන රීති සහ පිහිටුවනු ලබන කාර්ය පටිපාටිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

7. මණ්ඩලයේ කිසිදු කටයුත්තක්, ක්‍රියාවක් හෝ තීරණයක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය.

8. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ එක් සාමාජිකයකු සහ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා නොපැමිණෙන අවස්ථාවක දී මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම නම අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

## 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]

**(139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ දීර්ඝ නාමය එහි "සේවයේ යෙදී සිටිය දී තුවාල ලැබූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර තුවාල ලැබූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි "අසම්පූර්ණ අබලතාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""නේවාසික ස්ථානය" යන්නට කම්කරුවකුගේ යම් ස්ථිර නේවාසික ස්ථානයක් හෝ සේවා ස්ථානය වෙත පැමිණීමේ කාර්යය සඳහා යම් කම්කරුවකු තාවකාලිකව වාසය කරන නවාතැන්පොළක් හෝ වෙනත් යම් ස්ථානයක් ඇතුළත් වේ;".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ තුවාලයක්" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ ද, නැතහොත් නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ අනතුරකින් සිදු වූ තුවාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

6අ. 6 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, ඒ නොතකා, ස්ථිර හෝ අසම්පූර්ණ අබලතාවක් සිදු වූ අවස්ථාවක, යම් තුවාලයක් සම්බන්ධයෙන් වන්දි මුදල ගණනය කිරීමේ දී කම්කරුවකුගේ රැකියාවේ ස්වභාවය සලකා බැලිය යුතු ය. එම වන්දිය, අදාළ වෛද්‍යවරයා විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය වාර්තාව මත පදනම් විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) දෛනික වැටුප් ලබන හෝ කෑලි පදනම මත වේතන ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, අනතුර සිදුවීමට පෙරාතුව ම එම කම්කරුවා සේවයේ යෙදී සිටි අවසාන මාස දොළහ සඳහා ලබාගත් දෛනික වැටුපෙන් හෝ කෑලි පදනම මත වේතනයෙන් ඉපැයූ මුදල් ප්‍රමාණය, දොළහෙන් බෙදා එය නැවත විසිපහෙන් බෙදා ලැබෙන එකතුව එම කම්කරුවාගේ මාසික වේතනය විය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "එකතුව රුපියල් දස දහසක් නොඉක්මවන මුදලක්" යන වචන වෙනුවට "එකතුව රුපියල් විසි දහසක් නොඉක්මවන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) 11 වන වගන්තිය යටතේ, මිය ගිය කම්කරුවකු සම්බන්ධයෙන් වන්දියක් ලෙස යම් මුදලක් තැන්පත් කිරීමේ දී, කොමසාරිස්වරයා විසින්, කම්කරුවාගේ අවමංගල්‍ය කෘත්‍යය වෙනුවෙන් සැබවින්ම වැය වූ මුදල් ලෙස රුපියල් ලක්ෂයක් නොඉක්මවන මුදලක්, එයින් අඩු කර ඒ වියදම දරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තා වෙත එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

(1අ) මිය ගිය කම්කරුවාගේ වන්දිය බෙදා දීම තීරණය කිරීම සඳහා, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක දී ඔහු ඉදිරියේ පෙනී සිටීම සඳහා ඉල්ලීමක් කරමින් කොමසාරිස්වරයා විසින් මිය ගිය කම්කරුවාගේ ශ්‍රී ලංකාවේ නේවාසික එක් එක් යැපෙන්නා වෙත දැන්වීමක් භාරදීමට කටයුතු සැලැස්විය යුතු ය. කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, කිසිදු යැපෙන්නකු නොසිටින බවට ඔහු සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එහි ශේෂ මුදල, වන්දිය ගෙවනු ලැබුවේ යම් සේවායෝජකයකු විසින් ද, එම සේවායෝජකයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය. එසේ වුව ද, 11 වන වගන්තිය යටතේ මුදල් තැන්පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලසීමාවක් ඉකුත්වන තෙක් එවැනි කිසිදු ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබිය යුතු ය. සේවායෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත, කොමසාරිස්වරයා විසින්, සිදු කරන ලද සියලු විය පැහැදම් පිළිබඳ එකඟතා ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "හදිසි අනතුර සිදුවී හෝ මරණයෙන් කෙළවර වී නම් මරණය සිදුවී හෝ අවුරුදු දෙකක් ගත වන්නට කලින්" යන වචන වෙනුවට "හදිසි අනතුර සිදුවී අවුරුදු දෙකක් ඇතුළත හෝ මරණයෙන් කෙළවර වී නම්, මරණය සිදුවී අවුරුදු දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(3) සෑම සේවායෝජකයකු විසින්ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දැන්වීම් පොතට අමතරව, යම් කර්මාන්ත ශාලාවක හෝ යම් සේවා ස්ථානයක සිදුවන යම් හදිසි අනතුරක් පිළිබඳ තොරතුරු සහ විස්තර ඇතුළත් කරනු ලබන වාර්තා පොතක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. තව ද, සේවායෝජකයා විසින් එම වාර්තා පොත භාරව කටයුතු කිරීම සඳහා වගකිවයුතු තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයාට එම වාර්තා පොත වෙත ප්‍රවේශ විය හැකි අතර, පරීක්ෂා කිරීම සඳහා එහි උධෘත හෝ පිටපත් ඔහු විසින් ඉල්ලා සිටිය හැකි ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටියදී" යන වචන වෙනුවට, "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(5) මිය ගිය කම්කරුවාගේ අවමංගල්‍ය වියදම වශයෙන් සේවායෝජකයා විසින් ගෙවිය යුතු රුපියල් පනස් දහසක් නොඉක්මවන මුදලක් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එම මුදල සේවායෝජකයා විසින් ගෙවිය යුතු වන්දියට අමතරව විය යුතු අතර, අදාළ සේවායෝජකයා විසින් කොමසාරිස්වරයාගේ හෝ එම කම්කරුවාගේ ළඟම ඥාතියාගේ ගිණුමේ තැන්පත් කරනු ලැබිය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

23අ. මේ පනත යටතේ, අවස්ථාවෝචිත පරිදි, කම්කරුවකුට හෝ ඔහුගේ උරුමකරුවන්ට වන්දියක් වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමට යටත් වන යම් සේවායෝජකයකු විසින්, නියමිත දිනයේ දී හෝ එදිනට පෙර එම මුදල ගෙවීමට අපොහොසත් වන විට හෝ ගෙවීම පැහැර හරින විට, ඔහු විසින් වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලට අමතරව එම මුදල මත පහත දැක්වෙන ආකාරයට ගණනය කරන ලද අධිභාරයක්, අවස්ථාවෝචිත පරිදි, එම කම්කරුවාට හෝ ඔහුගේ උරුමකරුවන්ට ගෙවීමට යටත් විය යුතු ය:-

(අ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට දහයක අධිභාරයක්;

(ආ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් ඉක්මවන එහෙත් මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට පහළොවක අධිභාරයක්;

(ඇ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විස්සක අධිභාරයක්;

(ඈ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස හයක් ඉක්මවන එහෙත් මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විසි පහක අධිභාරයක්; හෝ

(ඉ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස දොළහක් ඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක්.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

27අ. මේ පනතේ කාර්ය සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක්, එම උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අයකර ගත නොහැකි වේ නම්, ගෙවීම පැහැරහරින්නාගේ නිශ්චල දේපළ තහනමට ගැනීමෙන් හෝ විකිණීමෙන් එම මුදල අයකර ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය. 27අ වන වගන්තිය යටතේ පත්කරන ලද කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම පැහැරහරින්නා වාසය කරන අධිකරණ බල ප්‍රදේශයේ අදාළ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මඟින් එම නියමය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අධිකරණයක් විසින් නිකුත් කරන ලද රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී, පිස්කල් විසින් නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සහ ඔහු විසින් තහනමට ගන්නා ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ වන, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, මෙම වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද කොමසාරිස්වරයාගේ නියමයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් ද, එම මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා තහනමට ගන්නා ලද නිශ්චල දේපළ පිළිබඳ හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය. එම විධිවිධාන අදාළ කරගැනීමේ කාර්යය සඳහා, එසේ නිශ්චිතව දක්වා ඇති මුදල, අධිකරණය විසින් එළඹෙන ලද තීන්දු ප්‍රකාශයක් මත ලැබිය යුතු බවට සලකනු ලැබිය යුතු මෙන්ම, කොමසාරිස්වරයා විනිශ්චිත ණය හිමියා ලෙස සලකනු ලැබිය යුතු අතර, එම මුදල ගෙවීමට යටත් වන තැනැත්තා විනිශ්චිත ණයකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි "වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින්" යන වචන වෙනුවට "වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින් හෝ එකඟතා ගිවිසුම යටතේ කම්කරුවාට ගෙවිය යුතු වන්දි මුදල වැරදි ලෙස ගණනය කිරීමේ හෝ අඩුවෙන් තක්සේරු කිරීමේ හේතුවෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "රුපියල් සියයක වටිනාකමකින්" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක වටිනාකමකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය විසින්" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු ව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"I වන උපලේඛනය

(2 වන වගන්තිය)

ස්ථිර/අසම්පූර්ණ අබලතාවක් සිදුකෙරේ යැයි සලකනු ලබන තුවාල ලැයිස්තුව

| තුවාලය | ඉපැයීමේ හැකියාව නැතිවීමේ ප්‍රතිශතය |
|---|---|
| ස්ථිර වශයෙන් ම ඔත්පලවීමක් සිදුකෙරෙන, ස්ථිර වූ ද, අසාධ්‍ය වූ ද අවයව පක්ෂාඝාතය හෝ තුවාල | 100 |
| වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාව සිදුකෙරෙන, ස්ථිර, සුව කළ නොහැකි මානසික ශක්තිය නැතිවීම හෝ වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාවට හේතුවන වෙනත් යම් තුවාලයක් | 100 |
| ඇසේ තුවාල | |
| (i) ඇස් දෙකේ පෙනීම මුළුමනින් ම නැතිවීම | 100 |
| (ii) එක් ඇසක පෙනීම මුළුමනින් ම නැතිවීම | 80 |
| ශ්‍රවණ ආබාධ | |
| (i) ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 80 |
| (ii) එක් කණක ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම | 50 |
| කථනය නැතිවීම | |
| (i) කථනය මුළුමනින් ම නැතිවීම | 100 |
| ඉන්ද්‍රියයන් නැතිවීම | |
| (i) ගන්ධය හා රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (ii) ගන්ධය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| (iii) රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 60 |
| බාහුවේ තුවාල | |
| (i) වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම | 85 |
| (ii) වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම | 80 |
| අත්වල තුවාල | |
| (i) අත් දෙක ම නැතිවීම | 100 |
| (ii) අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම | 80 |
| (iii) මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම | 50 |
| (iv) මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම | 40 |
| (v) ඇඟිලි හතරක් නැතිවීම | 80 |
| දබරැඟිල්ල නැතිවීම | |
| (i) ඇඟිලි පුරුක් තුනක් | 50 |
| (ii) ඇඟිලි පුරුක් දෙකක් | 40 |
| (iii) එක් ඇඟිලි පුරුකක් | 20 |

| | | |
|---|---|---|
| මැදගිල්ල, වෙදගිල්ල සහ සුළැඟිල්ල නැති වීම | | |
| (i) | ඇඟිලි පුරුක් තුනක් | 30 |
| (ii) | ඇඟිලි පුරුක් දෙකක් | 20 |
| (iii) | එක් ඇඟිලි පුරුකක් | 15 |
| කකුල නැතිවීම | | |
| (i) | දණහිසින් හෝ ඉන් ඉහළට | 90 |
| (ii) | දණහිසින් හෝ ඉන් පහළට | 80 |
| පාදවල තුවාල | | |
| (i) | දෙපා නැතිවීම | 100 |
| (ii) | එක් පාදයක් නැතිවීම | 90 |
| පා ඇඟිලි නැතිවීම | | |
| (i) | මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකම | 40 |
| (ii) | මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක් | 20 |
| (iii) | මාපට ඇඟිල්ල නොවන එකකට වැඩි ඇඟිලි ගණනක් නැතිවුවහොත්, එක් එක් ඇඟිල්ල සඳහා | 20 |
| විවිධ | | |
| (i) | ජනනේන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම | 75 |
| (ii) | ජනනේන්ද්‍රියක කොටසක් නැතිවීම | 60 |
| (iii) | මුහුණේ බරපතල කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම | 90 |
| (iv) | මුහුණේ කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම නොවන, බරපතල ලෙස ශරීරය විරූපී වීම - උපරිමය | 60 |
| (v) | එක් දතක් නැතිවීම | 10 |
| (vi) | වෛද්‍ය නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා- නාසය, ළපැත්ත, කණ ආදිය නැතිවීම) - උපරිමය.". | 60 |

27. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය මෙයින් ඉවත්කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"IV වන උපලේඛනය

(6 වන වගන්තිය)

ගෙවිය යුතු වන්දි මුදල

| තුවාල ලත් කම්කරුවාගේ මාසික වේතනය | | කම්කරුවාගේ මරණය | කම්කරුවාගේ ස්ථිර අබලතාව | කම්කරුවා තාවකාලිකව අබලතාවට පත්වීම වෙනුවෙන් වන්දි වශයෙන් අර්ධ මාසික ගෙවීම |
|---|---|---|---|---|
| රු. | රු. | රු. | රු. | රු. |
| 0 | 10,000 | 1,140,000 | 1,200,000 | 5,000 |
| 10,001 | 12,500 | 1,180,000 | 1,240,000 | 5,625 |
| 12,501 | 15,000 | 1,220,000 | 1,280,000 | 6,875 |
| 15,001 | 17,500 | 1,260,000 | 1,320,000 | 8,125 |
| 17,501 | 20,000 | 1,300,000 | 1,360,000 | 9,375 |
| 20,001 | 22,500 | 1,340,000 | 1,400,000 | 10,625 |
| 22,501 | 25,000 | 1,380,000 | 1,440,000 | 11,875 |
| 25,001 | 27,500 | 1,420,000 | 1,480,000 | 13,125 |
| 27,501 | 30,000 | 1,460,000 | 1,520,000 | 14,375 |
| 30,001 | 35,000 | 1,510,000 | 1,570,000 | 16,250 |
| 35,001 | 40,000 | 1,560,000 | 1,630,000 | 18,750 |
| 40,001 | 45,000 | 1,610,000 | 1,680,000 | 21,250 |
| 45,001 | 50,000 | 1,660,000 | 1,730,000 | 23,750 |
| 50,001 | 55,000 | 1,710,000 | 1,780,000 | 26,250 |
| 55,001 | 60,000 | 1,760,000 | 1,830,000 | 28,750 |
| 60,001 | 70,000 | 1,820,000 | 1,890,000 | 32,500 |
| 70,001 | 80,000 | 1,880,000 | 1,960,000 | 37,500 |
| 80,001 | 90,000 | 1,940,000 | 2,000,000 | 42,500 |
| 90,001 | 100,000 | 2,000,000 | 2,000,000 | 47,500 |
| 100,000 | සහ ඊට වඩා | 2,000,000 | 2,000,000 | 47,500 |
| | වැඩි මුදලක් | | | |

.".

28. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත

[සහතිකය සටහන් කළේ 2022 අප්‍රේල් මස 08 වන දින]

**අධිභාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ පනතේ මතු සඳහන් විධිවිධානවලට යටත්ව, (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිභාර බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක්-

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් ඉක්මවනු ලබන යම් පුද්ගලයකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, බදු අයකළ හැකි ආදායම මත හවුල් ව්‍යාපාරය විසින් බද්ද ගෙවා ඇත්නම්, මේ ඡේදය යටතේ තනි පුද්ගලයකු වශයෙන් යම් හවුල්කරුවකුගේ බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, හවුල් ව්‍යාපාරයකින් උපචිත වන යම් හවුල්කරුවකුගේ ආදායම පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය; සහ

(ආ) 2020 අප්‍රේල් මස පළමු වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගමේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන බදු අයකළ හැකි ආදායමේ එකතුව රුපියල් මිලියන දෙදහස ඉක්මවන්නේ නම්, එම සමාගම් සමූහයේ එක් සමාගමක බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහස නොඉක්මවා වුව ද, එය නොතකා, එම තක්සේරු වර්ෂය සඳහා, එම එක් එක් සමාගමක බදු අයකළ හැකි ආදායමේ කොටසක් වන්නා වූ පාලිත සමාගමෙන් ලද ලාභාංශවලින් ලැබීම් සහ ලාභ අඩු කිරීමෙන් පසුව එම එක් එක් සමාගමේ බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, සමාගමක්, (ආ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීමට යටත් වන්නේ නම්, එකී සමාගම (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ බදු අයකළ හැකි ආදායමේ එකතුව ගණනය කිරීමේ දී, පාඩු හෝ හිලව් නොකළ පාඩු හේතුවෙන් බදු අයකළ හැකි ආදායම ශූන්‍ය වටිනාකමක් සහිත එම සමාගම් සමූහයේ යම් පාලිත සමාගමක් හෝ පාලක සමාගමක් පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් සමාගමක ගිණුම් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් මාස දොළහක විකල්ප කාලසීමාවක් සඳහා අනුමතිය ලබා දී ඇති අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා එම අනුමත කාලසීමාව 2020 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම යම් තනි පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගම විසින් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත 2022 අප්‍රේල් මස විසි වන දිනයේ දී සහ 2022 ජූලි මස විසි වන දිනයේ දී හෝ ඒ දිනවලට පෙරාතුව සමාන වාරික දෙකකින් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස්-ජනරාල්වරයා විසින් බද්ද එකතු කරනු ලැබිය යුතු අතර එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා-

(අ) මේ පනත යටතේ අයකරනු ලබන බද්ද, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයේ වූ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය;

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ මූල්‍ය සේවා සැපයුම මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා "බදු අයකළ හැකි ආදායම" යන්නෙන්-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී සිටින්නා වූ ද, ඒ ගිවිසුමේ දක්වා ඇති බදු වලින් නිදහස් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඒ ගිවිසුමට අනුව නිශ්චය කරන ලද ආදායම් බදු ගෙවීමට යටත් වී සිටින්නා වූ ද සමාගමකට අදාළව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව ඒ සමාගමේ ආදායම් බදු ගෙවීමට පෙර පැවති ලාභය අදහස් වේ;

(ආ) තනි පුද්ගලයකුට, හවුල් ව්‍යාපාරයකට හෝ (අ) ඡේදයේ සඳහන් සමාගම් හැර සමාගමකට සහ සමාගම් සමූහයක පාලිත සමාගමකට සහ පාලක සමාගමට අදාළව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

3. (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සෑම සමාගම් සමූහයක ම පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව එසේ නියමිත තොරතුරු ඇතුළත් බදු වාර්තාවක් 2022 අප්‍රේල් මස 20 වන දින හෝ එදිනට පෙරාතුව කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව සපයනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) බදු වාර්තාව සඳහා වන ආකෘතිය;

(ආ) බදු වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ බදු වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම් ඇත්නම් ඒ ඇමුණුම්; සහ

(ඇ) ගොනු කළ යුතු ආකාරය,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ සපයනු ලබන බදු වාර්තාවක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ වන "බදු වාර්තාවක්" ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ස්වයං-තක්සේරු කිරීමකට හේතු විය යුතු ය.

4. (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් පුද්ගලයෙකු, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ යම් සමාගම් සමූහයක පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම පුද්ගලයා, හවුල් ව්‍යාපාරය, සමාගම හෝ සමාගම් සමූහයේ පාලිත සමාගම් සහ පාලක සමාගම මේ පනත යටතේ බදු ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කිරීම නීත්‍යනුකූල විය යුතු අතර ඒ සඳහා වැය වන මුදල, හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ යම් හවුල්කරුවකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයේ යම් අනුයෝජිතයකුගෙන් අයකර ගත යුතු ය.

5. (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවධානවලට යටත්ව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX වන පරිච්ඡේදයේ, X වන පරිච්ඡේදයේ, XI වන පරිච්ඡේදයේ, XII වන පරිච්ඡේදයේ, XIII වන පරිච්ඡේදයේ, XIV වන පරිච්ඡේදයේ, XVවන පරිච්ඡේදයේ, XVI වන පරිච්ඡේදයේ, XVII වන පරිච්ඡේදයේ, XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මේ පනත යටතේ පරිපාලන විධිවිධාන, වාර්තා තබාගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොළිය, බදු අයකර ගැනීම, දණ්ඩන සහ අපරාධ නඩු කටයුතු සඳහා අදාළ විය යුතු ය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඉහත කී යම් විධිවිධානවල ආදායම් බදු සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, මේ පනතේ විධිවිධාන ප්‍රකාර අයකරනු ලබන සහ ගෙවනු ලබන බද්ද සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 2024 දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පසු යම් පුද්ගලයකුට, හවුල් ව්‍යාපාරයකට, සමාගමකට හෝ සමාගම් සමූහයක පාලිත සමාගම්වලට සහ පාලක සමාගමට අදාළව පැහැර හරින ලද තක්සේරුවක්, සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සකස් නොකළ යුතු යඃ

එසේ වුව ද, විරෝධතාවයක හෝ අභියාචනයක තීරණයක් මත පදනම්ව සංශෝධිත තක්සේරුවක් කිරීම සඳහා ඉහත කාලසීමාව අදාළ නොවිය යුතු ය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සමාගම" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු නමුත්-

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල;

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල;

(ඇ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 12 වන වගන්තියේ (ඒ) ඡේදය යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල;

(ඈ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 90 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල;

(ඉ) (289 අධිකාරය වූ) වෙළඳ සංගම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වෙළඳ සේවා අර්ථසාධක සමිතිය;

(ඊ) (397 අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව මගින් පිහිටුවන ලද ලංකා බැංකු අර්ථසාධක අරමුදල;

(උ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පොදු සමාගම යටතේ පිහිටුවන ලද හැටන් නැෂනල් බැංකු සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල;

(ඌ) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ පිහිටුවන ලද මහජන බැංකු විශ්‍රාම භාර අරමුදල;

(එ) (422 අධිකාරය වූ) මුදල් නීති පනතේ 10 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තයන්ගේ විශ්‍රාම අරමුදල;

(ඒ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ටෙලිකොම් අර්ථසාධක අරමුදල;

(ඔ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල;

(ඕ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනත යටතේ පිහිටුවන ලද (1996 න් පසු) 2014 ලංකා බැංකු විශ්‍රාම භාර අරමුදල;

(ක) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ IV වන කොටසේ විධිවිධාන ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක් හෝ දායක විශ්‍රාම යෝජනා ක්‍රමයක්,

ඇතුළු යම් සේවක භාර අරමුදලක්, අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක්, විශ්‍රාම භාර අරමුදලක්, පාරිතෝෂික හෝ සේවය අවසන් කිරීමේ අරමුදලක් ඇතුළත් නොවේ;

"සමාගම් සමූහය" යන්නෙන්, පාලක සමාගමක් සහ එහි පාලිත සමාගම් අදහස් වේ;

"පාලක සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක් හැර 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට වෙනත් සමාග මක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස්වලින් සියයට පනහක ප්‍රතිශතයකට වැඩියෙන්, ඍජුව හෝ වක්‍රව හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"හවුල් ව්‍යාපාරය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බදු වාර්තාව" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පාලිත සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලිත සමාගමක් හැර, 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස් ප්‍රමාණයක්, ඍජුව හෝ වක්‍රව වෙනත් සමාගමකට හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"තක්සේරු වර්ෂය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

**(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 31ඈඈ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවකට එරෙහිව යම් කම්කරුවකු විසින් කරන ලද අභියාචනයක් මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් මගින් එම කම්කරුවාට පක්ෂව දෙන ලද අවසාන තීන්දුවකින් අතෘප්තියට පත් සේවායෝජකයකු ඒ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම අභියාචනයට විෂයය වන නියෝගය මගින්-

(අ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්; සහ

(ආ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස ද, එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවන ලෙස ද විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක් සහ එම කම්කරුවාගේ සේවය අවසන් කරන ලද අවස්ථාව වන විට එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්,

සේවායෝජකයා විසින් ඒ විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ආ) (1අ) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම, (1අ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(1ඇ) සෑම විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් ම, (1අ) උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල් ශ්‍රී ලංකාවේ යම් අනුමත බැංකුවක පොලී දරන ගිණුමක තැන්පත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඈඈඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඈඈඈඈ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යః-

31ඈඈඈඈ. (1) මේ පනතේ 17(1) වගන්තිය යටතේ බේරුම්කරුවකු විසින් හෝ 24 වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් විසින් කරන ලද ප්‍රදානයකට එරෙහිව රිට් ආඥාවක ස්වභාවයේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා සේවායෝජකයකු විසින් අභියාචනාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, ඒ ඉල්ලීමට විෂයය වන්නා වූ ප්‍රදානය මඟින් කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවක දී, සේවායෝජකයා විසින් ඒ මුදලට සමාන මුදලක ඇප මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම සලකා බලනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 33අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යః-

33අ. (1) යම් කම්කරුවකුට පක්ෂව කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවක් හෝ කාර්මික අධිකරණයක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයක් අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් සේවායෝජකයකුට එරෙහිව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136ආ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් ලිඛිත පැමිණිල්ලකට අනුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මඟින් අතෘප්තියට පත් සේවායෝජකයකු, ඒ තීන්දුව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ ප්‍රතිශෝධන අධිකරණ බලය ලබා ගැනීමට ඉල්ලීමක් කරන අවස්ථාවක දී, එම ඉල්ලීමට විෂයය වන්නාවූ ආඥාව මඟින් ඒ කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවේ දී සේවායෝජකයා විසින්, එම මුදලට සමාන මුදල් ප්‍රමාණයකින් වූ ඇප මුදලක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන ලද සියලු මුදල්, ශ්‍රී ලංකාවේ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොලී දරන යම් ගිණුමක තැන්පත් කරනු ලැබීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීන්දුවට අනුකූලව, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද මුදල, ඒ මුදල මත වූ පොලිය ද සමඟ අදාළ පාර්ශ්වය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(3අ) (1) යම් සේවායෝජකයකු (3) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙන තීරණයකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් අඛණ්ඩව පැහැර හරිනු ලබන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසු, (3) වන උපවගන්තිය යටතේ පනවනු ලබන යම් දඩයකට අතිරේකව, එම තීරණයට අනුකූලව කටයුතු නොකිරීම අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක අතිරේක දඩයක් කම්කරුවාට ගෙවීමට එම සේවායෝජකයා යටත් විය යුතු ය.

(2) යම් සේවායෝජකයකු විසින්, (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම සේවායෝජකයා වරදකරු කරනු ලැබ ඇත්තේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයකින් ද, එම මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඔහුට පනවන ලද දඩයක් ලෙස ඒ අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මඟින් එම මුදල අයකරගනු ලැබිය හැකි අතර, එසේ අයකරගනු ලබන මුදල කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් පනහක දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

10අ. (1) යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලබන ආඥාවකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින්, එම මහෙස්ත්‍රාත් අධිකරණය පිහිටා ඇත්තේ යම් පළාතක් තුළ ද, එම පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත ඒ ආඥාවට එරෙහිව ලිඛිත පෙත්සමක් මඟින් ප්‍රතිශෝධන ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන ආඥාවෙන් කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන ඇප මුදලක් එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල්, ශ්‍රී ලංකාව තුළ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන, පොළී දරන යම් ගිණුමක තැන්පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

10ආ. (1) යම් සේවායෝජකයකු 6 වන හෝ 6අ වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින් රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා එම නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන නියමය මඟින්-

(අ) වන්දි ලෙස යම් මුදලක් ගෙවන ලෙස ද, නැවත සේවයේ පිහිටුවන ලෙස ද, විධාන කරනු ලබන අවස්ථාවක, එම නියමයේ දින සිට එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවනු ලැබිය යුතු දින දක්වා ගණනය කළ යුතු වැටුප් හෝ වේතන ලෙස වන යම් මුදල් ප්‍රමාණයක් සහ නැවත සේවයේ පිහිටුවීම වෙනුවෙන් එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්; සහ

(ආ) වන්දි ලෙස කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලැබූ අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්.

අභියාචනාධිකරණය වෙත තබනු ලැබිය යුතු ය.

(3) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකාව තුළ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ප්‍රකාර, (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇප මුදල එම මුදලට අදාළ පොළිය ද සමග අදාළ පාර්ශ්වයට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

**(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතෙ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ඇටෝර්නි බලපත්‍රය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

'"ඇටෝර්නි බලපත්‍රය" යන්නෙන් යම් නීතිඥවරයකුට යම් තැනැත්තකු වෙනුවෙන් නීතිඥවරයකු ලෙස පෙනී සිටීමේ කාර්යය සඳහා දෙන ලද යම් ලිඛිත බලයක් හෝ අධිකාර බලයක් හැර, ඔහුව නියෝජනය කිරීමට, යම් කාර්යයක් ඉටු කිරීමට, ක්‍රියාවක් කිරීමට හෝ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට, එවැනි යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට දෙන ලද්දා වූ ද-

(අ) එය ශ්‍රී ලංකාව තුළ ලියා අත්සන් කරනු ලබන විට, සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලැබ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලැබ; හෝ

(ආ) එය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරනු ලබන විට, සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ සහ තානාපතිවරයකු හෝ මහ කොමසාරිස්වරයකු හෝ 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ අර්ථය තුළට ගැනෙන යම් රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු හෝ කොන්සල් නිලධරයකු හෝ එකී රටේ නීතිය අනුව එවැනි ඇටෝර්නි බලපත්‍රයක් ලියා සහතික කිරීමට බලය ලබා ඇති යම් තැනැත්තකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලැබ,

ලබා දෙන ලද යම් ලිඛිත බලයක් හෝ අධිකාර බලයක් අදහස් වේ.";

(2) "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නට, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ කාර්යයන් තත්කාලයේ නීත්‍යානුකූලව ඉටු කරනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

3. (1) (අ) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක දී ලියා අත්සන් කරනු ලබන සෑම ඇටෝර්නි බලපත්‍රයක්ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කළ යුතු ය.

(ආ) සෑම ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකු (මෙහි මින්මතු "ඇටෝර්නි බලකරු", යනුවෙන් හඳුන්වනු ලබන) විසින් ම -

(i) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයේපිටපතක්; සහ

(ii) මෙහි i වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සාදන ලද දිවුරුම් ප්‍රකාශයක් ද,

සමග ඇටෝර්නි බලපත්‍රය ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද්දක් නම් ලියා අත්සන් කරන ලද දිනයේ සිට එක් මාසයක කාලයක් ඇතුළත ද, එය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද්දක් නම්, ලියා අත්සන් කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත ද, එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඇටෝර්නි බලපත්‍රයේ නිරවද්‍යතාව පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත්වීමෙන් අනතුරුව, ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කර, එහි සහතික පිටපත ගොනුකොට එම සහතික පිටපත මත සහ ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත මත එහි ලියාපදිංචි අංකය හා දිනය සහ එම ලියාපදිංචිය සටහන්කොට ඇති වෙළුමට සහ පත්‍රිරුවට යොමුවක් සමග සටහන් කොට, එම ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙතම ආපසු භාරදිය යුතු ය.

(3) එවැනි ලියාපදිංචි කිරීමක් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොතක සටහන් කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ සහ 3ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

3අ. (1) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥා පනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවක අරමුණ සඳහා භාවිත කිරීම පිණිස ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි, (2) වන හෝ (3) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇටෝර්නි බලපත්‍රයක් ශ්‍රී ලංකාව තුළ ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී-

(අ) එය වංචා වැළැක්වීමේ ආඥාපනතට සහ (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතට අනුකූලව ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් විධිමත් ලෙස සහතික කරනු ලැබිය යුතු ය;

(ආ) එය ඉඩමකට හෝ ඉඩම් කොටසකට අදාළ වන විට අවස්ථාවෝචිත පරිදි එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ මායිම් සහ සීමා, සහ ප්‍රමාණය සමග විස්තරයක් ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඇ) එය සහාධිපත්‍ය දේපළකට අදාළ වන විට සහාධිපත්‍ය කොටස හඳුනාගත හැකි වන විට සහාධිපත්‍ය කොටසේ සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද, සහාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි වන විට දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඈ) ගණුදෙනුවට අදාළ ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස පෙර ලියාපදිංචියක් සහිත වන අවස්ථාවක දී, එම ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස ලියාපදිංචි කොට ඇති වෙළුම හා පත්‍රිරුවට යොමුව ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඉ) ප්‍රදානකරුගේ අත්සනට අමතරව ප්‍රදානකරුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ සහ ප්‍රදානකරුගේ මාපට ඇඟිලි දෙකම නොමැති විට, ප්‍රදානකරුගේ වම් හෝ දකුණු අතේ කවර හෝ ඇඟිල්ලක සලකුණ තැබිය යුතු අතර ඔහුගේ අත් දෙකම නොමැති අවස්ථාවක, ඔහුගේ කකුලේ මාපට ඇඟිලි සලකුණ, ප්‍රසිද්ධ නොතාරිස්වරයා සහ සාක්ෂිකරුවන් ඉදිරියේ තැබිය යුතු ය; සහ

(ඊ) ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් සහතික කරන ලද ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපතක් ඇටෝර්නි බලපත්‍රයට අමුණනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇටෝර්නි බලපත්‍රයක් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී-

(අ) එය මේ පනතේ 2 වන වගන්තිය යටතේ බලයලත් තැනැත්තකු ඉදිරියේ දී නිසි පරිදි ලියා අත්සන් කළ යුතු ය;

(ආ) එය ඉඩමකට හෝ ඉඩම් කොටසකට අදාළ වන විට ඉඩමේ හෝ ඉඩම් කොටසේ මායිම් සහ සීමා, සහ ප්‍රමාණය සමග විස්තරයක් ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඇ) එය සහාධිපත්‍ය දේපළකට අදාළ වන විට, සහාධිපත්‍ය කොටස හඳුනාගත හැකි අවස්ථාවක දී, සහාධිපත්‍ය කොටසේ සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද, සහාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි අවස්ථාවක දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඈ) ගණුදෙනුවට අදාළ ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස පෙර ලියාපදිංචියක් සහිත වන අවස්ථාවක දී, එම ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස ලියාපදිංචි වී ඇති වෙළුමට හා පත්‍රිරුවට අදාළ යොමුව ද ඊට අන්තර්ගත කළ යුතු ය; සහ

(ඉ) ප්‍රදානකරු විසින් අත්සන් කරන ලද ප්‍රදානකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ පිටපතක් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපතක්, ඇටෝර්නි බලපත්‍රයට අමුණනු ලැබිය යුතු ය.

3ආ. (1) මේ පනතේ 3අ වගන්තියේ සඳහන් ගනුදෙනුවකට අදාළව නොතාරිස් ආඥාපනතට අනුකූලව ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කරන සෑම ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් ම -

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, අදාළ වෙළුම් සහ පත්ඉරු පරීක්ෂා කළ යුතු ය;

(ආ) ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු කර නොමැති බවට සෑහීමට පත් විය යුතු අතර, එසේ සෑහීමට පත් වූ බව එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ ඔහුගේ සහතිකයේ සඳහන් කළ යුතු ය; සහ

(ඇ) ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ අවස්ථාවෝචිත පරිදි, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ පිටපතක් සහ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් රඳවා තබා ගත යුතු ය.

(2) සැක දුරුකිරීමේ කාර්යය සඳහා, ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කර හෝ අවලංගු කර තිබේ ද, නැති ද යන්න නිශ්චය කිරීමේ කාර්යය පිණිස, එවැනි ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ වෙළුම් සහ පත්ඉරු පරීක්ෂා කිරීම ප්‍රමාණවත් විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

3ඇ. රජයේ ආයතනයක් විසින් ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් හැර, ඇටෝර්නි බලපත්‍රයක එහි වලංගු කාලසීමාව නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස හෝ 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර හෝ අවලංගු කරනු ලැබ ඇත්නම් මිස, ඇටෝර්නි බලපත්‍රයක් එහි අත්සන් කරන ලද දිනයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා පමණක් වලංගු විය යුත්තේ ය.

3ඈ. රජයේ ආයතනයක් හැර කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රයක් ලියා අත්සන් කරනු නොලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

4. (1) යම් ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට එහි ප්‍රදානකරු අදහස් කරනු ලබන අවස්ථාවක හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා කිරීමට ඇටෝර්නි බලකරු අදහස් නොකරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රදානකරු හෝ ඇටෝර්නි බලකරු විසින් -

(අ) එම අදහස අනෙක් පාර්ශ්වයට දැනුම් දිය යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා නොකිරීමට වන ඔහුගේ අදහස ප්‍රකාශ කරමින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලබන ලේඛනයක් ලියා අත්සන් කළ යුතු ය; සහ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් එවැනි ලේඛනයක් එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කරන ලද වෙළුමට සහ පත්ඉරුවට හරස් යොමුව ද සමග අදාළ වෙළුමේ සහ පත්ඉරුවේ ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) යම් ඇටෝර්නි බලපත්‍රයක ප්‍රදානකරුට වහාම ක්‍රියාත්මකවන පරිදි ඔහුගේ ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම අවශ්‍ය වන විට, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ලේඛනය ලියා අත්සන් කරනු ලැබ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන තෙක්, ප්‍රදානකරු හෝ ඔහුගේ නීතිඥවරයා විසින් ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට වන ඔහුගේ අදහස, iii වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් පිටපත් දෙකකින් යුතු දැන්වීමක් මගින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා දැනුවත් කළ හැකි යඃ

එසේ වුව ද, එවැනි දැන්වීමක් එකී දැන්වීමේ දිනයේ සිට මාස තුනක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ සඳහන් එවැනි දැන්වීමක් ලැබීම මත, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ අවලංගු කිරීමේ අදහස පිළිබඳ, අදාළ වෙළුමේ සහ පත්ඉරුවේ පිටසනක් යෙදිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "උපලේඛනයේ නියම කරනු ලැබ ඇති" යන වචන වෙනුවට "II වන උපලේඛනයේ නියම කරනු ලැබ ඇති" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කරනු ලැබේ:-

[3 (1) වන වගන්තිය]

I වන උපලේඛනය

.................................................................. පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක ........................... දරන)...................................... වන මා විසින් ...... ................................ භක්තිකයකු වශයෙන් අවංකවත්, ගාම්භීර පූර්වකව සහ සත්‍යවත් පහත දැක්වෙන පරිදි මෙයින් ප්‍රතිඥා දී /දිවුරුම් දී ප්‍රකාශකර සිටිමි.

(1) ඉහත සඳහන් දිවුරුම්/ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

(2) ..................................... පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක ......................... දරන)...................................... යන අය විසින් ලියා අත්සන් කරනු ලැබ ප්‍රසිද්ධ නොතාරිස් ................................. විසින් සහතික කරන ලද අංක ................................. හා ............................. දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් එහි සඳහන් කාර්යය සඳහා මා ඔහුගේ/ ඇයගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කර ඇති බව මම දිවුරා/ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

(3) එම ඇටෝර්නි බලපත්‍රය අව්‍යාජ හා දැනට බලාත්මක ව පවතින බවත්, ප්‍රදානකරු ජීවත්ව සිටින බවට මම විශ්වාස කරන බවත් කියා සිටිමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය මෙහි නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක හට කියවා පැහැදිලි කරදීමෙන් පසුව එහි අන්තර්ගතය අවබෝධ කරගෙන ............................................ දින............ ..........................දී ප්‍රතිඥා දී/ දිවුරුම් දී අත්සන් කරන ලදී.

.....................................................
ඇටෝර්නි බලකරු

මා ඉදිරිපිට දී ය.

.................................................
සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්.

[3 (3) සහ 5 වන වගන්ති]

II වන උපලේඛනය

| | |
|---|---|
| අනු අංකය: | |
| ලියාපදිංචි කළ දිනය: | |
| ප්‍රදානකරුගේ නම සහ ලිපිනය: | |
| ඇටෝර්නි බලකරුගේ නම සහ ලිපිනය: | |
| ඇටෝර්නි බලපත්‍රයේ දිනය: | |
| ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ කා විසින් ද: | |
| ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචිය වූ වෙළුම සහ පත්‍රිරුව: | |
| ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනයේ දිනය සහ අංකය: | |
| ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනය භාරදෙන ලද්දේ කා විසින් ද: | |
| ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනයේ ලියාපදිංචි කරනු ලබන වෙළුම සහ පත්‍රිරුව: | |

[4 (2) වන වගන්තිය]

III වන උපලේඛනය

රෙජිස්ට්‍රාර් ජනරාල්,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
,.......................................

..................................................................................................................... (ලිපිනය) යන තැන පදිංචි ................................................................ (ප්‍රදානකරුගේ නම) වන මා විසින්, ඇටෝර්නි බලපත්‍ර රෙජිස්ටරයේ .......................................... වන වෙළුමේ ............................. වන පත්‍රිරුවේ ..................................... දින පොත් අංක ................................. යටතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු

කරන සාධන පත්‍රයක්, මේ දැන්වීමේ දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා ඔබ වෙත ඉදිරිපත් කිරීමට අදහස් කරන බව, ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත යටතේ දැනුම් දෙමි.

වර්ෂ ............., ................................ වන දින,

........................... හි දී ය.

...............................................

ප්‍රදානකරුගේ හෝ ප්‍රදානකරුගේ

නීතිඥවරයාගේ අත්සන.

1. අත්සනඃ-

සම්පූර්ණ නමඃ-

ජා.හැ.අ.ඃ-

ලිපිනයඃ-

2. අත්සනඃ-

සම්පූර්ණ නමඃ-

ජා.හැ.අ.ඃ-

ලිපිනයඃ-

යන අය ඉදිරිපිටදී අත්සන් තබන ලදී.”.

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ මේ පනතේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා -

(අ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකරන ලද, සහ මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙරාතුව ම වූ දිනක දී ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු නොකරන ලද සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම මේ පනත ආරම්භ වන දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය;

(ආ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සහ මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙරාතුව ම වූ දිනක දී ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු නොකරන ලද සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම මේ පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සිදු කරන තෙක් තවදුරටත් වලංගු හා බලාත්මක විය යුතු ය;

(ඇ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ලියාපදිංචිය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති සහ මේ පනත ආරම්භ වන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචිය අවසන් නොවූ, සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු නොලබන එම ඡේදයේ සඳහන් සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම, එම කාලසීමාව අවසන් වීමේ දිනයේ සිට බලාත්මක වන පරිදි ශූන්‍ය සහ බල රහිත වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

9. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

**(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, “එය ලිඛිත වන්නේ නම් ද” යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(අ) අදාළ ඔප්පුව හෝ සාධන පත්‍රය ලිඛිත වන්නේ නම් ද එකම අවස්ථාවක දී පැමිණ සිටින සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට එකී සෑම ලියා අත්සන් කරන්නකු විසින් ම අත්සන් කර ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කර ඇත්නම් ද; සහ

(ආ) එකී සෑම ලියා අත්සන් කරන්නකුගේ ම වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ එවැනි ලියා අත්සන් කරන්නකුගේ මාපට ඇඟිලි දෙකම නොමැති නම්, අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි සලකුණ අදාළ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, දෙවන පිටපතේ සහ මූලපත්‍රයේ අත්සනට ඉහළින් හෝ ඒ අසලින් තබා ඇත්නම් මිස,

බලාත්මක නොවිය යුතු ය; හෝ නීතියෙහිලා ආධාර කර ගත නොහැකි විය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත එවැනි යම් ලියා අත්සන් කරන්නකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකයෙහි එකී හේතුව සඳහන් කරනු ලැබිය යුතු අතර, එකී ලියා අත්සන් කරන්නා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.";

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "(2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කර ඇත්නම් මිස වලංගු නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) තෙස්තමේන්තුකරු විසින්, එකම අවස්ථාවක දී පැමිණ සිටින ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට (1) වන උපවගන්තියේ සඳහන් අන්තිම කැමති පත්‍රයේ, තෙස්තමේන්තුවේ හෝ කොඩිසිල් පත්‍රයේ පාමුල හෝ කෙළවර -

(අ) අත්සන් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත තෙස්තමේන්තුකරුගේ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "තෙස්තමේන්තුකරුගේ හෝ තෙස්තමේන්තුකාරියගේ "අත්සන" යන වචන වෙනුවට "අත්සන සහ තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යතිරේඛය ඇතුළත් කිරීමෙන්:-

"එසේ වුව ද, තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් යම් හේතුවක් මත ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවක දී, තෙස්තමේන්තුකරු විසින් ඔහුගේ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු අතර ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් එම හේතුව ඔහුගේ සහතිකයේ සටහන් කළ යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "පිටපත් දෙකකින්" යන වචන වෙනුවට "පිටපත් තුනකින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ඔප්පු පිටපත් තුනකින් ලියා අත්සන් කළ යුතු බව".

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මේ පනතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

"VIIඅ වන පරිච්ඡේදය

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

41අ. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේ යः-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(ඉ) පහත සඳහන් පරිදි නාමයෝජනා කරනු ලැබ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු තැනැත්තන් පස් දෙනෙක්ः-

(i) ආණ්ඩුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(ii) විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්; සහ

(iii) අග්‍රාමාත්‍යවරයාගේ සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ එකඟත්වය මත, කථානායකවරයා විසින් නාමයෝජනා කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්; සහ

(ඊ) ආණ්ඩුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ එකඟත්වය මත නාමයෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ වන පත්කිරීම් සඳහා වූ නාමයෝජනා, ඒ නාමයෝජනා කිරීමේ අවශ්‍යතාවය පැනනගින කවර හෝ අවස්ථාවන්හි දී සිදු කිරීමට වගබලා ගැනීම කථානායකවරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස්දෙනා නම් කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් වෘත්තීය සහ සමාජයීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සභාවෙන් පිළිබිඹු වන බව සහතික කරනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලබන්නා වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නා වූ ද තැනැත්තන් විශිෂ්ටත්වයෙන් හා අවංකභාවයෙන් යුත්, පොදු හෝ වෘත්තීය ජීවිතයේ දී කීර්තියට පත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ කරන ලද නාම යෝජනා නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම් දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය.

(7) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, අග්‍රාමාත්‍යවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා සහ සභාවේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකී විසුරුවා හැරීමට පසුව පවත්වනු ලබන මහමැතිවරණයට ඉක්බිතිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක් හෝ යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තෙක්, සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධුර දැරිය යුත්තා හ.

(8) (අ) (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය යටතේ පත්කරනු ලබන සභාවේ සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම ඔහු විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ එවැනි යම් සාමාජිකයකු ශාරීරික හෝ මානසික අශක්නුතාවකට පත් වීම සහ ඔහුට තවදුරටත් තම ධුරයේ කටයුතු කරගෙන යාමට නොහැකි වීම පදනම් කොට ගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්

බහුතරයක් පක්ෂව ඡන්දය දී සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මත ජනාධිපතිවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ වන ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇතිවීමේ දින සිට දින දහහතරක් ඇතුළත, ඉහත සඳහන් ඡේදයන්හි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධුරය දැරිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්වීම් කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

41ආ.(1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යය වන අතර ඒ නිර්දේශවලින් ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) පත්කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත්කරනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය.

උපලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව.

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව.

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.

(උ) මුදල් කොමිෂන් සභාව.

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව.

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

41ඇ. (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කිසිම ධුරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ධුරයක දින දහහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය:

එසේ වුව ද, දින දහහතරක් නොඉක්මවන අනුක්‍රමික කාලසීමා සඳහා එවැනි කවර හෝ ධුරයක වැඩ බැලීමට යම් තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශයක් මත සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, නොකළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධුරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු හෝ ඒ ධුරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා සම්බන්ධ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ අදහස් ලබාගත යුත්තේ ය.

### උපලේඛනය

#### I වන කොටස

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

#### II වන කොටස

(අ) නීතිපතිවරයා.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා.

(ඇ) විගණකාධිපතිවරයා.

(ඈ) පොලිස්පතිවරයා.

(ඉ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).

(ඊ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

41ඇ.(1) සභාවට මහ ලේකම්වරයකු සිටිය යුත්තේ ය. මහ ලේකම්වරයා සභාව විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුත්තේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

41ඉ. (1) සභාව විසින් සෑම මාසයක ම යටත් පිරිසෙයින් දෙවාරයක් ද, එය වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් වාර ගණනක් ද රැස්විය යුතු අතර, සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ මහ ලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා ද, අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා ද, සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙක් විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද, ගනු ලබන සෑම තීරණයක් ද, ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බල සහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්, සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ වන හෝ 41ඇ වන ව්‍යවස්ථාව යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේ දී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41අ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී, ඒ සාමාජිකයා ඒ තෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධුරය අත්හරිනු ලැබුවාක් සේ සැලකිය යුත්තේ ය.

(8) සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවූව ද, නැතහොත් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුණ ද, ඒ බව නොතකා ක්‍රියා කිරීමට සභාවට බලය ඇත්තේ ය. සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවීමේ හේතුව හෝ සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ නිසාම පමණක් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ගනු ලැබූ සභාවේ යම් ක්‍රියාවක්, කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

41ඊ. සභාවේ සාමාජිකයන්ගේ හෝ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොමිෂන් සභාවක සාමාජිකයන්ගේ හෝ ධුර කාල ඉකුත් වීම නොතකා, අවස්ථාවෝචිත පරිදි, සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල හෝ අලුත් සාමාජිකයන් ධුර භාරගන්නා තෙක්, ඒ දක්වා සිටි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල සාමාජිකයන් තවදුරටත් ධුර දැරිය යුත්තේ ය.

41උ. (1) සභාව විසින් සෑම මාස තුනකට ම වරක් ඊට පෙරාතුව වූ මාස තුන තුළ එහි කටයුතු පිළිබඳව වාර්තාවක් ජනාධිපතිවරයා වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් කිරීම ද ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(3) ස්වකීය කාර්ය හා කර්තව්‍ය කිරීමට සහ ඉටු කිරීමට අදාළව රීති සෑදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියලු රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

41ඌ. සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

41එ. 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සභාවේ යම් තීරණයක් හෝ සභාව විසින් කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට හෝ ඒ පිළිබඳ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. එකී තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය.".

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:

"VIII වන පරිච්ඡේදය

**විධායකය**

අමාත්‍ය මණ්ඩලය

42. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද, මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම හා යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.

43. (1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙය වීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු දීමට බැඳී සිටින්නේ ය.

(3) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා ද වන්නේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය ද ජනාධිපතිවරයා තවදුරටත් තම ධුරය දරන්නේ ය.

(4) ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

44. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව ද, අමාත්‍යාංශ සංඛ්‍යාව ද, ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද, නිශ්චය කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත්කළ යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විය යුතු අතර, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ 45 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන යම් අමාත්‍යවරයකු වෙත යම් විෂයයක් හෝ කාර්යයක් පවරා නොමැති කාලපරිච්ඡේදයක් වන්නේ ද, එවන් කාලපරිච්ඡේදයක් ඇතුළත වූ දින දහහතරක්

නොඉක්මවන කාලයක් සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් ඒ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැක්කේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුත්තේ ය:

එසේ වුව ද, මේ අනුව්‍යවස්ථාවේ මීට ඉහතින් වූ විධිවිධාන මගින්, යම් විෂයයක් හෝ කාර්යයක් ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, තමන්ගේ භාරය වෙත පවරා ගැනීම වළක්වනු නොලබන්නේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුත්තේ ය.

(4) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද, කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

45. (1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද, ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද, නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.

(3) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැක්කේ ය.

(4) (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන සෑම අමාත්‍යවරයෙක් ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් හෝ යම් ලිඛිත නීතියකින් ඔහුට පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලතල කිසිවක් හෝ කාර්යයක් පවරන්නා වූ හෝ නියම කරන්නාවූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

46. (1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැකි අතර, එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

47. (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය; සහ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතළිහ නොඉක්මවිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා-

(අ) ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවන ලිපියක් මඟින් ඉවත් කරනු ලැබුවහොත්;

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද, ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්-

(අ) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුවහොත්;

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද, ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.

(4) (1) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුත්තේ ය.

(5) (4) වන අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා ජාතික ආණ්ඩුවක් යනු, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය.

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියාකළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහ මැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, 47 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (3) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ධූර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කළ යුතු අතර, එසේ ධූර දැරීමේ දී ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන නිර්නායකයන් පිළිපදිමින් මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත්, මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධූරයෙන් ඉවත් කරනු ලැබුවේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත්, මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු මිය ගිය විට හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස් වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පත්කරනු ලැබිය හැක්කේ ය.

49. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ හැර, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වූ විට, 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇතොත් මිස, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය. තව ද, 48 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළහොත් එවිට ද, ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්මත කළහොත් එවිට ද, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයෙක් ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය.

50. අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකුට හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වුවහොත්, එවිට, එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය.

51. (1) (අ) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(ආ) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

(2) (අ) අමාත්‍ය මණ්ඩලයට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(ආ) ජනාධිපතිවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ ඔහුට පවරනු ලබන්නා වූ වෙනත් යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමත්, කිරීමත් ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

52. (1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යාංශයක් ම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද, වෙනත් ආයතන ද, අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙයවන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරීම නොතකා, අමාත්‍යාංශයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නව ලේකම්වරයකු පත් කරනු ලබන තෙක් ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ධුරය දරනු ලැබිය යුත්තේ යඃ

එසේ වුව ද, යම් අමාත්‍යාංශයක පැවැත්ම නතර වීමේ ප්‍රතිඵලය ඇති තීරණයක්, 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් ගනු ලැබීම මත ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා ධුරය දැරීම අවසන් විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, විගණකාධිපතිවරයාගේ කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගෙ (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 41අ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ලෙස නොසැලකිය යුත්තේ ය.

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් ධුරයකට පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඔහු හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන්නේ නම් මිස, හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන්නේ නම් මිස, ස්වකීය ධුරයට අයත් කාර්යන්හි නොයෙදිය යුත්තේ ය.".

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුත්තේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(4) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම (2) වන අනුව්‍යවස්ථාව යටතේ නුසුදුසුකමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, කලින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කොට ඇත්නම් හෝ (6) වන අනුව්‍යවස්ථාව යටතේ ධුරය හැරයන ලද සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය."; සහ

(3) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන්, 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (ආ) අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

61ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, "රජයේ නිලධරයා" යන්නට යුද හමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයකු හෝ ඇතුළත් නොවන්නේ ය.".

7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(6) මහ ලේකම්වරයාට ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන කවර හෝ විටෙක, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව, මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට තැනැත්තකු පත් කළ හැක්කේ ය.".

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (iv) වන අයිතමයේ "41අ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (vඅ) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(Vආ) යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැර, 41අ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු,"; සහ

(3) ඒ ඡේදයේ (xiii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(xiii) වෙනත් යම් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;".

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ 41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන්.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන, අවස්ථාවෝචිත පරිදි, යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත, කලින් කල, නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුත්තේ ය.".

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්.

14. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයකු" යන වචන යෙදී ඇති කවර හෝ අවස්ථාවක ඒ වචන වෙනුවට "මහෙස්ත්‍රාත්වරයකු හෝ දිසා විනිසුරුවරයකු" යන වචන ආදේශ කිරීමෙන්.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඕ වන ව්‍යවස්ථාව, එහි (අ) වන අනුව්‍යවස්ථාවේ "අධිකරණ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ" යන වචන වෙනුවට "අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "සතියක් ඇතුළත" යන වචන වෙනුවට "දින දහහතරක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්.

19. පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 153ඊ, 153උ සහ 153ඌ යන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුත්තේ යඃ

153අ. (1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් තිබිය යුතු අතර, එකී කොමිෂන් සභාව, එකී සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේ යඃ-

(අ) නියෝජ්‍ය විගණකාධිපති ධුරය හෝ ඊට ඉහළින් වූ ධුරයක් දරන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙක්;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙක්; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙක්.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු-

(අ) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත්;

(ආ) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි ධුරයෙන් ඉවත් කළහොත්; හෝ

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,

මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වැඩිදුර ධුර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(4) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව (1) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය යුත්තේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(7) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

153ආ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනකු විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින්, (1) වන අනුව්‍යවස්ථාවට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධිත වූ සහ ඊට ආනුෂංගික වූ වෙනත් කාරණා සඳහා ද නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

153ඇ. (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන් පත්කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ, විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ බලතල කොමිෂන් සභාවට පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුත්තේ යඃ-

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන් සේවයට බඳවා ගැනීමේ පටිපාටිවලට අදාළ රීති සහ ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති, ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව සකස් කිරීම;

(ආ) නීතිය මගින් ස්ථාපිත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම; සහ

(ඇ) නීතිය මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.

(3) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) එවැනි සෑම රීතියක් ම එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම රීති මගින් නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(5) එවැනි සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ ඊට පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය.

153ඈ. (1) තමාගේ රාජකාරි කටයුතු අතරතුර දී හැර, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, තමන් විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින්, කවර වූ හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ තීරණයකට, එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාගකොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය.

153ඉ. 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පිරිනමා ඇති අධිකරණ බලයට සහ 153උ වන ව්‍යවස්ථාව යටතේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව, මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී එකී සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් පිළිබඳව විභාග කිරීමට, මතයක් ප්‍රකාශ කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

153ඊ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

153උ. කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු සම්බන්ධයෙන් වූ යම් පත් කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහකිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

153ඌ. කොමිෂන් සභාව, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ෂයක දී ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ ය.".

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "පාර්ලිමේන්තු සභාව, 41අ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමකට හැර, කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණීමට ද, සහභාගීවීමට ද, පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වල දී ඡන්දය භාවිත කිරීමට ඔහුට හිමිකම නොමැත්තේ ය.".

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ "126 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "126 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ වන ව්‍යවස්ථාව මගින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙළින් 155උ වන, 155ඌ වන, 155එ වන, 155ඒ වන සහ 155ඔ වන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුතු ය:-

155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් විධිවිධාන සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේ දී කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව වහාම පොලිස්පතිවරයාට දැනුම් දිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින්, පොලිස්පතිවරයා විමසා-

(අ) තත් කාර්යය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික අංශයේ සහ පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය; සහ

(ඈ) චර්යා සංග්‍රහ සහ විනය පිළිබඳ පටිපාටි,

ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා කටයුතු සැලසීම දල ඒ කාරණා නිශ්චය කිරීම ද, කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

155ඟ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාණ්ඩවල පොලිස් නිලධරයන් පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත්කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාව යටතේ නම් කරනු ලබන කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

155එ. (1) යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට සහ කාර්ය පටිපාටිවලට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

155ඒ. (1) යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම හෝ ඔවුන් සේවයෙන් පහකිරීම පිළිබඳව කොමිෂන් සභාවට ඇති බලතල කොමිෂන් සභාව විසින් 155එ වන ව්‍යවස්ථාව යටතේ යම් පොලිස් නිලධරයකුට පවරා ඇති අවස්ථාවක එකී පොලිස් නිලධරයා විසින් එසේ ඔහු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද යම් නියමයකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට පොලිස්පතිවරයාට අයිතිය ඇත්තේ ය.

(2) පොලිස්පතිවරයා හෝ 155ඟ වන සහ 155එ වන ව්‍යවස්ථාවල සඳහන් කමිටුවක් හෝ පොලිස් නිලධරයකු හෝ විසින් තමන්ගේ යම් උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධරයකු විසින්, අභියාචනයක් කිරීම සහ අභියාචනයක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති කාර්යපටිපාටිය ද කාලසීමාව ද විධිමත් කරමින් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී නියමයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේ ය.

(3) (1) වන හෝ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද අභියාචනයක් මත, කරන ලද එකී නියමය වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත් වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින්, කලින් කල, සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(5) මේ පරිච්ඡේදයේ 155ඟ වන හෝ 155එ වන ව්‍යවස්ථාව යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත ස්වකීය බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ද, ඒ කාණ්ඩයේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම කරනු නොලැබිය යුත්තේ ය.

155ඔ. තමන්ගේ යම් උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 155ඒ වන ව්‍යවස්ථාව ප්‍රකාරව කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට විරුද්ධව අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ බලය ඒ විනිශ්චය අධිකාරියට ඇත්තේ ය.".

26. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

155ඕ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවත්නා සියලු ම රීති, නියෝග සහ කාර්ය පටිපාටි තවදුරටත් ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවති යුත්තේ ය.".

27. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ "41අ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්.

28. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේද මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX වන සහ XIXආ වන පරිච්ඡේද ලෙස බලපැවැත්විය යුතු ය:

"XIXඅ වන පරිච්ඡේදය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව**

156අ. (1) පාර්ලිමේන්තුව විසින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස නීතිය මගින් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. ඒ නීතිය මගින්-

(අ) ජනාධිපතිවරයා විසින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේ ම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ශනයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර,

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම සඳහා එසේ විධිවිධාන සලස්වන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත්කරනු ලැබූ කොමිෂන් සභාව විසින් තම මෙහෙයවීමෙන් ම හෝ එය වෙත කරන ලිඛිත පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම නීත්‍යානුකූල බවට වූ සුළු වෙනස් කිරීමට යටත්ව, එකී පනත අදාළ විය යුත්තේ ය.

XIXආ වන පරිච්ඡේදය

**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

156ආ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත වූ ද (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත හේතු දක්වා ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තේරී පත්වුවහොත් හෝ ඔහු විෂයයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබුවහොත් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයකුට ම, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැක පරිදි වූ දීමනාවක් ගෙවිය යුත්තේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර එකී සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලය අතරතුර එය අඩු නොකළ යුත්තේ ය.

156ඈ. (1) සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙනසුලු, තරගකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍යය වන්නේ ය. කොමිෂන් සභාව විසින් එකී උපමාන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) (1) වන අනුව්‍යවස්ථාවේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව-

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයෙන් අනුමත වූ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලසුම් මත පදනම්ව ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසුකරුවන්ට එකී භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිණිස සමාන අවස්ථා ලබා දී ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙනසුලු වන්නේ ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් ප්‍රසම්පාදන කමිටුවලට සහ ප්‍රසම්පාදනවලට සම්බන්ධ තාක්ෂණික ඇගයුම් කමිටුවලට පත් කරනු ලබන සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත් ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඉ) රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ උපමානවලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධරයන් වෙත වාර්තා කිරීම,

කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය.

156ඇ. (1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණෙන ලෙසට;

(ආ) එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නා වූ ද, යම් ලේඛනයක් හෝ දෙයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට,

නියම කරනු ලැබිය හැක්කේ ය.

(2) (අ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණෙන ලෙසට නියම කරනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාව ඉදිරියට පැමිණීමට අපොහොසත් වන;

(ආ) එවැනි දැන්වීමකට අනුකූල වෙමින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණ, එහෙත්, කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ දෙයක්, සාධාරණ හේතුවක් නොමැතිව, ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරන,

සෑම තැනැත්තකු ම වරදක් සිදුකරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකට ම (2) වන අනුව්‍යවස්ථාවේ දක්වා ඇති යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

156ඉ. (1) කොමිෂන් සභාව, එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කවර හෝ වාර ගණනක් රැස්විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි විට දී පැමිණ සිටින සාමාජිකයින් විසින් තමන් අතුරෙන් සභාපතිවරයකු එකී රැස්වීම සඳහා තෝරා පත්කර ගත යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ තීරණ, එකී තීරණ ගනු ලබන්නේ යම් රැස්වීමක දී ද, එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුත්තේ ය. ඡන්ද සමාන වන විටක සභාපතිවරයාට හෝ එකී රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, ඒ නොතකා කටයුතු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. එවැනි යම් පුරප්පාඩුවක් තිබූ පමණින් ම හෝ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා දෝෂයක් තිබූ පමණින් ම, කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

156ඊ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, එහි කර්තව්‍ය නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මහ ලේකම්වරයකු ද, වෙනත් යම් නිලධරයන් ද, කොමිෂන් සභාවට පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ නිලධරයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී හෝ ස්වකීය කර්තව්‍ය කිරීමේ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුත්තේ ය.

156උ. කොමිෂන් සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

156ඌ. මේ පරිච්ඡේදයේ "රජයේ ආයතනය" යන්නට, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක් රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඇතුළත් වේ.".

29. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" "රජයේ නිලධරයා" යන්නෙන්, අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ; එහෙත් ඊට-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) කථානායකවරයා;

(ඈ) 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ අමාත්‍යවරයෙක්;

(ඉ) 46 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(එ) 41ආ වන ව්‍යවස්ථාවේ සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සාමාජිකයෙක්;

(ඒ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඔ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(ඕ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ක) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ග) විගණකාධිපතිවරයා; සහ

(ච) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා,

ඇතුළත් නොවන්නේ ය.".

30. (1) (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින නවවන පාර්ලිමේන්තුව, එය කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, 2025 අගෝස්තු මස 19 වන දින තෙක් දිගට ම ක්‍රියා කළ යුතු අතර, ඉන්පසු එය විසිරෙන්නේ ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පිළිවෙළින් ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරය දරන තැනැත්තන් ඒ දිනයෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එම ධුර දැරිය යුතු වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා;

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්;

(ඈ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා;

(ඉ) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඊ) නීතිපතිවරයා;

(උ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා;

(ඌ) විගණකාධිපතිවරයා;

(එ) පොලිස්පතිවරයා;

(ඒ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);

(ඔ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඕ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්; හෝ

(ක) අධිකරණ නිලධරයන්, උපලේඛනගත රජයේ නිලධරයන්, රජයේ නිලධරයන් හෝ පොලිස් නිලධරයන්,

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම තවදුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, 41ඇ වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවට යටත්ව එම නියම හා කොන්දේසි යටතේ එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු ලෙස ධුරය දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලපවත්වන පරිදි පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු ලෙස ධුරය දැරීම නතර වන්නේ ය.

(4) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) මැතිවරණ කොමිෂන් සභාවේ;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ;

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ;

(ඊ) මුදල් කොමිෂන් සභාවේ; සහ

(උ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ,

සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස ධුරය දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලපවත්වන පරිදි ඒ ධුරය දැරීම නතර වන්නේ යඃ

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉහත සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු හෝ වශයෙන් ධුරය දරන තැනැත්තකුට එකී අදාළ කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදයට අනුකූලව ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම දිගටම කරගෙන යනු ලැබිය හැක්කේ ය.

(5) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා-

(අ) පොලිස් නිලධරයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් සම්බන්ධ සියලු කාරණා; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සියලු අභියාචන,

ඒ දිනයේ සිට බලපවත්වන පරිදි 155අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(6) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් සම්බන්ධ සියලු කාරණා ඒ දිනයේ සිට බලපවත්වන පරිදි 153අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

31. (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය හෝ අනුමතය ලබා ගැනීම සඳහා යම් ලිඛිත නීතියකින් නියම කර ඇති අවස්ථාවක දී, පාර්ලිමේන්තු සභාවට කරනු ලබන ඒ සඳහන, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු යයි ද; සහ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදයේ (xiii) වන අයිතමයේ දක්වා ඇති නුසුදුසුකමට යටත් වන්නා වූ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින නවවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට සුදුස්සෙක් නොවන්නේ යයි ද,

සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

32. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

**(107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:

1. මේ පනත 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

3. (1) නීති අධ්‍යාපන සභාව විසින් පවත්වනු ලබන ඔප්පු ලිවීම පිළිබඳ විභාගයෙන් සමත්ව ඇත්තා වූ සහ එක් අවුරුදු කාලයක් සඳහා නොතාරිස් ධුරයේ වැඩ කටයුතු ඉගෙන ගෙන ඇති බවට හා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ නිශ්චිතව දක්වා ඇති ඔප්පු ලිවීමේ පරිචයන්, රීති හා මාර්ගෝපදේශ පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ඇති බවට, අවම වශයෙන් අවුරුදු දහයක අනුගාමී කාලයක් නොතාරිස්වරයකු වශයෙන් ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි නීතිඥවරයකුගෙන් මෙහි දෙවැනි උපලේඛනයේ දක්වා ඇති ආ1 ආකෘතියේ ඇති සහතිකයක් ලබාගෙන ඇත්තා වූ ද සෑම නීතිඥවරයකුට ම, එසේ නීතිඥවරයකු ලෙස ඇතුළත් කර ගැනීමෙන් පසුව ඉල්ලීමක් කිරීමෙන්, තමා ඔප්පු ලිවීමේ විභාගය සමත් වී ඇති භාෂාවෙන් තමා පදිංචිව සිටින අධිකරණ කලාපය තුළ නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් ඇත්තේ ය.".

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා දී ඇති සෑම නොතාරිස්වරයකු ම, නොතාරිස්වරයකු ලෙස වෘත්තියේ යෙදීම ආරම්භ කිරීමට පෙරාතුව, වැඩ ආරම්භ කිරීමේ ලිපියක් අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) නොතාරිස්වරයකු ලෙස ස්වකීය කාර්ය යථා පරිදි ද විශ්වසනීය ලෙස ද ඉටුකිරීම සඳහා, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වන රුපියල් දසදහසක මුදලක් තැන්පත් කර මහාධිකරණය ඉදිරියෙහි ඇපකරයක් ලියා අත්සන් කරනු ලැබිය යුතු යත සහ";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සෑම ඇපකරයක් ම නොතාරිස් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහාධිකරණ විනිශ්චයකාරවරයා ඉදිරියෙහි අත්සන් කරනු ලැබිය යුතු ය.";

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ඉහත සඳහන් එකී ඇපකරය සහ සුරැකුම" යන වචන වෙනුවට "ඉහත සඳහන් එකී ඇපකරය" යන වචන සහ "රුපියල් දස දහසකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් විසි පන් දහසකට නොඅඩු" යන වචන අදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපකරය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:

"(1) නොතාරිස්වරයකුට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා නගා ඇති අවස්ථාවක නීතිපතිවරයාගේ ඉල්ලීම මත, අමාත්‍යවරයා විසින්, එකී නොතාරිස්වරයාගේ නඩු විභාගය පැවැත්වෙනතුරු ඔහු නොතාරිස් ධුරයේ කාර්ය ඉටුකිරීමෙන් අත්හිටුවනු ලැබිය හැකි ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "අමාත්‍යවරයාගේ මතය අනුව," යන වචන වෙනුවට "මේ ආඥාපනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "අශක්නුතාව, වයස" යන වචන වෙනුවට "අශක්නුතාව" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(ආ) එහි (4) වන උපවගන්තියේ "රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් දස දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ "රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපය" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපය" යන වචනය ඇතුළත් කිරීමෙන්;

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "මාර්තු" යන වචනය වෙනුවට "අප්‍රේල්" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) සෑම නොතාරිස්වරයකු විසින් ම, ඔහු පෙර වර්ෂයේ ලියා සහතික කරන ලද සියලු ඔප්පුවල හෝ සාධන පත්‍රවල අනුපිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවා ඇති බවට දිවුරුම් ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(3) ඔහු, තමා ඉදිරිපිට ලියා අත්සන් කරන ලද හෝ ලියා අත්සන් කිරීමට නියමිත යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සම්පූර්ණයෙන් ලියනු ලබන තෙක් හෝ එය සුලේඛනය කරනු ලබන තෙක්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන්නකුට හෝ යම් සාක්ෂිකරුවකුට, එකී ඔප්පුවට හෝ සාධන පත්‍රයට හෝ එහි අනුපිටපතට හෝ නොතාරිස්ගේ පිටපතට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ අත්සන හෝ සලකුණ යෙදීමට හෝ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීමට අවසර දීම හෝ එවැනි අත්සන් තැබීමක්, සලකුණක් යෙදීමක් හෝ අතේ හෝ පාදයේ ඇඟිලි සලකුණ තැබීමක් සිදුවීමකට ඉඩ නොදිය යුතු යත හෝ එවැනි යම් කාර්යයක් සඳහා පසුව භාවිත කිරීමට අදහස් කරන යම් කඩදාසියක හෝ කොළයක එකී ලියා අත්සන් කරන්නාට හෝ සාක්ෂිකරුට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ අත්සන හෝ සලකුණ යෙදීමට සහ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට අඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීම නොකළ යුතු ය. කිසිදු අවස්ථාවක යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සඳහා වූ හිස් කඩදසියකට හෝ යම් අසම්පූර්ණ ආකෘති පත්‍රයකට එකී ලියා අත්සන් කරන්නාගේ අත්සන ගැනීම හෝ වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක සලකුණක් හෝ පාදයේ ඇඟිල්ලක සලකුණක් ගැනීම නොකළ යුතු ය.";

(2) එහි (4) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(4) කල් පවතින පාච්මන්ට් කඩදාසියක හෝ නිල් කඩදාසියක ලියා, යතුරු ලියනය කර හෝ මුද්‍රණය කර ඇත්නම් මිස, ඔහු විසින් යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා සහතික කිරීම හෝ සත්‍යාපනය කිරීම නොකළ යුතු ය.";

(3) එහි (5) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(5) (අ) ඔහු විසින්, බෙදා වෙන් නොකරන ලද එක් තනි කොළයක හෝ නිල් කඩදාසියක ලියනු ලබන යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම කළ යුතු ය; හෝ

(ආ) ඔහු වෙන් වූ කොළ දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යොදා ගනු ලබන අවස්ථාවක, ඔහු විසින්-

(i) සෑම පිටුවක් ම අංකනය කළ යුතු ය;

(ii) එහි එක් එක් කොළයේ ඔහුගේ අත්සන තැබිය යුතු ය; සහ

(iii) අවස්ථාවෝචිත පරිදි, සෑම ලියා අත්සන් කරන්නකුට ම, (මෙහි මින්මතු ඇටෝර්නි බලකරු" ලෙස සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකුට ම හෝ යම් සංස්ථාපිත මණ්ඩලයක බලයලත් තැනැත්තකුට ම එහි එක් එක් කොළයේ සිය අත්සන සහ වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට සැලැස්විය යුතු ය.";

(4) එහි (6) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

(6) නියමිත මුද්දර ගාස්තු ලබා දී ඇති බවට සහතික වශයෙන් දන්නේ නම් මිස, ඔහු විසින් යම් සාධන පත්‍රයක් සත්‍යායනය කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය.";

(5) එහි (7) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :-

(7අ) (අ) මේ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් ලිඛිත නීතියක් යටතේ ලියා අත්සන් කරන ලද පැවරුමක්, තෑග්ගක් හෝ හුවමාරුවක් සම්බන්ධයෙන් වන සියලු ඔප්පු හෝ සාධන පත්‍ර සඳහා ගෙවිය යුතු යම් මුද්දර ගාස්තුවක් නොතාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

(ආ) එකී මුදල ගෙවනු ලැබීම සනාථ කරන අදාළ රාජ්‍ය බැංකුවෙන් නොතාරිස්වරයා ලද කුවිතාන්සියෙහි මුල් පිටපත, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අනුපිටපතට ඇමිණිය යුතු ය.

(ඇ) එම කුවිතාන්සියේ පිටපත්, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට සහ නොතාරිස්ගේ පිටපතට ඇමිණිය යුතු ය.".

(6) එහි (9) වන රීතියේ යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තාව ඔහු විසින් හෝ එය සහතික කරන සාක්ෂිකරුවන්ගෙන් අවම වශයෙන් දෙදෙනකු විසින් හඳුනන්නේ නම් මිස, ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම නොකළ යුතුය;" යන වචන වෙනුවට යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තන්ගෙන් එක් අයකු හෝ එය සහතික කරන සාක්ෂිකරුවන් දෙදෙනා ඔහු විසින් හඳුනන්නේ නම් මිස හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තන්ගේ අනන්‍යතාව, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුව හෝ රියදුරු බලපත්‍රය පරීක්ෂා කිරීමෙන් ඔහු විසින් තහවුරු කරන්නේ නම් මිස, ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(7) එහි (14) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(14) ඔහු විසින්, ඔප්පුවට හෝ සාධන පත්‍රයට යම් ලියා අත්සන් කරන්නකු හෝ සාක්ෂිකරුවකු අත්සන් කිරීමට හෝ සලකුණු තැබීමට පෙර හා යම් ලියා අත්සන් කරන්නකු වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට පෙර, සහ යම් ඔප්පුවක හෝ සාධන පත්‍රයක ලියා අත්සන් කරන්නකු සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, එහි මුද්‍රාව තැබීමට සලස්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්සන් හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය අත්සන් කිරීමට යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ අත්සන ලබා ගැනීමට පෙර, එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් නිශ්චය කර ගත යුතු අතර, එකී යම් ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවකුගේ නම අනන්‍යතා ලේඛනවල සඳහන් නමට වඩා වෙනස් වේ නම්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය සහතික කිරීමේ දී එම නමින් සහ අත්සනේ ලියන ලද නමින් එකී ලියා අත්සන් කරන්නා හෝ සාක්ෂිකරුවා විස්තර කළ යුතු ය. ලියා අත්සන් කරන තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක, එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ නොතාරිස්ගේ පිටපතට, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තාට බලය පවරමින් අධ්‍යක්ෂ මණ්ඩලය කළ යෝජනා සම්මතයේ පිටපතක් ඔහු විසින් ඇමිණිය යුතු ය.";

(8) එහි (15) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

(15අ) (1) (අ) නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන සෑම-

(i) ලියා අත්සන් කරන්නකු ම;

(ii) ඇටෝර්නි බලකරුවකු ම; හෝ

(iii) සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ බලයලත් තැනැත්තකු ම,

(15) වන රීතියේ විධිවිධානවලට අතිරේකව, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනු පිටපතේ සහ නොතාරිස්ගේ පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක මහපට ඇඟිල්ලේ සලකුණ තැබිය යුතු ය.

(ආ) ලියා අත්සන් කරන්නෙකුගේ, ඇටෝර්නි බලකරුවකුගේ හෝ බලයලත් තැනැත්තකුගේ මහපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි වන අවස්ථාවක, එවැනි ලියා අත්සන් කරන්නකු, ඇටෝර්නි බලකරුවකු හෝ බලයලත් තැනැත්තකු එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනුපිටපතේ සහ නොතාරිස් පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක ඇඟිලි සලකුණ හෝ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු ය.

(ඇ) ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ඇටෝර්නි බලකරු විසින් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් තබන වේලාවේ දී එම ඇටෝර්නි බලපත්‍රය අව්‍යාජ හා වලංගු බවටත්, ඇටෝර්නි බලපත්‍රයේ දීමනාකරු ජීවත්ව සිටින බවටත් තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් ඇටෝර්නි බලකරු විසින් නොතාරිස්වරයා වෙත ලබාදිය යුතු ය.

(ඈ) දීමනා ලාභියා බාලවයස්කරුවකු වන විට, නෛතික භාරකරු හෝ භාරකරු මෙම වගන්තියේ අරමුණු සඳහා දීමනා ලාභියා වෙනුවෙන් ක්‍රියා කිරීමට ශක්නුතාව ඇති පුද්ගලයකු විය යුතු ය.";

(9) එහි (16) වන රීතියේ-

(අ) එහි (අ) ඡේදයේ, "එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද, සහාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන විට දී සහාධිපත්‍ය කොටස හඳුනාගත හැකි අවස්ථාවක දී, එකී සහාධිපත්‍ය කොටස සහ අනෙකුත් මූලිකාංග පිළිබඳ විස්තර ද, සහාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි අවස්ථාවක දී, සම්පූර්ණ ඉඩමේ හෝ ඉඩම් කොටස පිළිබඳ විස්තර ද"; සහ

(ආ) එහි (ආ) ඡේදයේ, "එය නොබෙදූ කොටසක් වන්නේ නම්, එය කොටසක් වන ඉඩමේ මායිම් සහ බිම් ප්‍රමාණය ද සඳහන් කරනු ලැබිය යුතු යඃ එසේ වුව ද," යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා වන වචන වෙනුවට "එය නොබෙදූ කොටසක් වන්නේ නම්, එය කොටසක් වන ඉඩමේ මායිම් සහ ප්‍රමාණය සඳහන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(10) (අ) එහි (17) වන රීතියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) (i) ඔහු විසින්, එකී ඉඩමට හෝ නිශ්චල දේපළට සම්බන්ධ හිමිකාරිත්වය සහ ලියාපදිංචි බැඳීම් අන්තර්ගත එකී ඉඩමට හෝ නිශ්චල දේපළට අදාළ අවසාන සටහන අන්තර්ගත පත් ඉරුවේ සහතික කරන ලද උද්ධෘතය අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබා ගත යුතු ය;

(ii) යම් ඔප්පුවක් පෙර ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, ඔහු විසින්, ඔප්පුව පෙර ලියාපදිංචි කරනු ලැබ ඇති වෙළුමේ සහ පත් ඉරුවේ අංකය ඔප්පුවේ මුල් පිටුවේ ලිවීම හෝ මුද්‍රණය කිරීම කළ යුතු ය;

(iii) පැවරුම් ඔප්පුවක් හෝ තෑගි ඔප්පුවක් හෝ හුවමාරු ඔප්පුවක් හෝ අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී, ඔහු විසින්, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට පාර්ශ්වයන්ගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ සහතික කරන ලද ඡායාරූප අලවා ඔහුගේ මුද්‍රාව තැබිය යුතු අතර ජාතික හැඳුනුම්පතේ, විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපත් නොතාරිස්ගේ පිටපතට අමුණා තැබිය යුතු ය;";

(ආ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) ඔහු විසින් ඔප්පුවේ මුල් පිටුවේ ඔහුගේ සම්පූර්ණ නම, නොතාරිස්වරයාට ලබා දී ඇති අංකය, ඔහුගේ කාර්යාලයේ ලිපිනය සහ දුරකථන අංකය ලිවිය යුතු ය. ඔහු යම් සංවිධානයක, ආයතනයක හෝ සමාගමක සේවය කරන නීති නිලධරයකු වන්නේ නම්, ඔහු විසින් එම සංවිධානයේ, ආයතනයේ හෝ සමාගමේ ලියාපදිංචි ලිපිනය නිශ්චිතව දැක්විය යුතු ය;

(ඈ) යම් ඔප්පුවක හෝ සාධන පත්‍රයක පාර්ශ්වයක් සංස්ථාපිත ආයතනයක් වන්නේ නම්, ඔහු විසින්, එම සංස්ථාපිත ආයතනය සංස්ථාගත කිරීමේ සහතිකයේ හෝ එය පිහිටුවන වෙනත් සාධන පත්‍රයක සහතික කරන ලද පිටපතක් සහ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර රඳවා තබා ගත යුතු ය; සහ

(ඉ) භාරයකට අදාළ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට දී, ඔහු විසින්, භාර ඔප්පු යටතේ කටයුතු කරන භාරකරුවන්ගේ නම්, ලිපින සහ ජාතික හැඳුනුම්පත් අංක සහ, ඔප්පුව ලියා අත්සන් කිරීමට ඔවුන් වෙත බලය ලබා දී ඇත්තේ භාර ඔප්පුවේ කවර වගන්තියක් යටතේ ද එම වගන්තිය ද තම සහතිකයේ දැක්විය යුතු අතර භාර ඔප්පුවේ පිටපතක් ද රඳවා තබා ගත යුතු ය.";

(11) එහි (20) වන රීතියේ-

(අ) එහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන්නන් ඔහු දන්නේ ද යන්න හෝ ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුව හෝ රියදුරු බලපත්‍රය පරීක්ෂා කිරීමෙන් ඔවුන්ව හඳුනාගනු ලැබුවේ ද යන්න හෝ ඔහු එහි සාක්ෂිකරුවන් දන්නේ ද යන්න වග සහ, අවසානයට දක්වන ලද අවස්ථාවේ දී නම්, එකී සාක්ෂිකරුවන් හඳුනන්නේ ලියා අත්සන් කරන්නන්ගෙන් කවරෙක් ද හෝ ඔප්පුව හෝ සාධන පත්‍රය පිළිගන්නා කවර තැනැත්තා ද යන වග සඳහන් කළ යුතු ය.";

(ආ) එහි (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) ඔහු ඉදිරිපිට දී, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ ප්‍රතිෂ්ඨාව හෝ ප්‍රතිෂ්ඨාවේ කොටසක් වශයෙන් යම් මුදලක් ගෙවනු ලැබුවේ ද යන්න සහ එසේ ගෙවනු ලැබුවේ නම්, සත්‍ය වශයෙන්ම ගෙවන ලද එකී මුදල් ප්‍රමාණය දේශීය ව්‍යවහාර මුදලින් සහ එය ගෙවන ලද්දේ චෙක් පතකින්, ගෙවීම් නියෝගයකින්, බැංකු අණකරයකින් හෝ බැංකුකරුවාගේ චෙක් පතකින් නම්, එම සාධන පත්‍රයේ විස්තර, එකී ගෙවීමට සාක්ෂියක් වශයෙන්, ඔප්පුවේ සහතිකයේ දක්වනු ලැබිය යුතු ය."; සහ

(ඇ) එහි (උ) ඡේදයේ "මකා දැමීම, වෙනස් කිරීම සහ අන්තර් නිවේශන තිබේ නම්, ඒවා කර ඇත්තේ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අත්සන්වලට, අංකවලට හෝ යොදන ලද මුද්දර මත ලියන ලද්දකට ද යන බව" යන වචන වෙනුවට "මකා දැමීම, වෙනස් කිරීම් සහ අන්තර් නිවේශන තිබේ නම්, ඒවා කර ඇත්තේ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අත්සන්වලට, අංකවලට හෝ යොදන ලද මුද්දර මත ලියන ලද්දකට යන බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) එහි (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඌ) අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී-

(i) තෙස්තමේන්තුකරු අන්තිම කැමති පත්‍රය ලියා අත්සන් කිරීමට යහපත් සහ මනා සිහියෙන් යුතු ව සිටි බව අන්තිම කැමති පත්‍රය සහතික කිරීමේ දී දැක්විය යුතු ය; සහ

(ii) ඔහු විසින් පවත්වාගෙන යනු ලබන ඔප්පු නාමලේඛනයක, එම අන්තිම කැමති පත්‍රයට පවරා ඇති අංකය, දිනය සහ තෙස්තමේන්තුකරුගේ නම ඇතුළත් කළ යුතු ය.";

(12) එහි (27) වන රීතිය ඉවත් කිරීමෙන්;

(13) එහි (30) වන රීතියේ, "ඔහු විසින්, නොතාරිස්ගේ පිටපත සමග ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රයේ සත්‍ය පිටපතක් සුරක්ෂිතව තබාගත යුතු වන අතර" යන වචනවල සිට එම රීතියේ අවසානය දක්වා වන වචන වෙනුවට, "ඔහු විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගත් ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක් මුල් පිටපතට ද එහි සත්‍ය පිටපත් එහි අනුපිටපතට සහ නොතාරිස්ගේ පිටපතට ද අමුණනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(14) එහි (30) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

(30අ) ඔහු විසින් සහතික කරනු ලබන සෑම ඔප්පුවක් ම හෝ සාධන පත්‍රයක් ම ඒවා ලියා සහතික කළ දිනයේ සිට දින තිහක් ඉකුත් වීමට පෙර ලියාපදිංචිය සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම සෑම නොතාරිස්වරයකුගේ ම වගකීම විය යුතු ය:

එසේ වුව ද, ඔහු වෘත්තියෙහි නියැලෙන බල ප්‍රදේශයෙන් පිටත දී යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා සහතික කළ දිනයේ සිට දින හැටක් ඉකුත්වීමට පෙර ලියාපදිංචිය සඳහා ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

34. (1) (අ) 31 වන වගන්තියේ දක්වා ඇති (1) වන, (31) වන හෝ (32) වන රීති උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

(ආ) 31 වන වගන්තියේ දක්වා ඇති (2) වන, (3) වන, (6) වන, (7) වන, (11) වන, (18) වන, (21) වන, (23) වන, (24) වන හෝ (30අ) වන රීති උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය; හෝ

(ඇ) 31 වන වගන්තියේ දක්වා ඇති වෙනත් යම් රීතියක් උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් නොතාරිස්වරයකු විසින්, 31 වන වගන්තියේ දක්වා ඇති (26) වන රීතියේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීතිය පැහැර හරින හෝ නොසලකා හරින අවස්ථාවක දී, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, පෞද්ගලිකව ඔහු වෙත බාර දෙනු ලබන හෝ ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එකී දැන්වීමේ කාර්යය සඳහා එකී දැන්වීමෙහි ඔහු විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් වැඩිදුර කාලසීමාවක් තුළ එකී රීතියේ නියමයන්ට අනුකූල වන ලෙසට එකී නොතාරිස්වරයාට නියම කරනු ලැබිය හැකි ය. එකී නොතාරිස්වරයා එකී දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, නොතාරිස්වරයා ඔහුගේ ධුරයෙහි කාර්ය ඉටුකිරීමෙන් අත්හිටුවනු ලැබිය හැකි ය.

(3) තම බලපත්‍රය අත්හිටුවනු ලැබ ඇති නොතාරිස්වරයකු විසින්, එකී අත්හිටුවීමේ දැන්වීම ලැබුණු දිනයේ සිට, කිසිදු ඔප්පුවක් හො සාධන පත්‍රයක් සහතික කිරීම සිදු නොකළ යුතු ය.

(4) එකී අත්හිටුවීමේ දැන්වීමේ පිටපතක් අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය හෝ අධිකරණ පරිශ්‍රවල ප්‍රදර්ශනය කරන ලෙස නියම කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සහ මහාධිකරණ, දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් වෙත වහාම නිවේදනය කළ යුතු ය.

(5) අත්හිටුවීමේ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමා තුළ අනුපිටපත් ඉදිරිපත් කිරීම පැහැර හරින නොතාරිස්වරයකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු අතර අමාත්‍යවරයා විසින්, තත් කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා කරනු ලබන ඉල්ලීමක් මත, එකී නොතාරිස්වරයාගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් විසි පන් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඇ) ඡේදයේ "අත්සන හෝ සලකුණ" යන වචන වෙනුවට "අත්සන සහ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපටඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) "අවුරුදු පහකට නොවැඩි යම් කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "අවුරුදු දහයකට නොවැඩි යම් කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් ලක්ෂයක දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු අතර, (අ) ඡේදයේ සිට (උ) ඡේදය දක්වා වන ඡේදවල

නිශ්චිතව දක්වා ඇති නොතාරිස්වරයකුගේ ක්‍රියාවක් හේතුවෙන් යම් අලාභයක් හෝ පාඩුවක් ලබා තිබෙන යම් තැනැත්තකු වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වන්දි මුදලක් ගෙවීමට ද යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලිත් මාස දොළහකට නොවැඩි යම් කාලයකට සුළු හෝ බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කරනු ලැබීමට"යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ "මහාධිකරණ විනිශ්චයකාරවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""නීති අධ්‍යාපන සභාව" යන්නට, (276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 2 වන වගන්තිය මගින් ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලියා අත්සන් කරන්නා" යනුවෙන්-

(අ) විකිණීමේ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට විකුණුම්කරු සහ ගැනුම්කරු; සහ

(ආ) අනෙකුත් ඔප්පු හෝ සාධන පත්‍ර සම්බන්ධයෙන් වන විට එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ පාර්ශ්වකරුවන්,

අදහස් වේ.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි "ආ" ආකෘතියට ඉක්බිතිව ම ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ1" ආකෘතිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:

"ආ1 ආකෘතිය

[3 වන වගන්තිය]

................................... අධිකරණ කලාපයේ නීතිඥවරයකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වන ......................... වන මම, ................ ................. දින සිට නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම ආරම්භ කරන ලද බවත් අනුගාමී අවුරුදු දහයක කාලයක් වෘත්තියෙහි ක්‍රියාකාරීව නියැලී සිටි බවත්, නීතිඥ ....................................මයා/මිය/මෙනෙවිය ............................ ......දින සිට අවුරුද්දක කාලයක් මා යටතේ නොතාරිස් වෘත්තිය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කළ බවත් මෙයින් සහතික කරමි.

දිනය : ...................................

...................................

අත්සන

නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්

(මුද්‍රාව)";

(2) එම උපලේඛනයේ "ඉ" ආකෘතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"ඉ ආකෘතිය

[31 (21) වන වගන්තිය]

සහතික කිරීමේ ආකෘතිය

..................................... යන අධිකරණ කලාපයේ ..................................................... (නොතාරිස්වරයාගේ ලිපිනය) හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් ................................. වන මම පිළිවෙළින්, (අපැහැදිලි ලෙස අවස්ථාවෝචිත පරිදි ...................ලෙස අත්සන් කරන ලද) මෙහි අත්සන් කරනු ලබන සාක්ෂිකරුවන් වන ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර/ රියදුරු බලපත්‍ර අංක .........................දරන (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය ඇතුළත් කරන්න) යන අය ඉදිරිපිට දී (අපැහැදිලි ලෙස/අවස්ථාවෝචිත පරිදි/ ජුවානිස්"ලෙස) අත්සන් තබනු ලැබුවා වූ ද සහ ස්වකීය (වම්/දකුණු මහපට ඇඟිල්ලේ හෝ වෙනත් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක) සලකුණ තැබුවා වූ ද, මෙම ඔප්පුවේ ලියා අත්සන් කරන්නන් වන ( ලියා අත්සන් කරන්නන්ගේ නම් ඇතුළත් කරන්න) තැනැත්තන් වෙත, එකී නොතාරිස් තැන වන මා විසින් කියවා දෙනු ලැබූ බවත්, (හෝ කියවා තේරුම්කර දෙනු ලැබූ බවත්) එම සාධන පත්‍රයට එකී ලියා අත්සන් කරන තැනැත්තන් විසින් ද, එකී සාක්ෂිකරුවන් විසින් ද සහ එකී නොතාරිස්වරයා වන මා විසින් ද, මා ඉදිරිපිට දී ත් සහ ඔවුනොවුන් ඉදිරිපිට දී ත් සියලු දෙනාම එකවර එක්ව සිටිය දී ත් වර්ෂ ................. වූ ..... ............................ මස ............................. දින ............................. දී අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

තව ද, ................................... (ලියා අත්සන් කරන්නා මා දන්නා බවත්/ සාක්ෂිකරුවන් මා දන්නා බවත්/ඔවුන්ගේ (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය) පරීක්ෂා කිරීම මගින් ඔවුන්ගේ අනන්‍යතාව මා විසින් පරීක්ෂා කරන ලද

බවත්) තව ද, ඉහත සඳහන් කරන ලද සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර ලියා අත්සන් කරන්නාගේ/ කරන්නන්ගේ ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය මා විසින් පරීක්ෂා කරන ලද බව ද මෙයින් සහතික කරමි.

තව ද, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට ලියා අත්සන් කරන්නාගේ මෑතක දී ගත් ඡායාරූප ඇල වූ බව ද, (පැවරුම් හෝ තෑගි ඔප්පු සම්බන්ධයෙන් වන විට) රු. ...................................... (ඉලක්කමෙන්) වටිනාකමකට සරිලන සේ .............................. පළාත් සභාවේ නමට බැර වන පරිදි ............................... රාජ්‍ය බැංකුවට මුදල් ගෙවා ලබා ගන්නා ලද අංක .................. හා ........................... දින දරන මුද්දර ගාස්තු ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත ඔප්පුවේ අනු පිටපතට ද, එහි පිටපත් ඔප්පුවේ මුල් පිටපතට හා නොතාරිස්වරයාගේ පිටපතට ද (අනෙක් සෑම අවස්ථාවක දී ම) ඔප්පුවේ මුල් පිටපතට ............................. වටිනාකමකින් යුතු මුද්දර ........................ සංඛ්‍යාවක් ද, අනුපිටපතට රු. ...................................................... වටිනාකමකින් යුතු මුද්දර ......................................... සංඛ්‍යාවක් ඇල වූ බව ද, මම මෙයින් සහතික කරමි.

තව ද, මෙහි සඳහන් ප්‍රතිෂ්ඨාව මා ඉදිරිපිට දී ගැනුම්කරු විසින් විකුනුම්කරුට/බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරුට ගෙවන ලද බවත්, මා ඉදිරිපිට දී හෝ නොගෙවන ලද මුත් ගැනුම්කරු/බදු ගැනුම්කරු වෙතින් එම ප්‍රතිෂ්ඨාව ලද බවට විකුනුම්කරු/බදු දීමනාකරු විසින් පිළිගන්නා ලද බවත් මම මෙයින් සහතික කරමි.

තව ද, මෙහි සඳහන් ප්‍රතිෂ්ඨාව මා ඉදිරිපිට දී ගැනුම්කරු විසින් විකුණුම්කරුට/ බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවන ලද බවත් හෝ මා ඉදිරිපිට දී නොගෙවන ලද නමුත් මෙහි ලියා අත්සන් කිරීමට පෙර එම ප්‍රතිෂ්ඨාව ගැනුම්කරුගෙන් හෝ බදු ගැනුම්කරුගෙන් ලද බවට (විකුණුම්කරු/බදු දීමනාකරු විසින් පිළිගන්නා ලද බවත්) මම වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

තව ද, (අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට) අන්තිම කැමති පත්‍රය ලියා අත්සන් කිරීම සඳහා අන්තිම කැමතිපත්‍රකරු මනා සිහිකල්පනාවෙන් යුතු ව සිටි බව ද, මම වැඩිදුරටත් සහතික කරමි.

තව ද, මෙය ලියා සහතික කිරීමට පෙර ............... පිටුවේ .......... පේළියේ ......... වචන/අකුරු (මකා හැර එයට උඩින් තීන්තෙන් ලියන ලද බවත්/ කපා හරින ලද බවත්) මම වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

(ඇටෝර්නි බලකරුවකු සම්බන්ධයෙන් වන විට) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික පිටපතක් මෙම ඔප්පුවේ මුල් පිටපතට ද, එහි සත්‍ය පිටපත් දෙවන පිටපතට සහ නොතාරිස්වරයාගේ පිටපතට ද අමුණා ඇති බව ද සහතික කරමි.

එමෙන්ම මා විසින් මාගේ වාර්ෂික නොතාරිස් බලපත්‍රය අලුත් කරගෙන ඇති බව ද/ඒ සඳහා ඉල්ලුම් කර ඇති බව ද සහතික කරමි.

................................

දිනය

................................

අත්සන

ප්‍රසිද්ධ නොතාරිස්

(මුද්‍රාව)”.

23. සැක දුරුකිරීම සඳහා, මේ පනතේ විධිවිධාන-

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර නීත්‍යානුකූලව ලියා අත්සන් කරන ලද සහ (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචිය අවසන්ව නොමැති යම් ඔප්පුවකට හෝ සාධන පත්‍රයකට බලනොපාන බවට;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් හෝ ඔප්පුවක් මත යම් මුද්දර ගාස්තු අය කර ගැනීමට හෝ පියවා ගැනීමට යම් පළාත් සභාවක් සතු බලතලවලට අගතියක් නොමැති බවට;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර අධිකරණයක් ඉදිරියේ විභාග කර අවසන් ව නොමැති යම් අපරාධ හෝ සිවිල් නඩුවකට අධිකරණයක් විසින් ලබා දෙන ලද යම් තීන්දුවකට බලනොපාන බවට;

(ඇ) මේ පනත ක්‍රියත්මක වීම ආරම්භ වන දිනට පෙර සිය වෘත්තීමය කටයුතු ආරම්භ කර ඇති නොතාරිස්වරයකු ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට අනුව ඇපකරයක් අත්සන් තැබීමේ වගකීමට යටත් නොවන බවට,

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

24. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 32 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) (අ) (මෙහි මින් මත "ඉඩම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩමකට, නොබෙදූ ඉඩමකට, ඉඩම් කොටසකට හෝ සහාධිපත්‍ය කොටසකට-

(i) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ; හෝ

(ii) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇති බවට හිමිකම්පාන්නා වූ,

(මෙහි මින් මතු "කේවියට්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින්, එකී ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමක් පිළිබඳ ව තමා වෙත දැන්වීමක් කළ යුතු බවට නියම කරමින්, මෙහි දෙවන උපලේඛනයේ VIII වන ආකෘතියෙහි වූ කේවියට් තහනමක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම කේවියට් තහනමක් ම-

(i) පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒ සමඟ, එකී ඉඩමට කේවියට්කරුට ඇති අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව හෝ කේවියට්කරු විසින් ඉඩම සම්බන්ධයෙන් හිමිකම්පාන්නා වූ අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව සනාථ කරන කේවියට්කරුගේ දිවුරුම් පෙත්සමක් සහ නීතිඥවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ii) කේවියට්කරු හිමිකරු නොවන අවස්ථාවක, එකී ඉඩම ලියාපදිංචි කර ඇති අදාළ වෙළුමේ සහ පත් ඉරුවේ නම් සහ ලිපින සඳහන් හිමිකරුවන් වෙත භාර දෙනු ලැබීම සඳහා, මුද්දර යෙදූ ලිපිකවර සමඟ දෙවන උපලේඛනයේ දක්වා ඇති X වන ආකෘතියෙහි වන දැන්වීමක පිටපත් අවශ්‍ය සංඛ්‍යාවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(iii) කේවියට්කරු, (මින් මතු "ඇටෝර්නි බලකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකු වන අවස්ථාවක දී, (මින් මතු "රෙජිස්ට්‍රාර්" යනුවෙන් සඳහන් කරනු ලබන) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ අදාළ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපතේ සහතික කළ පිටපතක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(iv) කේවියට්කරුගේ නම, අත්සන සහ ජාතික හැඳුනුම්පතේ අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය, හෝ රියදුරු බලපත්‍රයේ අංකය කේවියට් තහනමට අදාළ දැන්වීම් භාරදිය යුතු කේවියට්කරුගේ ශ්‍රී ලංකාවේ ලිපිනය, කේවියට් තහනමේ දිනය, කේවියට්කරු හිමිකරු නොවන අවස්ථාවක දී කේවියට් තහනම පිළිබඳ දැන්වීම යැවිය යුතු තැනැත්තන්ගේ නම් සහ ලිපින, ඉඩමට කේවියට්කරු විසින් හිමිකම් පාන අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව, හිමිකම් පෑම තහවුරු කරන්නා වූ කරුණු, මායිම් හා ඉඩම ලියාපදිංචි කළ නිවැරදි වෙළුම හා පත්ඉරුව දක්වන ඉඩම පිළිබඳ විස්තරයක් ද, ඇතුළත් විය යුතු ය.

(ඇ) මෙම වගන්තියේ කාර්යය සඳහා-

(i) "කේවියට්කරු" යන්නට, සංස්ථාවක්, ඉඩමකට අදාළ යම් භාරයක අර්ථලාභියා, බාලවයස්කරුවකුගේ, සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ නීත්‍යානුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා, විනිශ්චිත ණයකරු, මරණකරුවකුගේ බූදලයක පොල්මඃකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නීත්‍යානුකූල උරුමකරුවකු හෝ ඉඩමක හිමිකරු සමඟ ගිවිසුම්ගතව ඇති අපේක්ෂිත ගැනුම්කරුවකු හෝ ඉඩමක් සංවර්ධනය කරන්නකු අයත් වේ;

(ii) "සහාධිපත්‍ය කොටස" යන්නෙන්, 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ 10 වන වගන්තිය අනුව 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ මෙම ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද සහාධිපත්‍ය කොටසක් අදහස් වේ; සහ

(iii) "සම්බන්ධතාවක්" යන්නට, ක්ෂණිකව ලියාපදිංචි කළ නොහැකි වන්නා වූ ඉඩමකට අදාළ ලියාපදිංචි නොකළ ඔප්පුවකින් හෝ සාධන පත්‍රයකින් පැනනගින්නා වූ, භාරයකින් පැනනගින්නා වූ, අන්තිම කැමති පත්‍රයක් හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව අනුප්‍රාප්තියක් මගින් ලද උරුමයකින් පැනනගින්නා වූ, උකස් කිරීම් හෝ විකුණුම් ගිවිසුමකට අදාළ සාධන පත්‍රවලින් පැනනගින්නා වූ, සම හිමිකාරත්වයකින් පැනනගින්නා වූ හෝ බාලවයස්කාරයකුගේ හෝ සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ බූදලයකින් පැනනගින්නා වූ,

සම්බන්ධතාවක් ද ඇතුළත් වේ.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) රෙජිස්ට්‍රාර්වරයා විසින්, කේවියට්කරු (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් අවශ්‍ය සියලු ලේඛන හා තොරතුරු සපයා ඇති බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව, එකී කේවියට් තහනම ලද බවට දන්විය යුතු අතර, 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් නියමිත තොරතුරු වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(1ආ) ලද බව දන්වීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ කේවියට්කරු විසින් නම් හා ලිපින ලබා දුන් තැනැත්තන් වෙත වහාම දන්වනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (සස) වන අනුඡේදයේ සඳහන් දැන්වීම යවන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින වෙනත් කරුණු තීරයේ සටහන් කළ යුතු ය.";

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) කේවියට් තහනමක් උපරිම අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.";

(4) එහි (4) වන උපවගන්තියේ "කේවියට්කරු වෙත යවනු ලබන දැන්වීම, නියමිත ආකෘතියේ විය යුතු ය" යන වචන වෙනුවට "කේවියට් තහනමේ විස්තර කර ඇති එකී ඉඩම සම්බන්ධයෙන් සාධන පත්‍රයන් ලියාපදිංචිය සඳහා ඉන් පසුව ඉදිරිපත් කර ඇති අවස්ථාවක, කේවියට්කරුට දෙවන උපලේඛනයේ XI හි සඳහන් ආකෘතියෙහි වූ දැන්වීමක් යැවිය යුතු ය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එහි (5) වන උපවගන්තියේ "බලයලත් අධිකරණයක් මඟින් දින තිහක් ඇතුළත" යන වචන වෙනුවට "බලයලත් අධිකරණයක් විසින් දින හැටක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "තහනම් පූර්වතා දැන්වීමක්, කේවියට් තහනමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන වෙනුවට "තහනම් පූර්වතා දැන්වීමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (අ) කේවියට් තහනමක්-

(i) කේවියට්කරු විසින්;

(ii) ඇටෝර්නි බලකරු විසින්;

(iii) කේවියට්කරු මිය යාමේදී, පොල්මඃකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නෛතික උරුමකරුවකු විසින්;

(iv) කේවියට් තහනම ඉදිරිපත් කර ඇත්තේ බාල වයස්කරුවකු, සිහිවිකල තැනැත්තකු හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකු වෙනුවෙන් ඔහුගේ නීත්‍යනුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා නම්, එකී භාරකරු හෝ සහාය මිත්‍රයා විසින්, නීත්‍යනුකූල භාරකරු මිය යාමෙන් හෝ ඔහුව ඉවත් කිරීමෙන් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, හෝ වයෝපූර්ණත්වයට පත්වීමෙන්, බාලවයස්කරු විසින්;

(v) හවුල් කේවියට්කරුවන් සිටින්නේ නම්, ඔවුන්ගෙන් එක් කේවියට්කරුවකු හෝ කේවියට්කරුවන් කිහිපදෙනෙකු මිය යාමේ දී ජීවත්ව සිටින කේවියට්කරුවන් විසින්;

(vi) බුන්වත් බවට විනිශ්චය කරනු ලැබුවේ නම් නිල වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තා විසින්;

(vii) කේවියට්කරු සංස්ථාවක් වන්නේ නම් සහ එය ඈවර වෙමින් පවතින්නේ නම් සහ කේවියට්කරු හිමිකම්පාන සම්බන්ධතාව අධිකරණය විසින් පත් කරනු ලබන ඈවරකරුවකු වෙත පවතින විට, එම ඈවරකරු විසින් හෝ නිලභාර ගැනුම්කරු;

(viii) කේවියට් තහනමට විෂයය වූ බූදලය සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් තීන්දුවක් නිකුත් කර ඇති අවස්ථාවක දී අධිකරණයේ පිස්කල්වරයා හෝ එකී තීන්දුව යටතේ අයිතියක් ලබන වෙනත් යම් තැනැත්තකු විසින්,

ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්කර ගැනීමට හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(ආ) මෙහි (අ) ඡේදය යටතේ ඉල්ලා අස්කර ගැනීමේ සාධන පත්‍රයක් ලැබීමෙන් රෙජිස්ට්‍රාර්වරයා-

(i) ඉහත කී ආකාරයට කේවියට් තහනම පිළිබඳ රෙජිස්ටරයේ වූ සටහන අවලංගු කර එහි දිනය යෙදිය යුතු ය; සහ

(ii) එකී කේවියට් තහනමින් සිය අයිතියට, හිමිකමට හෝ සම්බන්ධතාවට බලපෑම් එල්ල වූ තැනැත්තන් හෝ සංස්ථා වෙත දැන්විය යුතු ය.";

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

(2අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කේවියට් තහනමක් පිළිබඳ (2) වන උපවගන්තිය යටතේ වූ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ යම් සිතාසියක්, දැන්වීමක්, නෛසයි ආඥාවක් හෝ තීන්දුවක් 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (සඩ) වන අනුඡේදයේ සඳහන් පරිදි කේවියට්කරුගේ ශ්‍රී ලංකා ලිපිනය වෙත යැවිය යුතු ය.";

(4) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) (3) වන උපවගන්තිය යටතේ කේවියට් තහනමක ලියාපදිංචිය අවලංගු කළේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, හෝ ඉඩමක යම් සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ද, එකී ඉඩම සම්බන්ධයෙන් ම හෝ එකී සම්බන්ධතාව සම්බන්ධයෙන් ම එම කේවියට්කරු ම ඉදිරිපත් කරන කේවියට් තහනමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි නොකළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය; නමුත් එම උපලේඛනය නියෝග මගින් වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි VIII වන ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"VIII වන ආකෘතිය

කේවියට් තහනමක ආකෘතිය

[32 (ආ) වගන්තිය]

මෙහි උපලේඛනයේ සඳහන් කරනු ලබන (මට අයත්/වෙනත් අයෙකුට අයත් - අයිතිය/ හිමිකම/ සම්බන්ධතාව සඳහන් කරන්න) .... .................................... ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන විට, (ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර) අංකය ................................................................. දරන ................................................................................ (කේවියට්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය ඇතුළත් කරන්න) වන මා වෙත, දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

තව ද, මෙම කේවියට් තහනම මා වෙනුවෙන් (කේවියට්කරු හිමිකරු නොවන විට) ................................ වෙනුවෙන් මවිසින් ඉදිරිපත් කරනු ලබන්නේ පහත කාරණාව/කාරණා මත ය.

ඔප්පු අංක ..................... යටතේ

අන්තිම කැමති පත්‍ර ..................... යටතේ

වෙනත් (නිශ්චිතව දක්වන්න) .......................................

යටතේ හිමිකම.

තව ද, මේ සම්බන්ධයෙන් වූ දැන්වීම යොමු කිරීමේ ස්ථානය ලෙස මවිසින් (ශ්‍රී ලංකාවේ ලිපිනය) නම් කරමි.

.................................

(කේවියට්කරුගේ/ඔහුගේ නීතීඥවරයාගේ හෝ

නොතාරිස්වරයාගේ/ඇටෝර්නි

බලකරුගේ අත්සන)

දිනය: ..........................................

ඉහත නම් සඳහන් ........................................... (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් හා ලිපින) ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

1. පළමුවන සාක්ෂිකරුගේ අත්සන

2. දෙවන සාක්ෂිකරුගේ අත්සන

උපලේඛනය

(13 වන වගන්තියේ පරිදි සහ පෙර ලියාපදිංචි කිරීම් දන්නේ නම්, විස්තර කරන්න)"; සහ

(2) එහි IX වන ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:-

"X වන ආකෘතිය

[32(1)(ආ)(ii) වගන්තිය]

කේවියට් තහනමක් ලියාපදිංචි කළ දේපළක අයිතිකරු වෙත කරනු ලබන දැන්වීම

............................................. නමැති හා වරිපනම් අංක: ........................ දරන ඉඩම සම්බන්ධයෙන් ............................................. යන අය කේවියට් තහනමක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එය මෙම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ...................... වෙළුමේ පත්‍රිරු අංක: ...................... හි ලියාපදිංචි කරන ලද බවත් මෙයින් දන්වමි.

...............................

(අත්සන)

(ඉඩම් රෙජිස්ට්‍රාර් ......................)

දිනය: ..........................................

XI වන ආකෘතිය

[32(4) වගන්තිය]

ලියාපදිංචිය අපේක්ෂාවෙන් පවතින සාධන පත්‍රයක් පිළිබඳ කේවියට්කරුට නිකුත් කරන දැන්වීම

ඔබ විසින් ඉදිරිපත් කරන ලද .......... දිනැති ...................... අංක දරන කේවියට් තහනමට එදිරිව, මේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ...................... වෙළුමේ......................පත්‍රිරුවේ ලියාපදිංචිය අපේක්ෂාවෙන් මෙහි උපලේඛනයේ සඳහන් සාධන පත්‍රය පවතින බව ඔබ වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

......................

(අත්සන)

.......... හි ඉඩම් රෙජිස්ට්‍රාර්

දිනය: ........................................

| ඔප්පු අංකය | ඔප්පුවේ/ සාධන පත්‍රයේ ස්වභාවය | ඔප්පුව/ සාධන පත්‍රය සහතික කළ නොතාරිස්වරයාගේ නම | ඉඩම පිළිබඳ විස්තරය (උපලේඛනයට අනුව) | පාර්ශ්වකරුවන් |
|---|---|---|---|---|
| | | | | |

.".

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී හෝ දිනවල දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ වෙනස් විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹවීම සඳහා වෙනස් දින නියමකරනු ලැබිය හැකි ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

2. ශ්‍රී ලංකා ජනරජයේ යුක්තිය පසිඳලීම සඳහා වන මුල් අවස්ථා අධිකරණ, පහත දැක්වෙන අධිකරණ විය යුතු ය:

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාත් සඳහා පිහිටුවන ලද මහාධිකරණ;

(ඇ) දිසා අධිකරණ;

(ඈ) පවුල් අධිකරණ;

(ඉ) සුළු හිමිකම් අධිකරණ;

(ඊ) මහෙස්ත්‍රාත් අධිකරණ; සහ

(උ) ප්‍රාථමික අධිකරණ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

5. (1) එක් එක් අධිකරණ දිසාවේ මේ පනත හෝ යම් ලිඛිත නීතියක් යටතේ පවුල් අධිකරණයක් සතු අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී "පවුල් අධිකරණය" ලෙස සැලකිය යුතු සහ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සුළු හිමිකම් අධිකරණයක් සතු අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී "සුළු හිමිකම් අධිකරණය" ලෙස සැලකිය යුතු "දිසා අධිකරණයක්" තිබිය යුතු අතර සෑම අධිකරණ කොට්ඨාසයක "මහෙස්ත්‍රාත් අධිකරණයක්" සහ "ප්‍රාථමික අධිකරණයක්" තිබිය යුතු ය. තව ද, එක් එක් අධිකරණය පිළිවෙලින්, "දිසා විනිශ්චයකාරවරයා", පවුල් අධිකරණ

විනිශ්චයකාරවරයා", "සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයා", "මහේස්ත්‍රාත්වරයා" සහ "ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා" යනුවෙන් හැඳින්වෙන එක් තැනැත්තකු විසින් ද, ඔහු ඉදිරියේ ද පවත්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් අධිකරණය, අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග මගින් නියම කරනු ලබන, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිකරණ දිසාව හෝ කොට්ඨාසය ඇතුළත වූ පහසු ස්ථානයක හෝ ස්ථානවල පැවැත්විය හැකි යඃ

එසේ වුව ද, මේ වගන්තියේ කිසිවක්, ස්වකීය අධිකරණ බල ප්‍රදේශය ඇතුළත කවර හෝ පහසු ස්ථානයක අධිකරණය පැවැත්වීමට සෑම විනිශ්චයකාරවරයකුට ම ඇති බලය සීමා කරන ලෙස හෝ අඩු කරන ලෙස හෝ තේරුම් නොගත යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5ආ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

5ආ. (1) එසේ පත් කිරීම අවශ්‍ය වන බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන යම් මුල් අවස්ථා අධිකරණයකට හෝ කිහිපයකට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා යනුවෙන් හැඳින්වෙන අධිකරණ නිලධරයකු දිසා විනිශ්චයකාරවරු සහ මහේස්ත්‍රාත්වරු අතරින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති පරිදි පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණවලට සහ පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා පත් කරනු ලැබ ඇති අධිකරණයේ පවරනු ලබන සිවිල් නඩු කටයුත්තක දී උද්ගත වන්නා වූ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවරනු ලබන පශ්චාත් විභාග කාරණාවලට යෙදීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) සියලු ම දිසා විනිශ්චයකාරවරයන් ද, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන් ද, සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයන් ද, මහේස්ත්‍රාත්වරයන් ද, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් ද, ඒ අධිකරණවල සියලු සෑම අතිරේක විනිශ්චයකාරවරයන් සහ අතිරේක මහේස්ත්‍රාත්වරයන් ද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ ධුරවලට පත් කරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) එකම දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, සුළු හිමිකම් අධිකරණයට, මහේස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට පිළිවෙළින් අතිරේක දිසා විනිශ්චයකාරවයන්, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක මහේස්ත්‍රාත්වරයන් හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් අවස්ථානුකූලව අවශ්‍ය වන සංඛ්‍යාවක්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් අධිකරණයකට පත් කරනු ලැබූ සෑම අතිරේක දිසා විනිශ්චයකාරවරයකු ම, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, අතිරේක මහේස්ත්‍රාත්වරයකු ම හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ම, වෙන වෙන ම විනිශ්චයාසනාරූඪව අවස්ථාවෝචිත පරිදි ඒ අතිරේක දිසා විනිශ්චයකාරවරයා, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයා, අතිරේක මහේස්ත්‍රාත්වරයා හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා, එසේ පත්කරන ලද ඒ දිසාවේ හෝ කොට්ඨාසයේ පිළිවෙලින් දිසා අධිකරණය, පවුල් අධිකරණය, සුළු හිමිකම් අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රාථමික අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "මහාධිකරණය විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයෙහි "මහාධිකරණය විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ආ) ඡේදයෙහි "මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක් " යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මහාධිකරණයේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

19. සෑම දිසා අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, සියලු සිවිල්, ආදායම්, භාර, වස්තුභංගත්ව සහ තෙස්තමේන්තු කාරණා යන මේ කාරණා අතුරින් මේ පනතේ Vඅ වන පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන ප්‍රකාර හෝ මුල් අධිකරණ බලය වශයෙන් වෙනත් යම් අධිකරණයකට අනන්‍යව සතු කර දෙනු ලැබූ හෝ නැතහොත් වෙනත් යම් බලධරයකු වෙත අනන්‍යව පවරා දෙනු ලැබූ කාරණා හැර, එකී අනෙකුත් කාරණා සම්බන්ධයෙන් අසීමිත මුල් අධිකරණ බලය සහ එම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා දඩ, දණ්ඩන සහ රාජසන්තක කිරීම් පැනවීමෙහිලා අධිකරණ බලය ද දිසා අධිකරණයට ස්වකීය දිසාව තුළ තිබිය යුතු ය. තව ද, සිහිවිකල තැනැත්තන් සහ රක්ෂිත තැනැත්තන් හා ඔවුන්ගේ බූදල් සම්බන්ධයෙන් ද, අප්‍රාප්තවයස්කයන්ගේ බූදල් සම්බන්ධයෙන් ද, පුද්ගලභාරකරුවන් සහ භාරකරුවන් සම්බන්ධයෙන් ද, දිසා අධිකරණය වෙත නීතිය මගින් පවරා ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඉහත කී අන්දමේ ම අධිකරණ බලය දිසා අධිකරණයට තිබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "අභියාචනාධිකරණය" යන වචනය වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ පිළිවෙලින් "අභියාචනාධිකරණයේ අවසරය" සහ "අභියාචනාධිකරණය වෙත" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ අවසරය" සහ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

"V වන පරිච්ඡේදය

## පවුල් අධිකරණ

24. (1) සෑම පවුල් අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, ඒ අධිකරණයට වෛවාහක ආරවුල්, දික්කසාද නඩු, ශුන්‍යතාව සහ වෙන්වීම සඳහා වන නඩු, අනාචාරය සඳහා වන වන්දි, දික්කසාද දීමනාව සඳහා වන හිමිකම්පෑම්, වෛවාහක දේපළ සම්බන්ධයෙන් කලත්‍රයන්, දෙමව්පියන් සහ ළමුන් අතර සිදුවන ආරවුල්, බාලවයස්කාර දරුවන්ගේ භාරකාරත්වය, යැපෙන්නන්ගේ හිමිකම්පෑම්, පුද්ගල භාරකාරත්වය සහ ආවේක්ෂණය පිළිබඳ කාරණා, සුජාතභාවය සහ අවජාතභාවය හා වෛවාහකත්වය, දරුකමට හදාවඩා ගැනීම පිළිබඳ ප්‍රකාශ සම්බන්ධයෙන් වන හිමිකම් පෑම් සහ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහන් සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීම්, දූෂණය සහ විවාහ පොරොන්දු කඩ කිරීම සඳහා වන හිමිකම්පෑම් සහ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් තනි මුල් අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ විධිවිධානවලට සහ (115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ විධිවිධානවලට බලපානු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද සියලු කාරණා සම්බන්ධයෙන් ද, පවුල් අධිකරණයට තනි සහ අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු අතර මෙහි තුන්වන උපලේඛනයේ සඳහන් යම් ප්‍රඥප්තියක යම් කාරණා සම්බන්ධයෙන් යම් අධිකරණයක් වෙත යොමු කරනු ලබන අවස්ථාවක දී, ඒ යොමු කිරීම පවුල් අධිකරණයකට කරන ලද යොමු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ විධිවිධාන එවැනි යම් නීතියක විධිවිධාන උල්ලංඝනය කරමින් සිදුකරන ලදැයි කියනු ලබන යම් වරදකට අදාළ නොවිය යුතු ය.

(3) යම් බාලවයස්කාර දරුවකුගේ හෝ යම් විවාහයක කලත්‍රයකුගේ යම් දෙමවුපියකු හෝ අනෙක් කලත්‍රයා හෝ ඒ බාලවයස්කාර දරුවාගේ හෝ කලත්‍රයාගේ භාරකරුවකු හෝ ඥාතියකු විසින් අයුතු හෝ නීති විරෝධී භාරකාරත්වයේ තබා ගන්නා ලදැයි කියනු ලබන ඒ බාලවයස්කාර දරුවාගේ හෝ ඒ විවාහයේ කලත්‍රයාගේ භාරකාරත්වය සඳහා වන ඉල්ලීමක් පවුල් අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය. තව ද, ඒ පිළිබඳව විභාග කර තීරණය කිරීමේ සහ නඩුවේ කටයුතු සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි අතුරු ආඥාවක් සහ අවසාන ආඥාවක් යන දෙවර්ගයේම යම් ආඥා කිරීමේ සම්පූර්ණ බලය සහ අධිකරණ බලය ඒ අධිකරණයට තිබිය යුතු ය.

25. සිහිවිකල තැනැත්තන්ගේ සහ මානසික ඌනතා ඇති තැනැත්තන්ගේ ආරක්ෂාව සහ භාරකාරත්වය සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ දේපළවල භාරය සම්බන්ධයෙන් 20 වන වගන්තිය යටතේ දිසා අධිකරණවල අධිකරණ බලය සහ බලතල පවුල් අධිකරණයක් විසින් ඒ ආකාරයෙන් ම සහ සමාන බලතල සහිතව බාලවයස්කාර තැනැත්තන්ගේ සහ රක්ෂිතයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ දේපළ භාර සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාවෙහි වාසික නොවන බාලවයස්කරුවන්ගේ සහ රක්ෂිතයන්ගේ ශ්‍රී ලංකාවෙහි පිහිටි දේපළ භාරව සිටීම කෙරෙහි ද ව්‍යාප්ත විය යුතු ය.

26. (1) සෑම අධිකරණ දිසාවකට ම "පවුල් උපදේශකවරයා" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු නිලධරයකු සිටිය යුතු ය.

(2) පවුල් අධිකරණයක අධිකරණ බලය තුළ යම් කාරණයක් සම්බන්ධයෙන් යම් නඩුවක දී ආරවුලක් හෝ නඩත්තු සඳහා යම් ඉල්ලීමක් දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පරීක්ෂා කිරීමට හෝ විභාග කිරීම සඳහා ඇති අවස්ථාවකදී, නඩුවේ යම් පාර්ශ්වයක් පටහැනි ඉල්ලීමක් ලිඛිතව ප්‍රකාශ

කර නොමැති වන්නේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආරවුල පවුල් උපදේශකවරයකු වෙත යොමු කරනු ලැබිය යුතු ය. ඒ පවුල් උපදේශකවරයා විසින්-

(අ) ඒ ආරවුල සමථයකට පත් කරගැනීම සඳහා පාර්ශ්වයන් පෙළඹවීමට සෑම උත්සාහයක්ම ගනු ලැබිය යුතු ය; සහ

(ආ) ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ ඒ පිළිබඳව ඒ පවුල් උපදේශකවරයාගේ වාර්තාව අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) යම් ආරවුලක් සමථයකට පත් කරනු ලබන අවස්ථාවක දී, ආරවුලේ එක් එක් පාර්ශ්වයන් සහ පවුල් උපදේශකවරයා විසින් සමථකරණයේ නියම ඇතුළත් කර ඒ සඳහා අත්සන් කිරීම කරනු ලැබිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි දිසා විනිශ්චයකාරවරයාට, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයාට හෝ මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සමථකරණයේ නියම ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් යම් ආරවුලක් සමථයකට පත් කිරීම සඳහා පවුල් උපදේශකවරයකු අපොහොසත්වන අවස්ථාවක දී, ඔහු විසින් ඒ ආරවුල පරීක්ෂණකින් හෝ නඩු විභාග කිරීමකින් අනතුරුව තීරණය කිරීම සඳහා දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(5) යම් ආරවුලක් පවුල් උපදේශකවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ යම් දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු වෙත යොමු කරනු ලබන තෙක්, ඒ කිසිදු දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ ආරවුල සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පවත්වනු නොලැබිය යුතු ය.

27. පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් අනතුරුව පවුල් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් දිසා අධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන ආකාරය සහ කාර්ය පටිපාටිය පාලනය කරනු ලබන යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, නීතිය පිළිබඳ හෝ සිද්ධිය පිළිබඳ වූ යම් දෝෂයක් මත යම් අභියාචනයක් පවුල් අධිකරණයේ සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

28. (1) එකම පවුල් ආරවුලක් සම්බන්ධයෙන් හෝ සාරානුකූලව සමාන පවුල් ආරවුලක් සම්බන්ධයෙන් හෝ පවුල් අධිකරණ එකකට වැඩි ගණනක එකිනෙකට වෙනස් නඩු කටයුතු හෝ නඩු දෙකක් හෝ වැඩි ගණනක් පවරනු ලැබූ විට ඒ නඩු කටයුත්ත හෝ නඩුව මාරු කරන ලෙස ඒ නඩු කටයුතුවල හො නඩුවල යම් පාර්ශ්වයක් විසින් අභියාචනාධිකරණයට ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඉහත සඳහන් නඩු කටයුතු හෝ නඩු ගොනු කර තිබෙන ඒ පවුල් අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු විසින් ඒ කාරණය අභියාචනාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය. අභියාචනාධිකරණය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, අභියාචනාධිකරණය විසින් සුදුසු යැයි සළකනු ලැබිය හැකි පරිදි, ඉහත සඳහන් පාර්ශ්ව විසින් දැනටමත් නඩු කටයුතු හෝ නඩු ගොනු කර තිබෙන පවුල් අධිකරණ අතරින් එක් පවුල් අධිකරණයක් වෙත ඒ නඩු කටයුතු හෝ නඩු එකක් හෝ කිහිපයක් මාරු කරනු ලැබිය යුතු ය. එවිට ඒ සියලු ආරවුල් ඒ අධිකරණයේ දී පහසුවෙන් හෝ කඩිනමින් විභාග කොට තීරණය කරනු ලැබිය හැකි ය.

(2) එකම පාර්ශ්වකරුවන් අතර හෝ සාරානුකූලව එකම කාරණයක් සම්බන්ධව එකම පවුල් අධිකරණයක පවරනු ලැබ ඇති හෝ විනිශ්චයට භාජනව පවත්නා නඩු කටයුතු හෝ නඩු දෙකක් හෝ වැඩි ගණනක් ඇති විටක ඒ අධිකරණයේ මතය අනුව ඒ නඩු කටයුතු හෝ නඩු ඒකාබද්ධ කිරීමෙන් පහසුවක් වේ නම් හෝ යුක්තියේ යහපත සඳහා අවශ්‍ය වන බවට සහ ආරවුලේ ඒ කාරණා සම්බන්ධයෙන් කඩිනමින් සුදුස්සක් කිරීම අවශ්‍ය වන බවට ඉහත අධිකරණයේ මතය වන අවස්ථාවක දී ඒ නඩු කටයුතු හෝ නඩු එක් නඩු කටයුත්තකට ඒකාබද්ධ කරනු ලැබිය යුතු බවට විධාන කිරීමට ඉහත කී අධිකරණයට බලය තිබිය යුතු ය. අධිකරණය විසින් එවැනි අවස්ථාවක දී, හදිසි අවශ්‍යතා සහ නඩුවේ යුක්තිය සඳහා අවශ්‍ය වන ආකාරයට කලින් කලට යම් ආඥාවන් කිරීම හෝ යම් තීන්දුවක් ලබා දීම හෝ යම් තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

29. (1) පවුල් අධිකරණයක සියලු නඩු කටයුතු නියම කරනු ලැබිය හැකි පරිදි යම් නියෝගවලට අනුකූලව හැකිතාක් ඉක්මණින් පැවරිය යුතු ය සහ පැවැත්වීම සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ නියෝග එසේ නියම කරනු ලබන තෙක් පවුල් අධිකරණය විසින් ප්‍රායෝගිකව හැකිතාක් දුරට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධාන අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ නඩු කටයුතු පැවරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බලපවත්නා ඒ ආඥාපනතේ විධිවිධාන පවුල් අධිකරණයේ ගොනු කරනු ලැබිය හැකි යම් නඩු කටයුතුවලට අදාළ වන බවට සළකනු ලැබිය යුතු ය.

(3) බාලවයස්කාර දරුවන්ගේ රැකවරණය සහ භාරය සඳහා වන සෑම ඉල්ලීමකටම අන් සියලු කාරණා අභිබවා ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඒවා එදිනෙදා විභාග නොකිරීමට අති විශේෂ අවස්ථානුගත කරුණු ඇති වුවහොත් මිස, ඒ ඉල්ලීම පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අප්‍රමාදව සුදුස්සක් කිරීම සහතික කිරීම සඳහා දෛනිකව විභාග කරනු ලැබිය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ Vඅ වන පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය:-

"Vඅ වන පරිච්ඡේදය

## සුළු හිමිකම් අධිකරණ

29අ. (1) සෑම සුළු හිමිකම් අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, ඊට අනන්‍ය මුල් අධිකරණ බලය ඇත්තේ ය. තව ද, මෙහි හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද සියලු නඩු සංජානනය කිරීමේ සහ ඒවා විභාග කොට තීරණය කිරීමේ සම්පූර්ණ බලය සෑම සුළු හිමිකම් අධිකරණයකට ම ඇත්තේ යඃ

එසේ වුව ද, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ LIII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ගොනු කරන ලද යම් නඩුවක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විශේෂ විධිවිධාන පනවනු ලැබ ඇති මුදල් ආපසු අය කර ගැනීම සඳහා වන නඩුවක් විභාග කොට තීරණය කිරීම සඳහා අධිකරණ බලය හෝ බලතල සුළු හිමිකම් අධිකරණවලට නොමැති විය යුතු ය.

(2) හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන සියලු නඩු, පොලිය හැර, රුපියල් ලක්ෂ පහළොවක මුදල් ප්‍රමාණය හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය සම්බන්ධයෙන් වන නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

29ආ. යම් සුළු හිමිකම් අධිකරණයක් හමුවේ ඇති නඩු කටයුතු 2022 අංක 33 දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සුළු හිමිකම් අධිකරණ සඳහා වන විශේෂ කාර්ය පටිපාටිය මගින් සිදු කරනු ලැබිය හැකි ය.

29ඇ. සෑම සුළු හිමිකම් අධිකරණයකම විනිශ්චයකාරවරයකු විසින් යම් නඩුවක දී තම ආඥාව හෝ නඩු තීන්දුව ප්‍රකාශ කිරීමේ දී යුක්තිසහගත යයි සහ සාධාරණ යයි තමාට පෙනී යන ගාස්තු සහ වියදම් ගෙවීම සම්බන්ධයෙන් ආඥාවක් කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

29ඈ. (1) තමා පාර්ශ්වකරුවකු වන යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද යම් නඩු තීන්දුවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අභියාචනය කිරීමේ අයිතිය ප්‍රකාශිතව ම අහිමි කර ඇති අවස්ථාවක දී හැර, නීතිය හෝ සිද්ධිය හෝ පිළිබඳ යම් දෝෂයක් මත, අභියාචනයක් ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තමා පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පාර්ශ්වකරුවකු වීමට අපේක්ෂා කරන්නා වූ හෝ යම් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳව වූ හෝ යම් දෝෂයක් නිවැරදි කරගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව, ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත, ඒ මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) තමා පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පාර්ශ්වකරුවකුවීමට අපේක්ෂා කරන්නා වූ හෝ යම් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් පැහැරහැරීමක් මත ඇතුළත් කරන ලද නඩු තීන්දුවක් නිෂ්ප්‍රභ කරමින් හෝ නිෂ්ප්‍රභ කිරීම ප්‍රතික්ෂේප කරමින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳ වූ හෝ යම් දෝෂයක් නිවැරදි කර ගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව, ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත, ඒ මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) අභියාචනය සහ අභියාචනයට පාත්‍ර වූ ක්‍රියාවේ යෙදවීම නතර කිරීම සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන, LIX වන, LX වන සහ LXI වන පරිච්ඡේදවල විධිවිධාන මේ පරිච්ඡේදයේ විධිවිධාන සමග අනනුකූල නොවන තාක් දුරට අදාළ විය යුතුය.

(5) යම් අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, අභියාචනාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින් කරනු ලැබූ හා ප්‍රකාශයට පත් කරන ලද සියලු නඩු තීන්දුවලට, ආඥාවලට සහ තීන්දු ප්‍රකාශවලට අනුකූලව ක්‍රියා කිරීම සහ ඉහත සඳහන් විනිශ්චකාරවරයා විසින් දෙන ලද යම් මුල් නඩු තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් ඒ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම සෑම සුළු හිමිකම් අධිකරණයක ම විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබිය යුතු ය.

29ඉ. උචිත අවස්ථාවල දී සහ පාර්ශ්වයන් සමථ කිරීමකට එකඟ වන්නේ නම් නඩු විභාගයට පෙර හෝ නඩු විභාගය අතරතුර දී සමථයකට පත්වීමට පාර්ශ්වයන් පෙළඹවීම සඳහා නීත්‍යනුකූල ක්‍රියාමාර්ගවලින් සියලු ප්‍රයත්න දැරීම සුළු හිමිකම් අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. සමථය වාර්තාගත කළ යුතු අතර පාර්ශ්වයන් විසින් එයට අත්සන් තැබිය යුතු ය. එම සමථයේ කොන්දේසි ප්‍රකාරව නඩු තීන්දුවක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ "අභියාචනාධිකරණයට" යන වචනය වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු යඃ-

"VII වන පරිච්ඡේදය

**ප්‍රාථමික අධිකරණ**

32. (1) සෑම ප්‍රාථමික අධිකරණයකට ම, ණය, අලාභය, ඉල්ලීම සහ හිමිකම්පෑම රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන අවස්ථාවක දී වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, මුල් අධිකරණ බලය තිබිය යුතු අතර පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම සහ ඒ පළාත් පාලන ආයතනවල ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් වන කාරණා සම්බන්ධයෙන් ද අධිකරණ බලය තිබිය යුතු ය.

(2) ප්‍රාථමික අධිකරණවලට මෙහි හතරවන උපලේඛනයේ සඳහන් ආරවුල් සම්බන්ධයෙන්, හිමිකම්පෑමේ වටිනාකම කුමක් වුව ද, කිසිදු අධිකරණ බලයක් නොතිබිය යුතු ය.

33. (1) අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් වැරදි සම්බන්ධයෙන් සෑම ප්‍රාථමික අධිකරණයකට ම අනන්‍ය මුල් අපරාධ අධිකරණ බලය තිබිය යුතු අතර අමාත්‍යවරයා විසින් ඒ නියෝගයේ එක් එක් වරද සම්බන්ධයෙන් වන සීමාවන්, සීමා කිරීම් සහ කොන්දේසි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(2) යම් ප්‍රඥප්තියක විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් අනු නීතියක විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරන ලදැයි කියනු ලබන්නා වූ ද අධිකරණ බලය ප්‍රාථමික අධිකරණය වෙත පවරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි සම්බන්ධයෙන් තනි සහ අනන්‍ය අධිකරණ බලය ප්‍රාථමික අධිකරණවලට තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවකින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද යම් වරදක් සඳහා පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව වරදකරු බවට තීරණය කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කිරීමෙන් සහ ඔහුට දඬුවම් නියම කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයකු වළක්වනු නොලැබිය යුතු ය.

34. (1) යම් සිවිල් නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලබන අවස්ථාවක දී, ඒ නඩුවේ විනිශ්චයකාරවරයා ඉදිරියේ පෙනී සිටීම සඳහා පාර්ශ්වයන් කැඳවීම සහ සුදුසු අවස්ථාවල දී පරීක්ෂණ හෝ විභාග ආරම්භ කිරීමට පෙර ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එළඹීමට පෙළඹවීමට සෑම උත්සාහයක් ම ගැනීම ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. ඒ පාර්ශ්වයන් බේරුම්කරණයට එකඟ වන අවස්ථාවක දී, එකී බේරුම්කරණය වාර්තාගත කරනු ලැබිය යුතු අතර එහි පාර්ශ්වයන් විසින් එකී වාර්තාවට අත්සන් කරනු ලැබිය යුතු අතර ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් එය ඇතුළත් කරනු ලැබිය යුතු ය. තව ද එකී අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් එය බලාත්මක විය යුතු ය.

(2) යම් අපරාධ නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලැබූ අවස්ථාවක දී, ඒ නඩුවේ විනිශ්චයකාරවරයා ඉදිරියේ පෙනී සිටීම සඳහා අදාළ පාර්ශ්වයන් කැඳවීම සහ සුදුසු අවස්ථාවල දී ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එළඹීමට පෙළඹවීම ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එකඟ වන අවස්ථාවක දී, ඒ බේරුම්කරණය වාර්තාගත කරනු ලැබිය යුතු අතර අදාළ පාර්ශ්ව විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, ඒ නඩු කටයුත්ත හෝ කාරණය අදාළ වන්නේ යම් වරදකට ද, ඒ වරද සමථයට පත්කරනු ලැබිය යුතු ය.

35. (1) ප්‍රාථමික අධිකරණයක් විසින් පවත්වනු ලැබූ පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් පසුව ඇතුළත් කරන ලද හෝ බලාත්මක කරන ලද යම් නඩු තීන්දුවකින්, ආඥාවකින්, තීන්දු ප්‍රකාශයකින්, වරදකරු කිරීමකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින්, එසේ අභියාචනය කරන කාර්ය පටිපාටිය සහ ආකාරය පාලනය කරන්නා වූ යම් නීතියකට යටත්ව සහ යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳ වූ හෝ යම් දෝෂයක් මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එසේ අභියාචනය කිරීමේ කාර්ය පටිපාටිය සහ ආකාරය පාලනය කරන්නා වූ එවැනි යම් නීතියක්, නියෝගයක් හෝ රීතියක් නොමැති අවස්ථාවක දී, අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක දී අභියාචනයක් සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවලට අදාළ විධිවිධාන අදාළ විය යුතු අතර, සිවිල් නඩුවක හෝ නඩු කටයුත්තක අභියාචනයක් සඳහා දිසා අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවලට අදාළ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ පාර්ශ්වයන් අතර ආරවුල බේරුම් කර ගැනීමේ හේතුවෙන් ඇතුළත් කරන ලද හෝ බලාත්මක කරන ලද යම් නඩු තීන්දුවකට, ආඥාවකට, තීන්දු ප්‍රකාශයකට, වරදකරු කිරීමකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

36. ප්‍රාථමික අධිකරණයක සියලු නඩු කටයුතු ඒ සඳහා අදාළ විය හැකි යම් නීතිවලට අනුකූලව හැකිතාක් ඉක්මණින් ගොනුකර පැවැත්විය යුතු අතර, එවැනි නීතියක් නොමැති වන්නේ නම්, ප්‍රාථමික අධිකරණයක සිවිල් කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වන විට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධානවලට අනුකූලව ද අපරාධ කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වන විට මහෙස්ත්‍රාත් අධිකරණයක ලඝු නඩු විභාගවලට අදාළ විධිවිධානවලට අනුකූලව ද සිදුකරනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

37. (අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයෙන් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයෙන් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ අභියාචනාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්; හෝ

(ආ) දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින්, සුළු හිමිකම් අධිකරණවලින්, මහේස්ත්‍රාත් අධිකරණවලින් හෝ ප්‍රාථමික අධිකරණවලින් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් තිබිය යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(2) එහි නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය හැර, මුල් අවස්ථා අධිකරණයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට අභියාචනය කරනු ලැබූ සියලු අවස්ථාවල දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින් ඒ අභියාචනයේ දී කරනු ලැබ, ප්‍රකාශ කරනු ලැබූ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ, එකී මුල් අවස්ථා අධිකරණය විසින් කරන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන්, ඒ මුල් අවස්ථා අධිකරණය විසින් පිළිපැද ක්‍රියාවේ යෙදවිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ පත් කරනු ලැබූ සෑම සාමදාන විනිශ්චයකාරවරයකු ම විසින් සහ සෑම නිල නොලත් මහේස්ත්‍රාත්වරයකු ම විසින් මහාධිකරණ විනිශ්චයකාරවරයකු, දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු, සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයකු, මහේස්ත්‍රාත්වරයකු හෝ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි, අමාත්‍යවරයා නියම කරන ආකෘතියකින් වූ ධුරයේ ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් දී ඊට අත්සන් තැබිය යුතු අතර ඒ ධුරයේ ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම සලස්වන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට එය දීමට සැලැස්වීමටත් එකී ප්‍රතිඥාව හෝ දිවුරුම යථා පරිදි දෙනු ලැබූ බව තම අධිකරණයේ වාර්තාවල සටහන් කිරීමටත් ඒ සටහනේ පිටපතක් ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාවල ඇතුළත් කරනු ලැබීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත වහාම යැවීමටත් ඒ සෑම විනිශ්චයකාරවරයකුටම බලය පවරන අතර, එසේ කිරීමට නියම කරනු ලැබේ.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුව ද, වෙනත් සෑම අවස්ථාවක දී ම, අවස්ථාවෝචිත පරිදි යාබද කලාපයෙහි, දිසාවෙහි හෝ කොට්ඨාසයෙහි, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ, දිසා අධිකරණයේ, පවුල් අධිකරණයේ, සුළු හිමිකම් අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට, මහේස්ත්‍රාත් අධිකරණයේ යම් මහේස්ත්‍රාත්වරයකුට සහ ප්‍රාථමික අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය විභාග කිරීමට, නඩු විභාග කිරීමට හා තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, වූලායචන අධිකරණයට සහ මහේස්ත්‍රාත් අධිකරණයට" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, සුළු හිමිකම් අධිකරණයට, මහේස්ත්‍රත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා " යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ මහාධිකරණයක හෝ දිසා අධිකරණයක හෝ වූලායචන අධිකරණයක පවරන ලද යම් නඩුවක දී-" යන වචන වෙනුවට, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක, දිසා අධිකරණයක,පවුල් අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක පවරන ලද යම් නඩුවක දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

55. (1) සෑම දිසා අධිකරණයක්ම, පවුල් අධිකරණයක්ම, සුළු හිමිකම් අධිකරණයක්ම, මහේස්ත්‍රාත් අධිකරණයක්ම සහ ප්‍රාථමික අධිකරණයක්ම ඉදිරියේ සිදුකරනු ලබන අධිකරණයට අපහාස කිරීමේ සෑම වරදක් ම සහ පිළිවෙළින් ඒ ඒ අධිකරණවල දී කරනු ලබන යම් ක්‍රියාවක දී නැතහොත් පවත්වාගෙන යනු ලබන නඩු කටයුත්තක දී කරනු ලබන්නා වූ ද

අධිකරණයට අපහාස කිරීමක් වශයෙන් දඬුවම් කළ යුතු යයි තත් කාලයෙහි වලංගුව බලපවත්නා යම් නීතියකින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි ඒ අධිකරණයේ නිසි අධිකාරය සහ කාර්යක්ෂමතාව පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා සංජානනය කිරීමට සහ ඒ වැරදි සඳහා මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ දණ්ඩනවලින් ඒ වැරදි සම්බන්ධයෙන් දඬුවම් කිරීමට විශේෂ අධිකරණ බලය ඒ ඒ වැරදි සඳහා අධිකරණවලට තිබිය යුතු ය.

(2) අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන දඩ පිළිබඳ හෝ බන්ධනාගාර ගත කිරීම පිළිබඳ දණ්ඩන නියමයන් පිළිවෙළින් පහත දැක්වෙන අධිකරණවලින් නියම කරනු ලැබිය හැකි යː-

(අ) දිසා අධිකරණයක් සහ පවුල් අධිකරණයක් විසින් රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්;

(ආ) සුළු හිමිකම් අධිකරණයක් සහ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්; සහ

(ඇ) ප්‍රාථමික අධිකරණයක් විසින් රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 57 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

57. මේ පනත යටතේ පිහිටුවන ලද යම් අධිකරණ කොට්ඨාසයක ප්‍රාථමික අධිකරණයකට විනිශ්චයකාරවරයකු පත්කරනු ලැබ නොමැති අවස්ථාවක, ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා පත්කරනු ලබන තුරු, ඒ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයෙහි විනිශ්චයකාරවරයා ලෙස සියලු කාර්ය සඳහා ම සලකනු ලැබිය යුතු අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ සියලු අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකු පත්කරනු ලබන අවස්ථාවක දී, ඒ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා විසින් යම් සාක්ෂි සටහන් කිරීම ආරම්භ කර තිබෙන සියලු අපරාධ නඩු, නඩු, නඩු කටයුතු, කාරණා ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් විභාග කර තීරණය කරනු ලැබිය හැකි ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛන ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේː-

"තුන්වන උපලේඛනය

[24 (2) වන වගන්තිය]

**ප්‍රඥප්තීන්**

(1) (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත.

(2) (110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත.

(3) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය.

(4) (58 වන අධිකාරය වූ) යාපනය වෛවාහික අයිතිවාසිකම් සහ උරුම ආඥාපනත.

(5) 1970 අංක 3 දරන සජාත කිරීමේ පනත.

(6) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත.

(7) (56 වන අධිකාරය වූ) විවාහක කාන්තාවන්ගේ දේපළ පිළිබඳ ආඥාපනත.

(8) (57 වන අධිකාරය වූ) වෛවාහික අයිතිවාසිකම් සහ උරුම ආඥාපනත.

හතරවන උපලේඛනය

[32 (2) වන වගන්තිය]

**ප්‍රාථමික අධිකරණවල අධිකරණ බලයෙන් බැහැර කරන ලද නඩු**

(1) රජය විසින් කළ යුතු යයි හෝ සැදිය යුතු යයි අදහස් කරනු ලබන ක්‍රියාවක් හෝ නියමයක් සම්බන්ධයෙන් වන හෝ රාජ්‍යයේ නියමයකින් යම් තැනැත්තකු විසින් කළ යුතු යයි අදහස් කරනු ලබන ක්‍රියාවක් සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(2) අධිකරණයක නඩු තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාවේ යොදවමින් යම් තැනැත්තකු විසින් කළ යුතු යයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ අධිකරණ නිලධරයකුගේ ධුරය ක්‍රියාවෙහි යොදවමින් කටයුතු කිරීම නිසා හෝ වන යම් නඩුවක්.

(3) යම් රාජ්‍ය නිලධරයකු විසින් ඔහුගේ නිල තත්ත්වයෙන් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ නියමයක් සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(4) තත් කාලයේ බලාත්මකව පවතින බෙදුම් නීතිය යටතේ නිශ්චල දේපළක් බෙදා වෙන් කර ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(5) උකස් බලාත්මක කිරීම සඳහා හෝ දේපළ විකිණීම සඳහා හෝ නිශ්චල දේපළක උකස් ලාභියකු විසින් පවරනු ලබන යම් නඩුවක් හෝ උකස් නිදහස් කරවා ගැනීම සඳහා නිශ්චල දේපළක උකස්කරුවකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(6) අපතේ යාම වැළැක්වීම සඳහා වූ යම් නඩුවක්.

(7) (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ වන්දියක් ගෙවා තිබෙන යම් තැනැත්තකුගෙන් ඒ වන්දිය සම්පූර්ණයෙන් ම හෝ එයින් යම් කොටසක් හෝ ආපසු අයකර ගැනීම සඳහා වන යම් නඩුවක්.

(8) ගිවිසුමක් එපරිද්දෙන් ම ඉටුකිරීම හෝ පරිච්ඡින්න කිරීම සඳහා හෝ ගිවිසුම කඩකිරීම සඳහා අලාභ ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(9) ඉන්ජන්ක්ෂන් තහනමක් නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන යම් නඩුවක්.

(10) ඉන්ජන්ක්ෂන් තහනමක් ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(11) භාරය කඩකිරීමක් මගින් ඇති වූ පාඩුව සඳහා මිය ගිය භාරකරුවකුගේ පොදු බූදලයෙන් සුදුස්සක් කිරීම සඳහා වන නඩුවක් සහ මියගිය භාරකරුවකුගේ බූදලය සම්බන්ධයෙන් දායක මුදල සඳහා හිමිකම් පෑමක් බලාත්මක කිරීම සඳහා සම භාරකරුවකු විසින් පවරනු ලබන යම් නඩුවක් ඇතුළුව භාරයකට අදාළ යම් නඩුවක්.

(12) ඉඩමකට හිමිකම් ප්‍රකාශයක් සඳහා වන තීන්දු ප්‍රකාශයක් ඇතුළුව ප්‍රකාශනීය තීන්දු ප්‍රකාශයක් සඳහා වන නඩුවක්.

(13) සිහිවිකල්ව සිටිය දී හෝ වෙනත් අශක්නුතාවක් යටතේ පැමිණිලිකරු විසින් පවරා ඇති දේපළක් සඳහා වන යම් නඩුවක්

(14) බේරුම්කරුකු විසින් කරන ලද ප්‍රධානයක් හබ කිරීම සඳහා වන යම් නඩුවක්.

(15) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අර්ථකථනය කර ඇති පරිදි විදේශ නඩු තීන්දුවක් මත හෝ ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක දී ලබාගත් නඩු තීන්දුවක් මත වන යම් නඩුවක්.

(16) පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් තෙස්තමේන්තු නීයාදනයක් ගෙවා ඇත්තේ හෝ වත්කම් බෙදා ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනත්තා වෙතින් ආපසු ගෙවීමක් කරන ලෙස බලකිරීම සඳහා වන යම් නඩුවක්.

(17) තෙස්තමේන්තු නීයාදනයක් සඳහා හෝ අන්තිම කැමති පත්‍රකරුවකු විසින් රික්තවරණය කරන ලද සම්පූර්ණ ඉතිරි මුදල හෝ එහි කොටසක් සඳහා හෝ අන්තිම කැමතිපත්‍රයක් නොතබා මියගිය තැනැත්තකුගේ සම්පූර්ණ දේපළ හෝ එහි කොටසක් සඳහා වන යම් නඩුවක්.

(18) (අ) හවුල් ව්‍යාපාරය විසුරුවාහැරීම සඳහා හෝ හවුල් ව්‍යාපාරය විසුරුවාහැරීමෙන් පසුව ඒ ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම සඳහා;

(ආ) හවුල් ව්‍යාපාරයක ගණුදෙනුවල ගිණුම පෙන්වීම සඳහා; හෝ

(ඇ) හවුල් ව්‍යාපාරයක ගිණුම තුලනය කිරීම සඳහා,

වන යම් නඩුවක්.

(19) යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ අද්මිනිස්ත්‍රාසි කරනු ලබන දේපළ පිළිබඳ ගිණුම් පෙන්වීම සඳහා වන යම් නඩුවක්.

(20) උකස්ලාභියා වෙත ලැබුණු අතිරික්ත එකතුවක් ආපසු අයකර ගැනීම සඳහා උකස නිදහස් කිරීමෙන් පසුව උකස්කරුවකු විසින් පවරනු ලබන නඩුවක් ඇතුළුව ගිණුම් පෙන්වීම සඳහා වන වෙනත් යම් නඩුවක් සහ විත්තිකරු විසින් අයුතු ලෙස ලබාගෙන තිබෙන පැමිණිලිකරුට අයත් නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන ලාභ ලබාගැනීම සඳහා පවරනු ලබන නඩුවක්.

(21) පොදු සමානුපාතික අලාභ හෝ මුක්තාවශේෂ ගාස්තු සඳහා වූ යම් නඩුවක්.

(22) නෞකා සට්ටනයවීමක් සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(23) යම් රක්ෂණ ඔප්පුවක් පිළිබඳව වූ හෝ එවැනි යම් රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවන ලද යම් රක්ෂණ වාරිකයක් ආපසු අයකරගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(24) (අ) නඩු පැවරිය හැකි වරදක් මගින් සිදු වූ යම් තැනැත්තකුගේ මරණය සිදුවීම නිසා හටගත් පාඩුවක් සඳහා;

(ආ) අයුතු ලෙස සිරභාරයට ගැනීම සම්බන්ධයෙන්;

(ඇ) ද්වේශ සහගතව අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන්;

(ඈ) අයුතු අවහිරය හෝ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන්;

(ඉ) අපහාසය කිරීම සම්බන්ධයෙන්;

(ඊ) අනාචාරය හෝ දූෂණය සම්බන්ධයෙන්;

(උ) විවාහ ගිවිස ගැනීමේ ගිවිසුමක් හෝ විවාහ පොරොන්දුවක් කඩකිරීම සම්බන්ධයෙන්;

(ඌ) පැමිණිලිකරු සමග ඇති කරගත් ගිවිසුමක් කඩකිරීම සඳහා තැනැත්තකු පෙළඹවීම සම්බන්ධයෙන්;

(එ) දේපළක් මත යම් පරවශ්‍යතාවයක් භුක්ති විඳීම හෝ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බාධා කිරීම හෝ මැදිහත්වීම සඳහා,

වන්දි හෝ අලාභ ලබා ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(25) මහර් ආපසු අයකර ගැනීම සඳහා මුස්ලිම්වරයකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(26) බාලවයස්කරුවකුගේ භාරකාරත්වය ලබා ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(27) දික්කසාදවීම සඳහා හෝ නීතියෙන් වෙන්වීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(28) නඩත්තුවලට, දරු බව නියම කිරීම හෝ දරුකමට හදාගැනීම සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(29) හවුල් දේපළක කොටස්කරුවකු විසින් හවුල් කොටස්කරුවකුගෙන් අයවිය යුතු මුදල් වෙනුවෙන් ඔහු විසින් කරන ලද ගෙවීමක් සම්බන්ධයෙන් වන දායක මුදල් ආපසු අයකරගැනීම සඳහා ඒ කොටස්කරු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(30) උකස් කරන ලද දේපළ නිදහස්කර ගැනීම සඳහා නිශ්චල දේපළ හවුල් උකස්කරුවන් කිහිපදෙනෙකුගෙන් එක් අයෙකු විසින් ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් වන දායක මුදල සඳහා ඒ නිශ්චල දේපළ බද්ද උකස්කරුවන් කිහිපදෙනාගෙන් එක් අයෙකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(31) යම් බද්දක් හෝ අනුප්‍රමාණයක් හෝ වෙනත් අයබද්දක් සම්බන්ධයෙන් කරන ලද හිමිකම්පෑමක් සපුරාලීම සඳහා විරුද්ධත්වය යටතේ ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා රජයට හෝ පළාත් පාලන ආයතනයකට එරෙහිව පවරනු ලබන යම් නඩුවක්.

(32) කලින් කල සංශෝධිත පරිදි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පවරනු ලබන යම් නඩුවක්.

(33) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හෝ ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් පවරනු ලබන යම් නඩුවක්.

(34) පීඩාව මත පදනම් වූ යම් නඩුවක්.

(35) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත යටතේ ගෙවල් කුලී සහ නෙරපීම සහ කාර්ය පටිපාටිය සඳහා වන යම් නඩුවක්.

(36) (මේ පනත හැර) තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් ප්‍රාථමික අධිකරණවල අධිකරණ බලයෙන් ප්‍රකාශිතව හෝ ව්‍යංගව බැහැර කරන ලද යම් නඩුවක්.".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"හත්වන උපලේඛනය

[29අ (2) වන වගන්තිය]

**නඩු**

1. මුදල් ආපසු අයකර ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක් (අනතුරක දී සිදු වූ අලාභ අයකර ගැනීම සඳහා හෝ පෞද්ගලික හානි හෝ වෙනත් යම් සමාන වර්ගයක නඩුවක් ඇතුළුව ණයක් හෝ ගාස්තුවක් හෝ ගෙවීමක් හෝ අලාභයක් හෝ හිමිකම්පෑමක් ලෙස);

2. චංචල දේපළ නැවත අත්කර ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්;

3. 1 වන සහ 2 වන අයිතමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් ප්‍රතිහිමිකම්පෑමක් සඳහා පවරනු ලබන යම් නඩුවක්;

4. වෙනත් යම් නීතියක් මගින් එයට පවරනු ලබන වෙනත් යම් අධිකරණ බලයක්.".

27. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 දෙසැම්බර් මස 14 වන දින]

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (v) වන අයිතමයේ "අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (vi) වන අයිතමයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන

දින හෝ එදිනට පසු ආරම්භ වන, එහෙත් 2022 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (v) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2022 ජූනි මස 1 වන දිනයෙන් ආරම්භව 2022 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භව එහෙත් 2022 අගෝස්තු මස 31 වන දිනෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ); සහ

(viii) 2022 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් ආරම්භව 2022 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ).".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ, (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (vi) වන ඡේදයේ ''2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2022 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකු ම-

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, එම තැනැත්තාගේ එකී බදු අය කළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් හෝ ඊට වැඩි නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන අසූවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේදී එළඹෙන බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් ඉක්මවීමට ඉඩ ඇති බවට, හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන අසූවක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

(3) (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ, "2016 මැයි මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"2016 මැයි මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය:

එසේම තවදුරටත්, (vii) වන ඡේදයේ කාර්ය සඳහා, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය.''.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම කොටසේ (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඇ) අනු අයිතමයේ එම "සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඇ) අනු අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඉ) එම සැපයුම 2023 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව සිදුවී ඇත්නම්, යම් තැනැත්තකු විසින් කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස බදු දීමක් හෝ කුලියට දීමක් හෝ යම් පදිංචිය සඳහා වන සහාධිපත්‍ය දේපළ සැපයුමක් නොවන සැපයුම්.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 දෙසැම්බර් මස 19 වන දින]

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (*'අ' වගුවේ, 'ආ' වගුවේ සහ 'ඇ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන හැර) මේ පනතේ විධිවිධාන, කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව මේ පනතෙහි සටහන් කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) *'අ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(4) *'ආ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) *'ඇ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, ඒ වගුවේ නිශ්චිතව දක්වා ඇති අදාළ දිනවල දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ගෙවනු ලබන වියදම්" යන වචන වෙනුවට "කරනු ලබන ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "විශ්‍රාම යාමේ දී ලැබෙන මුදල්" යන වචන වෙනුවට "ලැබුණු විශ්‍රාම ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ ලද ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්;" යන වචන වෙනුවට ලැබුණු ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "අවස්ථාවේ වටිනාකම; සහ" යන වචන වෙනුවට "අවස්ථාවේ වටිනාකම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්" යන වචන වෙනුවට "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උ) ආදායම් බදු ගෙවීමේ කාර්ය සඳහා අදාළ විශ්‍රාම දායක මුදල් දැනටමත් සලකා බලා ඇති බවට සහ පසුගිය තක්සේරු වර්ෂයක දී එම දායක මුදල් මත සේවා නියුක්තිකයා විසින් බදු ගෙවා ඇති බවට වූ කොන්දේසියට යටත්ව, සේවා නියුක්තියෙන් විශ්‍රාම යන අවස්ථාවේ දී ලැබෙන යම් විශ්‍රාම ගෙවීමක්".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ "තැනැත්තාගේ වියදම්;" යන වචන වෙනුවට "තැනැත්තාගේ වියදම් හෝ වෙනත් යම් අඩු කිරීම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ඡේදයේ (x) වන අනුඡේදයේ "බදු හෝ වෙනත් අයකිරීම්." යන වචන වෙනුවට "බදු හෝ වෙනත් අයකිරීම් සහ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව යම් තැනැත්තකුගේ ආදායම ගණනය කිරීමේ දී අඩුකිරීමට ඉඩ ලබා දී නොමැති යම් බදු හෝ අයකිරීම්;" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (අ) ඡේදයේ "එම ණය බැඳීම මුදල් ණයට ගැනීමේ දී දරනු ලැබූ අවස්ථාවක, එම මුදල් එම වර්ෂය තුළ භාවිත කරන ලද තාක් දුරට හෝ එම වර්ෂය තුළ ආදායම උත්පාදනය කිරීමේ දී වත්කමක් අත්කර ගැනීමට එම මුදල්" යන වචන වෙනුවට "එම ණය බැඳීම යටතේ ණයට ගත් මුදල් එම වර්ෂය තුළ දී ආදායම උත්පාදනය කිරීමේ දී භාවිත කරන ලද වත්කමක් අත්කර ගැනීමට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත වටිනාකම ශුන්‍ය වන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් වැඩිදියුණු කිරීම් සඳහා වූ අඩුකිරීම-

(අ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, 4 වන පන්තියේ ක්ෂය විය හැකි වත්කමක් වෙනුවෙන් තක්සේරු වර්ෂ දොළහක් සඳහා;

(ආ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, වෙනත් පංතිවල ක්ෂය විය හැකි වත්කම් වෙනුවෙන් තක්සේරු වර්ෂ තුනක් සඳහා,

සමාන ප්‍රමාණවලින් බෙදා අඩු කරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(3) වන සහ (3අ) වන උපවගන්තිවලට යටත්ව, (2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්: සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් මේ පනතේ හතරවන උපලේඛනය යටතේ ප්‍රදානය කරනු ලබන සහ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනාවල එකතුව කවර හෝ අවස්ථානුගත කරුණක් යටතේ එම ක්ෂය විය හැකි වත්කම්වල පිරිවැය නො ඉක්මවිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) (අ) 2021 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී (මූල්‍ය ආයතනයක් නොවන) යම් අස්තිත්වයක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරනු ලබන මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සීමාව ඇතුළත යම් මූල්‍ය සාධනපත්‍ර සඳහා ආරෝපණය කළ හැකි මූල්‍ය පිරිවැය ප්‍රමාණය නො ඉක්මවිය යුතු ය;

(ආ) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ තක්සේරු වර්ෂය අවසන් වන දිනයේ දී නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයක් සහිත (මූල්‍ය ආයතනයක් නොවන) සමාගමක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරන ලද මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සීමාව නො ඉක්මවිය යුතු ය.

(2) එම සීමාව පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු ය:-

(අ) A x B

මෙම සූත්‍රයෙහි-

'A' යනු, අස්තිත්වයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව වේ; සහ

'B' යනු-

(i) නිෂ්පාදන අස්තිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අංක 3 වේත සහ

(ii) නිෂ්පාදන අස්තිත්වයක් නොවන අස්තිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අංක 4 වේ;

(ආ)

මෙම සූත්‍රයෙහි-

'A' = වර්ෂයේ මූල්‍ය පිරිවැය;

'B' = වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැය මත වූ මූල්‍ය සාධනපත්‍රවල වටිනාකම; සහ

'C' = 4 x වර්ෂය අවසානයේ දී සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව,

වේ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි:

එසේ වුව ද, වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැයක් නොමැති අවස්ථාවක ඉහත කී කාර්යය සඳහා භාවිත නොකළ සීමාව ගණනය කිරීමේ දී, ඊට පෙරාතුව ම වූ වර්ෂයේ මුදල් ප්‍රමාණයන් යනා දී ලෙස භාවිත කරමින්, (2) වන උපවගන්තියේ සඳහන් සීමාව ගණනය කරනු ලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (3) වන උපවගන්තියේ, "නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩුකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකුට ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාඩුවක් සිදු වී ඇති අවස්ථාවක, එය ලාභයක් වී නම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයක් අනුව බදු අය කළ හැකි නම් සහ ඒ අනුප්‍රමාණය පසුව වැඩි කරනු ලැබී නම්, ඒ පාඩුව අඩු අනුප්‍රමාණයක් මත බදු අයකළ හැකි පාඩුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "පමණක් අඩුකරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "පමණක් අඩුකරනු ලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්-

"(ඇ) ආයෝජනයකින් සිදුවන හිලව් නොකළ පාඩු, ඒ පාඩු සිදු වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ පළමුවන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂ හය ඇතුළත පමණක් අඩු කරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ලැබීමකින් වෙනත් ආයෝජන වත්කමක් බැහැර කිරීමේ දී සිදුවන යම් පාඩුවක් අඩු කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "ලැබීමකින් යම් පාඩුවක් අඩුකරනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එම වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) පැවරීම සිදුකරන අවස්ථාවේ දී-

(i) 2021 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව-

(iඅ) තැනැත්තා සහ ආශ්‍රිතයා වාසිකයන් වීම; සහ

(iආ) ආශ්‍රිතයා හෝ ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී එහි කිසිදු හවුල්කරුවකු හෝ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම; සහ

(ii) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව-

(iiඅ) තැනැත්තා සහ ආශ්‍රිතයන් වාසිකයන් වීම;

(iiආ) ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එහි කිසිදු හවුල්කරුවකු හෝ ආශ්‍රිතයා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම; සහ

(iiඇ) (4) වන උපවගන්තියේ සඳහන් වත්කමක් උපලබ්ධි කිරීමෙන් තැනැත්තකුට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණය එම වත්කම උපලබ්ධි කිරීමෙන් ආශ්‍රිතයාට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණයට සමාන වීම හෝ අඩුවීම; සහ".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු හෝ ආයෝජන මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය (6 වන සහ 7 වන වගන්ති)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු ආයෝජන හෝ වෙනත් ආදායම් මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ 1988 අංක 30 දරන බැංකු පනතේ 76ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ "1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බොල් ණය සහ අඩමාන ණය සම්බන්ධයෙන් ඒ ඒ තක්සේරු වර්ෂයට අදාළ වන විශේෂ විධිවිධාන සැලසීමට නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 46අ වන වගන්තිය සහ 76ඒ වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින්, හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේ ණය පහසුකම් වර්ගීකරණය කිරීම, හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි" යන වචන වෙනුවට "එහි ලියාපදිංචි හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(3) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්; හෝ" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්;" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් යම් ආයතනයක් විසින් කරන ලද ගෙවීම් ඇතුළුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවා ඇත්නම්.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්;-

"(1අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි, යම් සේවායෝජකයකු විසින් ස්වකීය සේවානියුක්තයා වෙත කරන ලද 5 වන වගන්තිය යටතට ගැනෙන යම් ගෙවීමක් මත 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි එම සේවායෝජකයකු විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 83අ වන වගන්තියට සහ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති අනුප්‍රමාණය යටතේ, ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් ලාභාංශයක්, පොලියක්, වට්ටමක්, ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලියක්, රාජ්‍ය භාගයක් හෝ වාරික මුදලක් ගෙවීමකින් යම් තැනැත්තකු විසින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියේ "යම් තැනැත්තකු විසින්" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1ආ) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් තැනැත්තකු විසින් නිර්වාසික තැනැත්තකුට ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් ගෙවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එම ගෙවීම් මුදලින් 14%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවා ගනු ලැබිය යුතු ය.

(1ඇ) (3) වන උපවගන්තියට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, ගෙවීම් කරන තැනැත්තාගේ සේවානියුක්තයකු නොවන වාසික පුද්ගලයකුට-

(අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාග පැවැත්වීම, හෝ විභාගයක් සමීක්ෂණය හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන්;

(ආ) වාසික රක්ෂණ, අලෙවි හෝ ප්‍රචාරක නියෝජිතයකුට යම් කොමිස් මුදලක් හෝ තැරැව් ගාස්තුවක් වශයෙන්ත හෝ

(ඇ) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු, ගණකාධිකාරීවරයකු, නීතිඥවරයකු, මෘදුකාංග සංවර්ධකයකු, පර්යේෂකයකු, ශාස්ත්‍රඥයකු හෝ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ස්වාධීන සේවා සපයන පුද්ගලයකු වැනි ස්වාධීන සේවා සපයන්නකුගේ තත්ත්වයෙන් ඒ පුද්ගලයා විසින් සපයනු ලබන සේවා වෙනුවෙන්,

ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් ගෙවනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් එම ගෙවීම් මුදලින් 5%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවාගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මාසයකට රු. 100,000ක් නො ඉක්මවන සේවා ගෙවීමක් සඳහා මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "83 වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය, 83අ වන වගන්තිය හෝ 84අ වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අඅ) 2023 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන දිනයේ දී හෝ ඉන් පසුව, වාසික සමාගමක් විසින් ගෙවන ලද ලාභාංශ;".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම්වල සිට ඒ වගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) 83 වන වගන්තිය හෝ 83අ වන වගන්තිය යටතේ සේවායෝජකයා විසින් බදු රඳවා ගැනීම අවශ්‍ය නොවන සේවා නියුක්තියකින්,

තක්සේරු කළ හැකි ආදායමක් උපයනු ලබයි නම් හෝ ඉපයීමට අපේක්ෂා කරයි නම් එම තැනැත්තා විසින් ත්‍රෛමාසික වාරික මගින් බද්ද ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, තක්සේරු වර්ෂයක් තුළ දී ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් උපචිත වන හෝ උපචිත වනු ඇතැයි අපේක්ෂිත ලැබීම්, ත්‍රෛමාසික වාරිකවල කාර්යය සඳහා සලකා බලනු නොලැබිය යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "නිර්වාසික තැනැත්තකු," යන වචන වෙනුවට "නිර්වාසික තැනැත්තකු; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) සේවායෝජකයා විසින් 83අ වන වගන්තිය යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකර ඇති අවස්ථාවක දී සහ 82 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ කිසිදු බදු මුදලක් ගෙවනු නොලැබිය යුතු අවස්ථාවක දී, (2) වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමට පමණක් අදාළ වන යම් පුද්ගලයකු,"; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී" යන වචන වෙනුවට "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී හෝ 83අ වගන්තිය යටතේ එම තැනැත්තාගේ සේවායෝජකයා විසින් ඔහුගේ සේවා නියුක්ති ආදායම මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇති අවස්ථාවක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ, "මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය;

එසේ වුව ද, එම තැනැත්තා විසින් සියලුම ව්‍යාපාර හෝ ආයෝජන කටයුතු සම්බන්ධයෙන් පොදුවේ වියදම් දරා ඇති අවස්ථාවක දී හෝ පොදුවේ යම් වත්කම් භාවිත කර ඇති අවස්ථාවක දී සහ මෙම උපවගන්තියේ කාර්යය සඳහා යම් වියදමක් හෝ අඩුකිරීම් වෙන්ව හඳුනා ගනු ලැබිය නොහැකි අවස්ථාවක දී, ඒ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී (පිරිවැටුමේ අනුපාතයට අනුව හෝ වත්කම් භාවිත කිරීමේ අනුපාතයට අනුව) අනුපාතික පදනමක් මත එම වියදම් හෝ අඩු කිරීම් බෙදා දැක්වීම නීත්‍යානුකූල විය යුතු ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සාධාරණ ලිඛිත දැන්වීමක් ලබා දීම මගින්," යන වචන වෙනුවට "සාධාරණ දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලබා දීම මගින්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගේ නම්, ලිපිනයන් හෝ ජාතික හැඳුනුම්පත් අංක සපයන ලෙස මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත නියම කරනු ලැබිය හැකි අතර, එම තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් බදු නිලධරයකු වෙත මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයේ පවතින වාර්තා වෙත ප්‍රවේශය ලබා දීම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සමඟ ලියාපදිංචි වී ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපිනයන් ඇතුළුව අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සිදුවන අදාළ වෙනස් වීම් පිළිබඳ හෝ අලුත් පත්වීම් පිළිබඳ තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සෑම මාස හයකට ම වරක් සපයනු ලැබිය යුතු ය.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "දැන්වීමක්, ලිඛිතව," යන වචන වෙනුවට "දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්," යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ

(i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ සහ 2022 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ස්වයං තක්සේරු වාර්තාව ගොනු කරනු ලැබූ දින සිට මාස දොළහක කාල සීමාවක් තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ලිඛිතව" යන වචනය වෙනුවට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ දිනය වන විට ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණය, යම් දණ්ඩනයක් හා පොලී මුදලක් සහ එම සහතිකයේ දිනයේ සිට නඩු තීන්දුවේ දිනය දක්වා සහතිකයේ සඳහන් මුදල මත අයවිය යුතු නෛතික පොලිය, කොමසාරිස් ජනරාල්වරයා වෙත අයවිය යුතු සහ ගෙවිය යුතු බදු මුදල විය යුතු ය.

(6) 2023 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව මේ වගන්තිය යටතේ පවරනු ලබන නඩු කටයුතු, (3) වන උපවගන්තියේ සඳහන් සහතිකය ඉදිරිපත් කිරීමේ දිනයේ සිට මාස තිහක කාලයක් ඇතුළත සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) බද්දක් තක්සේරු කිරීම, ගෙවීම, එකතු කිරීම සහ බද්දකට අදාළ ආරවුලක් සඳහා වන කාර්ය පටිපාටි බද්දකට අදාළ දණ්ඩනවලට ද එක හා සමානව අදාළ විය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(6අ) (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමේ දී, ගෙවිය යුතු බදු මුදල සහ පොලිය ද සමඟ මෙම පරිච්ඡේදය යටතේ අයකරනු ලබන දණ්ඩන මුදල සඳහන් කරමින් තනි තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි නිසි ගිණුම්, වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගණනය කරනු ලබන දණ්ඩනයක් සඳහා යටත් විය යුතු ය.".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ "අපනයන" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "නිශ්චිත ව්‍යවසායක්" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව නිශ්චිත ව්‍යවසායක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඇ) ඡේදයේ "එම තැනැත්තාගේ හෝ එම ආශ්‍රිතයාගේ" යන වචන වෙනුවට එම තැනැත්තාගේ සහ එම ආශ්‍රිතයාගේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ "නිශ්චිත ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඌ) ඡේදයේ "විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන:

එසේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් විධානයක් හේතුවෙන් මේ ඡේදයේ සඳහන් සේවා වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කිරීමෙන් අපනයනකරු වළක්වනු ලැබූ අවස්ථාවක දී, අපනයනකරු විසින් ඔහුගේ විදේශීය ව්‍යවහාර මුදල් ලැබීම් පිළිබඳව තහවුරු කිරීමක් සැපයිය යුතු ය.".

33. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1අ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (1අ) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේද ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

(අ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවයක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 2,250,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 2,250,000 ඉක්මවන නමුත් රු. 4,500,000 නො ඉක්මවන | රු. 135,000 ක් වූ මුදලක් සහ රු. 2,250,000 ට අතිරික්ත මුදලින් 12% |
| රු. 4,500,000 ඉක්මවන | රු. 405,000 ක් වූ මුදලක් සහ රු. 4,500,000 ට අතිරික්ත මුදලින් 18%; |

(ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස තුනක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 125,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 125,000 ඉක්මවන නමුත් රු. 250,000 නො ඉක්මවන | රු. 7,500 ක් වූ මුදලක් සහ රු. 125,000 ට අතිරික්ත මුදලින් 12% |
| රු. 250,000 ඉක්මවන නමුත් රු. 375,000 නො ඉක්මවන | රු. 22,500 ක් වූ මුදලක් සහ රු. 250,000 ට අතිරික්ත මුදලින් 18% |
| රු. 375,000 ඉක්මවන නමුත් රු. 500,000 නො ඉක්මවන | රු. 45,000 ක් වූ මුදලක් සහ රු. 375,000 ට අතිරික්ත මුදලින් 24% |
| රු. 500,000 ඉක්මවන නමුත් රු. 625,000 නො ඉක්මවන | රු. 75,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 30% |
| රු. 625,000 ඉක්මවන | රු. 112,500 ක් වූ මුදලක් සහ රු. 625,000 ට අතිරික්ත මුදලින් 36%; |

(1ඇ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2023, අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

| බදු අය කළ හැකි ආදායම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු. 500,000 නො ඉක්මවන | රු. 0 ට අතිරික්ත මුදලින් 6% |
| රු. 500,000 ඉක්මවන නමුත් රු. 1,000,000 නො ඉක්මවන | රු. 30,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 12% |
| රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,500,000 නො ඉක්මවන | රු. 90,000 ක් වූ මුදලක් සහ රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 18% |
| රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 2,000,000 නො ඉක්මවන | රු. 180,000 ක් වූ මුදලක් සහ රු. 1,500,000 ට අතිරික්ත මුදලින් 24% |
| රු. 2,000,000 ඉක්මවන නමුත් රු. 2,500,000 නො ඉක්මවන | රු. 300,000 ක් වූ මුදලක් සහ රු. 2,000,000 ට අතිරික්ත මුදලින් 30% |
| රු. 2,500,000 ඉක්මවන | රු. 450,000 ක් වූ මුදලක් සහ රු. 2,500,000 ට අතිරික්ත මුදලින් 36%"; |

(ඇ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින සිට, එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, තක්සේරු වර්ෂයක් සඳහා 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ වන භාරයක බදු අය කළ හැකි ආදායම මත-

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 18% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 18% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(3) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ (ආ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්;-

"(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;";

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.":

(ආ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්":

(ඇ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(2ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන පහත දැක්වෙන ඒ ලැබීම් සහ ලාභ කොටස මත සහ 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක ලැබීම් සහ ලාභ මත පහත දැක්වෙන අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු යඃ-

(අ) ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%; සහ

(ආ) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%.";

(ඈ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ (අ) අයිතමයේ "එම ලැබීම් මත 10% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම ලැබීම් මත, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව 10% ක අනුප්‍රමාණයකින් සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ "(1) වන, (2අ) වන," යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන, (2අ) වන, (2ආ) වන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ දෙක සඳහා" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(iii) ඒ උපඡේදයේ (ආ)උප-උපඡේදයේ (ii) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ii) පළමු වර්ෂයේ පළමු මාස හයට සාපේක්ෂව 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හයේ දී (නිශ්චිත ව්‍යවසායයන් හැර) අපනයනවල සියයට පනහක වැඩිවීමක් තිබිය යුතු වීම,";

(4) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ (1) වන උපඡේදයේ "බදු අය කළ හැකි ආදායම මත 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

"බදු පැනවිය යුතු ය.";

(5) ඒ උපලේඛනයේ 7 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයට යටත් ව, යම් තක්සේරු වර්ෂයක් සඳහා රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24%ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(3) යම් රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, 68 වන වගන්තිය යටතේ ප්‍රදානයක්, පරිත්‍යාගයක් හෝ දායක මුදලක් හෝ වෙනත් යම් ආකාරයකින් යම් තක්සේරු වර්ෂයක් තුළ ලැබුණු මුදල් ප්‍රමාණ මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය-

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක් විය යුතු ය;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක් විය යුතු ය;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක් විය යුතු ය% සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක් විය යුතු ය."; සහ

(6) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ -

(අ) ඒ උපඡේදයේ (අ) අයිතමයේ "83 වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "84(1)(අ)(ස) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "84(1)(අ) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපඡේදයේ (ඇ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ඈ) 84අ(1අ) වගන්තිය අදාළ කරගනු ලබන ගෙවීම් සඳහා-

(i) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට රු. 100,000 ක් නො ඉක්මවන අවස්ථාවක දී - 0%;

(ii) ගෙවන ලද පොලිය හෝ වට්ටම සඳහා - 5%;

(iii) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට රු.100,000 ක් ඉක්මවන හෝ සමාන වන අවස්ථාවක දී, මුළු මුදලෙන් - 10%;

(iv) ලාභාංශ හැර වෙනත් සියලු ගෙවීම් සඳහා - 14%; සහ

(v) ගෙවන ලද ලාභාංශ සඳහා - 15%.";සහ

(7) ඒ උපලේඛනයේ 11 වන ඡේදයේ "වර්ෂ පහක කාල සීමාව" යන වචන වෙනුවට "වර්ෂ දෙකක කාල සීමාව" යන වචන ආදේශ කිරීමෙන්.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ;-

"(6අ) මේ ඡේදයේ උපඡේදයක් යටතේ තමා අදහස් කරන ලද මුළු ආයෝජනය සිදු කර නොමැති යම් තැනැත්තකුට, ක්ෂය විය හැකි වත්කම් මත ආයෝජනය කරනු ලබන පළමුවන දිනයෙන් ආරම්භ වන, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වසර තුනක කාල සීමාවක් දෙනු ලැබිය යුතු ය. (6) වන උපඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ ඡේදයේ උපඡේදයක් යටතේ පැන නගින ප්‍රාග්ධන දීමනා, ඔහු විසින් අදහස් කරන ලද මුළු ආයෝජනය සම්පූර්ණ කර ඇති තක්සේරු වර්ෂය තුළ දී එහෙත් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව ඉකුත්වීමට පෙරාතුව, අඩු කරනු ලැබිය යුතු ය.".

35. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ;-

(1) ඒ උපලේඛනයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උඋ) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකට යටත්ව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බවට වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් තීරණයක් හේතුවෙන් ඒ ලැබීම ලැබී ඇත්තේ නම්, ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කමක් හෝ බැරකමක් උපලබ්ධි කිරීමක් වශයෙන් හෝ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමක් වශයෙන් වූ ලැබීමක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම අයත් අස්තිත්වයකට ලැබුණු ලැබීමක්;

(2) ඒ උපලේඛනයේ (ඌඌ) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (චච) ඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ (චච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(චචච) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසුව-

(i) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධානවලට අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල නිරත වන සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් වාසික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශයක්:-

(iඅ) ආනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධිත යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාම;

(iආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක්වෙරළ ව්‍යාපාර;

(iඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීම;

(iඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(iඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශ්වීය ඒකාබද්ධ කිරීම් ඇතුළු කාර්ය සම්පාදන සේවා සිදු කිරීම;

(ii) වාසික සමාගමකට හෝ 84අ වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන වෙනත් වාසික සමාගමකට ලැබුණු වෙනත් ලාභාංශයකට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට හෝ ඒ ලාභාංශයෙන් ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, වාසික සමාගමක් විසින් සාමාජිකයකු වෙත ගෙවනු ලබන ලාභාංශයක්;";

(5) ඒ උපලේඛනයේ (VV) ඡේදයේ "උපලබ්ධි කිරීමෙන් ලැබීම් ලෙස" යන වචන වෙනුවට, "උපලබ්ධි කිරීමෙන් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව ලැබීම් ලෙස" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(6) ඒ උපලේඛනයේ (ද) ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (v) වන උපඡේදයේ -

(i) ඒ උපඡේදයේ "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක," යන වචන වෙනුවට "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක, 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "වසර පහක" යන වචන වෙනුවට වසර දෙකක" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ අතුරු විධානයේ "ඉදිරි වර්ෂ හතර සඳහා ද" යන වචන වෙනුවට "ඉදිරි වර්ෂය සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ (vi) වන උපඡේදයේ "බලාත්මක වන පරිදි," යන වචන වෙනුවට "බලාත්මක වන පරිදි, 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(7) ඒ උපලේඛනයේ (ප) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදයේ "වෙනත් යම් මූල්‍ය ආයතනයක් අත්කර ගැනීමේ පිරිවැය ලෙස හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන වියදම," යන වචන වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වෙනත් යම් බැංකුවක්, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍ය සමාගමක් හෝ අත්කර ගැනීමේ, කොටස් වශයෙන් අත්කර ගැනීමේ, ව්‍යාපාර අන්තර්ග්‍රහණය කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන ලද වියදම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (අ) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්;-

"(අ) (i) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 500,000 ක්;

(ii) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 3,000,000 ක්ත

(iii) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා රු. 2,250,000 ක් සහ දෙවන මාස තුන සඳහා රු. 300,000 ක්; සහ

(iv) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 1,200,000ක්,

එහෙත්, භාරකරුවකු, භාරගැනුම්කරුවකු, පොල්මඃකරුවකු හෝ ඇවරකරුවකු වන යම් පුද්ගලයකු ඒ භාරකරු, භාරගැනුම්කරු, පොල්මඃකරු හෝ ඇවරකරු වශයෙන් ඒ පෞද්ගලික සහනය අඩු කිරීම සඳහා හිමිකම් නොලැබිය යුතු අතර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින් ඒ සහනය අඩු නොකළ යුතු ය;"; සහ

(ආ) ඒ ඡේදයේ (ඊ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා රු. 900,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමයේ "ව්‍යාපාර ක්‍රියාවලිය හෝ ඵලදායීතාවය වර්ධනය කිරීමට භාවිතා කරනු ලබන, ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන වෙනුවට "ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන සහ 11 වන ඡේද පිළිවෙළින් ඒ උපලේඛනයේ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන්;

(3) ඒ උපලේඛනයේ නැවත අංක යොදන ලද 8 වන ඡේදයේ "පොලී අනුපාතිකය ශූන්‍යය විය යුතුය." යන වචන වෙනුවට "පොලී අනුපාතිකය, ඒ ගෙවීම 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලැබ ඇත්නම්, ශූන්‍යය විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ "වර්ෂ තුන" යන වචන වෙනුවට "වර්ෂ දෙක" යන වචන ආදේශ කිරීමෙන්.

38. (1) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, තනි පුද්ගලයන් විසින් ඒ තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සහ දෙවන මාස තුන ලෙස ද, තනි පුද්ගලයන් නොවන යම් තැනැත්තන් විසින් පළමු මාස හය සහ දෙවන මාස හය ලෙස ද, කාල සීමා දෙකකට වෙන් වෙන්ව ගණනය කළ යුතු ය. ඒ ව්‍යාපාර ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් කාල සීමා දෙක සඳහා වූ බදු අයකළ හැකි ආදායම ලබා ගැනීමට (තනි පුද්ගලයන් විසින් පළමු මාස නවය සඳහා 75% ක් ලෙස සහ දෙවන මාස තුන සඳහා 25% ලෙස ද, තනි පුද්ගලයන් නොවන වෙනත් යම් තැනැත්තන් විසින් පළමු මාස හය සඳහා 50% ක් ලෙස හා දෙවන මාස හය සඳහා ඉතිරි 50% ක් ලෙස) සමානුපාතික පදනම භාවිත කළ හැකි ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් වාරික මගින් බද්ද ගෙවීමේ කාර්යය සඳහා සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

39. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

'අ' වගුව

(1 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය |
| 2 | 5 |
| *4* | *12* |
| *5* | *14* |
| *6* | *16* |
| *11* | *66* |
| *18* | *87* |
| *21* | *92අ* |
| *22* | *94* |
| *23* | *120* |
| *25* | *133* |
| *26* | *134* |
| *27* | *135* |
| *28* | *136* |

| | |
|---|---|
| *35(1) සහ (3)* | *195* |
| 36 (1), (2), (3), (4) සහ (5) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1අ) සහ (1ආ) උපඡේද, 3 වන, 4 වන, 5 වන සහ 7 වන ඡේද |
| 37 | දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6අ) උපඡේදය |
| 38(1) | තුන්වන උපලේඛනයේ (උඋ) ඡේදය |
| 40(1) සහ (2) | හය වන උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමය සහ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද |
| 41 | අලුත් වගන්තිය |

'ආ' වගුව

(1 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය |
| 36(1) | පළමුවන උපලේඛනයේ (1) වන ඡේදයේ |
| 38(2),(3),(4) සහ (5) | තුන්වන උපලේඛනයේ (ඌඌ), (චච), (චචච) සහ (ඩඩ) ඡේද |
| 39(2) | පස්වන උපලේඛනයේ (2) වන ඡේදය |
| 40(3) සහ (4) | හයවන උපලේඛනයේ (8) වන සහ (10) වන ඡේද |

'ඇ' වගුව

(1 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| මේ පනතේ වගන්තිය | ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය | ක්‍රියාත්මක වන දිනය |
| 3 | 10 | 01.04.2021 |
| *7* | *18* | 01.04.2021 |
| *8* | *19* | 01.04.2018 |
| *9* | *46* | 01.04.2021 |
| *10* | 54 | 01.04.2018 |
| *12* | *69* | 01.04.2018 |
| *13* | *72* | 01.04.2018 |
| *14* | *73* | 01.04.2018 |
| *15* | *83අ* | 01.01.2023 |
| *16* | *84අ* | 01.01.2023 |
| *17* | *85* | 01.01.2023 |
| *19* | *88* | 01.01.2023 |
| *20* | *90* | 01.04.2021 |
| *29* | *139* | 01.04.2023 |
| *35(2)* | *195* | 01.04.2020 |
| 36(1) සහ (7) | පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1ඇ) උපඡේදය සහ 11 වන ඡේදය | 01.04.2023 |
| 38(6) සහ (7) | තුන්වන උපලේඛනයේ (ද) සහ (ප) ඡේද | 31.03.2023 |
| *39(1)* | පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදය | 01.04.2021 |